මුනිවර ලකුණ



තායි ජාතික පූජ්‍යාචාර්යය ඩන් අතුලෝ ස්වාමීන් වහන්සේගේ චරිතය සහ ඉගැන්වීම්

මුනිවර ලකුණ

තායි ජාතික පූජ්‍යාචාර්‍යය ඩන් අතුලෝ ස්වාමීන් වහන්සේගේ චරිතය සහ ඉගැන්වීම්

"Gifts he left behind - The Dhamma legacy of Phra Ajaan Dune Athulo" - ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය

තායි බසින් සංස්කරණය
පූජ්‍ය බෝධිනන්දමුනි හිමි

ඉංග්‍රීසි බසට පරිවර්තනය
පූජ්‍ය තාණිස්සරෝ හිමි

සිංහල බසට පරිවර්තනය
වනරතන ඛේමක හිමි

දෙවන සංස්කරණය - 2023 පෙබරවාරි

නොමිලේ බෙදාහැරීම සඳහා පමණි.

(මෙහි එන කරුණු විකෘති කිරීමකට, වෙනස් කිරීමකට ලක් නොකරන්නේ නම් පමණක් මෙම පොත පිටපත් කිරීමට, මුද්‍රණය කිරීමට, බෙදාහැරීමට අවසර ඇත. සියළු වෙළඳ හිමිකම් ඇවිරිණි.)

හැඳින්වීම

මිනිසුන් බොහෝ දෙනෙක් ඇතුලෝ හිමියන්ගේ ධර්ම දේශනා ඇසීමට හෝ කියවීමට ඉල්ලා සිටිති. නමුත් මා අවංකවම කිව යුත්තේ අතුලෝ හිමියන්ගේ ධර්ම දේශනා ඉතා දුර්ලභ බවය. මීට හේතුව උන්වහන්සේ කවරදාකවත් තරමකවත් දිග බණක් හෝ ධර්ම දේශනාවක් හෝ දේශනා කර නැති බැවිනි. උන්වහන්සේ කළේ භාවනාව ඉගැන්වීමත්, ශිෂ්‍යයන්ට අවවාද කිරීමත්, ප්‍රශ්ණ වලට පිළිතුරු සැපැයීමත්, වැඩිහිටි තෙරුන් වහන්සේලා සමඟ ධර්ම සාකච්ඡා පැවැත්වීමත්‍ය. උන්වහන්සේ කතා කළේ ඉලක්කයට යොමු වූ, පරෙස්සමින් තෝරා ගත් කෙටි වැකිය. උන්වහන්සේ පිංකම් උත්සවයකදී කවදාවත් බණ කියා නැත.

බොහෝ දෙනෙකු අතුලෝ හිමියන්ගේ ධර්මය පිළිබඳව දක්වපු උනන්දුවට ප්‍රතිචාරයක් ලෙස, උන්වහන්සේගේ කෙටි ඉගැන්වීම් ඇතුලත් මෙම ග්‍රන්ථය සකස් කළෙමි. මෙහි ඇත්තේ පරමාර්ථ තත්වයේ පිවිතුරු සත්‍යයත්, ශිෂ්‍යයන්ට ලබාදුන් පාඩම් හා අවවාදත්, ප්‍රශ්ණවලට පිළිතුරුත්, පෙළින් උධෘත කොට දැක්වීමට උන්වහන්සේ ඉතා ප්‍රිය කළ බුදු වදනුත්‍ය. මම උන්වහන්සේ අපවත් වන තුරු ම, උන්වහන්සේ සමඟ ඉතා දිගු කලක් ජීවත් වූ බැවින් මේ කරුණු මතකයෙන් හෝ දින පොතේ සටහන් අතරින් එක්තැන් කළෙමි. මා විසින් අදාල සිද්ධිය ද, ස්ථාන හා සම්බන්ධ පුද්ගලයන් ද සඳහන් කළේ කියැවෙන දේ පහසුවෙන් තේරුම් ගැනීම සඳහාත් කියවීමට ආශාවක් ඇති කරවනු සඳහාත්‍ය.

විශේෂයෙන් සඳහන් කළ යුතු සේම විමතිය දනවන කරුණ නම් අතුලෝ හිමි සාමාන්‍යයෙන් කතා නොකළ ද, කතා කරන විට ඉතා ස්වල්ප ලෙස කතා කළ ද, අදහස් ප්‍රකාශ කිරීමේ දී අවස්ථාව හා පුද්ගලයා නිවැරදිව තක්සේරු කොට වහා 'තක්කෙටම' කීමට උන්වහන්සේට තිබූ හැකියාවයි. වදන් කෙටිය, අරුත්බරය, සෑම වාක්‍යයක්ම අර්ථයෙන් පරිපූර්ණය. අසන්නාව වශී කොට බොහෝ වේලාවක් ඔහුගේ ගැඹුරුම ප්‍රඥාවෙන් ඒ කිව් දේ ගැන සිතවන්නේය. මෙහි එන පරිච්ඡේද වලින් ඇතැමෙක් සාමාන්‍ය ඉගැන්වීම්ය, තවත් ඒවා සිනා උපදවන සුළුය, තවෙකක් පරමාර්ථ සත්‍යය කතා කරයි. මෙය කියවන පාඨකයාට මේවා අනුපිළිවෙලකට, පහල තැනින්

ඉහල තැනකට හෝ පහසු දේ සිට ගැඹුරු දෙයට, පෙල ගැස්වූයේ නැත්තේ මන්දැයි සිතෙනු ඇත. ඊට හේතුව නම් මේ සෑම පරිච්ඡේදයක්ම එක පිටුවක් තුල අංගසම්පූර්ණව පිහිටීමත්, පරිසරය වෙනස් කිරීමට මට තිබූ උවමනාවත්ය. මෙය නොගැලපෙන නොසුදුසු වැරදි දෙයක් ලෙස පෙනේ නම්, ඒ සියලු උගත් පාඨකයන්ගෙන් මෙම මඳ නුවණක් ඇති කතුවරයාට සමාව දෙන ලෙස ඉල්ලා සිටිමි.

පූජ්‍ය බෝධිනන්දමුනි හිමි.
1985 - ජූලි - 01

සිංහල පරිවර්තනයට සටහනක්

පූජ්‍ය අජාන් ඩන් අතුලෝ ස්වාමීන් වහන්සේ යනු මෑත ශාසන ඉතිහාසයේ වැඩ සිටි සුවිශේෂී භික්‍ෂූන් වහන්සේ නමකි. මෙම පොතේ සඳහන් වන උන්වහන්සේගේ චරිත විස්තරය හා ඉගැන්වීම් කියවන පාඨකයෙකුට උන්වහන්සේ රහතන් වහන්සේ කෙනෙකු කියා සිතෙන්නේ නම් එය පුදුමයක් නොවේ. පසුගිය සියවසේ මුල වැඩිසිටි පූජ්‍ය අජාන් මන් භූරිදත්ත හිමිපාණන් වහන්සේ විසින් ආරම්භ කළ දෘඩ විනයගරුක වනවාසී සාම්ප්‍රදාය උන්වහන්සේගේ ශිෂ්‍ය පිරිසෙන්ම අවසන් වීම තායි බුදු සමයේ පමණක් නොව සමස්ථ බුදු සසුනේම කරුමයකි. ඊට හේතු වූ ප්‍රධාන සාධක දෙකකි. එකක් නම් 50 හා 60 දශක වල ඉන්දු චීන ප්‍රදේශයේ පැතිරී ගිය ආයුධ සන්නද්ධ කොමියුනිස්ට් ගරිල්ලා ව්‍යාපාරය මැඩ පැවැත්වීමට වනය එළි කිරීමට තායි රජය ගත් තීරණයයි. දෙවැන්න වනය ඇසුරු කරමින් සංචාරක ජීවිතයක් ගත කළ මෙම භාවනායෝගී ශ්‍රේෂ්ඨ භික්‍ෂූන් වහන්සේලා "හික්ම වීමට" උන්වහන්සේලා අයත් වූ ධම්මයුත් නිකායේ නායක කාරකාදීන් ගත් තීරණයයි. මෙම තීරණයට අනුව උන්වහන්සේලාට ආරාම හා පන්සල් බාරකෙරුණු අතර ඔවුනට එම ආරාම හා ආරණ්‍යය වල පැලපදියම් වීමට සිදුවිය. බවුන් වඩමින් වනයෙන් වනයට සැරිසැරූ ඒ නිදහස් ජීවිතය එයින් අවසන් විය. තායිලන්තයේ සිදු වූ ආර්ථික දියුණුවත් සමඟ සිල්වත් ගුණවත් භික්‍ෂූන්ට ලාභ සත්කාර ගලා ඒමට පටන් ගත් අතර ඒ මුල් කාලීන තෙරුන් වහන්සේලාට ඉන් එතරම් බලපෑමක් ඇති නොවූ නමුත් උන්වහන්සේලාගේ සිසු පරපුරට එය සැබෑම මර උගුලක් විය. අද ලංකාවේ මෙන්ම බුරුමයේ ද මෙම තත්වය උද්ගත වී ඇත.

ලංකාවේ අප විශේෂයෙන් සිතා බැලිය යුතු කරුණක් ඇත. තායිලන්තයේ අජාන් මන්, අතුලෝ, අනාලයෝ, අජාන් චා ආදී ශ්‍රේෂ්ඨ භික්‍ෂූන් වහන්සේලා බිහි වූ නමුත් ලංකාවේ අධ්‍යාත්මික අංශයේ ඇත්තේ නිසරු කාන්තාරමය මුඩු බිමකි. මීට හේතු වී ඇති ප්‍රධාන කරුණු දෙක ලෙස පෙනෙන්නේ නවක භික්‍ෂූන්ට ආදර්ශයට ගත හැකි ශ්‍රේෂ්ඨ භික්‍ෂූන් වහන්සේලාගේ හිඟ පාඩුවත්, ලංකාවේ ඇති ආරණ්‍යය ක්‍රමයත්ය. ආරණ්‍යය වල පන්සල් වල කෙරෙන දෙයට වැඩි දෙයක් නොකෙරෙන අතර බොහෝ තෙරුන් වහන්සේලා උනන්දුවන්නේ දායකයන්ගේ වැඩ කටයුතු වල

යෙදීමටත්, ගොඩනැඟිලි තැනීමටත්, දිග දාන පෝලිමක් දායකයන්ට පෙන්වීම සඳහාත්ය. ඒ පෝලිම අතරේ සුදු හාමුදුරුවරුන් සිටින්නේ නම් වැඩේ මනහරය. භාවනාව පුහුණු කෙරෙන ආරණ්‍යය කිහිපයක් ඇති නමුත් ඒවා එක් එක් 'භාවනා ක්‍රම' වල සිර වී සිටින අතර නිදහස් චින්තනයට හා සත්‍යය සොයා යාමට උනන්දු කරවන්නේ නැත.

මෙම පොත පරිවර්තන දෙකක ප්‍රතිඵලයක් බැවින් මුල් පොතේ රසය බොහෝ තනුක වීම මෙන්ම අර්ථ වෙනස් වීම් සිදුවීමද වැළැකිය හැකි නොවේ. වරහන් තුල ඇති වැකි මෙන් ම පාදක සටහන්ද පාඨකයාට කරුණු තේරුම් ගැනීම පහසු වීමට පරිවර්තක විසින් එක් කරන ලදී. ඇතැම් මාතෘකා එම පරිච්ඡේදවල අන්තර්ගතය හා සම්බන්ධයක් නැති බවක් පෙනුනු බැවින් (මෙය ඉංග්‍රීසි පරිවර්තනයේ දී සිදු වූ අඩුපාඩුවක් විය හැක) වඩා නිදහස්ව අන්තර්ගතයට ගැලපෙන ලෙස ඇතැම් ඒවා වෙනස් කෙරිණි. මෙම පොත කියවන භික්ෂුවකට හෝ දෙනමකට සත්‍යය සොයා යාමටත්, සත්‍යය අවබෝධ කර ගැනීමටත් මින් තල්ලුවක් ලැබේ නම් පරිවර්තකගේ මහන්සිය අපතේ ගොස් නැත.

මීට,
පරිවර්තක
2020 - 10 - 27



පූජ්‍යාචාර්‍යය ඩන් අතුලෝ ස්වාමීන් වහන්සේ
1888-1983

1 . සංක්ෂිප්ත චරිතාපදානය

අතිපූජ්‍ය ආචාර්ය ඩන් අතුලෝ (Dune Atulo) හිමියන් උපන්නේ සූරින් පලාතේ මුආං (Muang) දිස්ත්‍රික්කයේ ප්‍රාසාත් ගමෙහි 1888 ඔක්තෝබර් 4 වැනි දිනය. උන්වහන්සේ වයස අවුරුදු 22 දී පලාත් අගනුවරදී පැවිදි බිමට ඇතුලත් වූහ. අවුරුදු හයකට පසු නූගත් නගර භික්ෂුවක් ලෙස ගෙවන තම පැවිදි ජීවිතය ගැන කළකිරීමට පත්ව ඉගෙනීම සඳහා උ්‍රබෝන් රත්චතානි වලට වැඩියහ. එහිදී උන්වහන්සේ ආචාර්ය්‍ය සිං බන්තියාගමෝ හිමි සමඟ මිතුරුව ධම්මයුත් නිකායේ නැවත පැවිදි වූහ. ඉන් ටික කලකට පසු ඔහුට හා ආචාර්ය්‍ය සිං හිමියන්ට ඊසාන දිග ප්‍රදේශයේ වර්ෂ බොහෝ ගණනක් චාරිකාවේ යෙදී සිට ආපසු වැඩිය ආචාර්ය්‍ය මන් බූරිදත්ත හිමියන් හමු විය. අජාන් මන් හිමියන්ගේ ඉගැන්වීම් හා උන්වහන්සේගේ චර්යාව ගැන පැහැදුනු මේ භික්ෂූන් දෙනම ඉගෙනීම් කටයුතු අතහැර උන්වහන්සේගේ මඟ පෙන්වීම යටතේ චාරිකාවේ හැසිරෙන භාවනායෝගී ජීවිතයකට පිළිපන්හ. එබැවින් මේ දෙපල උන්වහන්සේගේ පළමු ශිෂ්‍යයන් දෙදෙනා වූහ. වසර 19ක් පුරා තායිලන්තයේ හා කාම්බෝජයේ වනාන්තර හා කඳු අතර සැරිසැරූ අජාන් අතුලෝ හිමියන්ට උන්වහන්සේගේ නිකායේ නායක හිමිවරුන්ගෙන් සූරින් වල පිහිටි ඉගැන්වීම හා පුහුණු වීම කෙරෙන සෙනසුනක් බාරගන්නා ලෙස නියෝගයක් ලැබුණි. ඒ අනුව උන්වහන්සේ 1934 දී නගර මධ්‍යයේ පිහිටි බුරළා සෙනසුනේ විහාරාධිපතිකම බාර ගත්හ. 1983 දී අපවත් වනතුරුම උන්වහන්සේ වැඩසිටියේ එහිය.

අජාන් මන් හිමියන් ආරම්භ කල වනවාසී සාම්ප්‍රදායේ ඉතාම වැඩිහිටි සාමාජිකයෙක් වූ අජාන් ඩන් හිමියන් බොහෝ දෙනෙක් හැඳින්වූයේ 'ලුආං පූ' (Luang Pu) යන ඉතා ගෞරවනීය හා ලෙන්ගතු යෙදුමිනි. එහි අර්ථය 'පූජනීය සීයා' යන්නයි.

2. ධාර්මික පිළිගැනීමක්

1979 දෙසැම්බර් 18 දින තායි රජු හා රැජින අජාන් අතුලෝ හිමියන් හමුවීමට පුද්ගලික ගමනක් ආහ. උන්වහන්සේගේ සැප දුක් අසා ධර්ම සාකච්ඡාවක යෙදුනු රජතුමා ප්‍රශ්ණයක් ඇසුවේයඃ "කෙලෙස් අතහරින විට පළමුව අතහැරිය යුතතේ කුමන කෙලෙස්ද?"

අතුලෝ හිමියන් මෙසේ පිළිතුරු දුන්හඃ

"කෙලෙස් සියල්ල සිතෙහි හටගන්නේ එකටයි. එම නිසා සිත දෙසම බලන්න. කවර හෝ ක්ලේෂයක් සිතෙහි පළමු කොට හටගනීද, පළමු කොට අතහැරිය යුත්තේ ඒ ක්ලේෂයයි."

3. විරුද්ධ නොවීම

අතුලෝ හිමියන් හමුවීමට රාජකීය යුවල පැමිණි හැම විටකම, ආ කාරණය නිමවා සමුගන්නා අවස්ථාවේ දී රජතුමා "සාමාන්‍ය ජනයාට ගෞරව දක්වීමට අවස්ථාවක් ලබා දීම සඳහා ඔබේ පඤ්චස්කන්ධය අවුරුදු සියයකටත් වඩා පවත්වාගෙන යන ලෙස අපි ඉල්ලා සිටිමු" යැයි කීමට පුරුදුව සිටියේය. මෙය හුදෙක් ආචාරශීලී සමුගැනීමේ වදනක් හා අතුලෝ හිමියන්ට රජු කරන ආශිර්වාදයක් පමණක් වුවත් අතුලෝ හිමියන් එය බාරගත්තේ නැත. ඒ උන්වහන්සේට සංස්කාරවල ස්වභාවයට විරුද්ධව යා නොහැකි බැවිනි.

උන්වහන්සේ මෙසේ පිළිතුරු දේ :

"මට කණගාටුයි, මට එය බාරගන්න බෑ. ඒ සියල්ල රැඳෙන්නේ සංස්කාරයන් ඒවායේ ස්වභාවයේ හැටියට පවතින විදිය අනුවයි."

4. චතුරාර්ය සත්‍යය ගැන

1956 වස්සාන කාලයේ පළමු දින භාවනායෝගී එක් වැඩිහිටි භික්ෂුවක් අතුලෝ හිමියන්ට ගෞරව දක්වීමට වැඩියහ. අතුලෝ හිමියන් උන්වහන්සේට විවිධ උපදෙස් හා ගැඹුරු ධර්ම කරුණු ගැන කියා දී චතුරාර්ය සත්‍යය මෙලෙස සම්පිණ්ඩනය කළහ.

"සිත පිටතට යැවීම 'දුකෙහි හටගැනීම'යි. සිත පිටතට යැවීමේ ප්‍රතිඵලය 'දුක'යි. සිතින් සිත දෙස බැලීම 'දුක නැති කිරීමේ මාර්ගය'යි. සිතින් සිත දෙස බැලීමේ ප්‍රතිඵලය 'දුක නැති කිරීම'යි."

5. වචන වලින් එහාට ගිය දෙයක්

උගත් ගිහියෙක් අතුලෝ හිමියන් සමඟ කතා කරමින් මෙසේ ඇසුවේය. "මම තදින්ම විශ්වාස කරනවා දැන් වර්තමාන කාලයේ මාර්ගඵල නිවන් ලබපු භික්ෂූන් වහන්සේලා ඉන්නේ ටික දෙනෙක් නෙවෙයි කියලා. ඉතින් ඇයි උන්වහන්සේලා තමුන්ගේ තත්වය ප්‍රසිද්ධියේ කියන්නේ නැත්තේ? එහෙම කරානම් ප්‍රතිපදාවේ උනන්දු වන අය ඒ අය ලබා ගත් තත්වයන් දැනගෙන වඩාත් උනන්දුවෙන් හා ධෛර්යයෙන් ඒ තත්වයන් ලබාගන්න වීර්යය වඩනවා නේද?"

අතුලෝ හිමියන් මෙසේ පිළිතුරු දුන්හ:

"නිවන් ලබපු අය ඒ අය ලබාගත් නිවන ගැන කතා කරන්නේ නෑ, මොකද එය වචන වලට ඉහලින්, වචන වලින් එහාට ගිය දෙයක්."

6. ප්‍රමාදී භික්ෂූන්ට අවවාදයක්

"ප්‍රතිපදාවේ ප්‍රමාදීව කටයුතු කරන භික්ෂුව කරන්නේ පොතේ තියෙන හැටියට ශික්ෂා පද ටික ගණින එක විතරයි. තමන් ශික්ෂා පද 227 ක් රකිනවා කියලා ආඩම්බර වෙන එක විතරයි.

නමුත් ඇත්තටම ඔහුට රකින්න උවමනාව තියෙන්නේ ශික්ෂා පද කීයද?"

7. ඇත්ත, නමුත් ඇත්තම නොවෙයි.

භාවනා පුහුණුවේ යෙදෙන කෙනෙකුට යම් ප්‍රතිඵල ලැබීම සාමාන්‍ය දෙයකි. ඉන්පසු ඔවුන් අත්දුට දේ ගැන සැක ඇති විය හැක. උදාහරණයක් ලෙස ඔවුන්ට නොයෙක් දේ දර්ශනය වනු ඇත. තමුන්ගේ සිරුර ඇතුලේ තිබෙන කොටස් පෙනෙනු ඇත. බොහෝ මිනිසුන් අතුලෝ හිමියන් හමුවීමට පැමිණ තමන්ගේ සැක දුරු කරන ලෙසත්, ඉදිරියට කෙලෙස පුහුණු විය යුතුද කියාත් විමසති. බොහෝ දෙනෙක් පැමිණ තමන් දිව්‍ය ලෝකය හෝ අපාය හෝ තම ශරීරය තුල බුද්ධ රූපයක් හෝ දුටු බව ප්‍රකාශ කරති. "මා දුටුවේ සත්‍යය දෙයක් දැ"යි විමසති.

අතුලෝ හිමි මෙලෙස පිළිතුරු දෙති.

"ඔබ දුටු දර්ශනය ඇත්ත, නමුත් ඒ දර්ශනය තුල ඔබ දුටු දේ ඇත්ත නොවෙයි."

8. දර්ශන අතහැරීම

එවිට ප්‍රශ්ණකරු මෙසේ විමසයි. "මා දකින මේ දර්ශන බාහිර දෙයක් ලෙසත් එයින් මට ප්‍රයෝජනයක් නැති බවත් ඔබ පවසනවා. මා එම දර්ශන වල සිරවී සිටියොත් භාවනාව දියුණු නොවන බවත් පවසනවා. මා එම දර්ශන වල බොහෝ වේලා ගැලී ඉන්න නිසාද මට ඒවා මඟ හරින්න බැරි? මම භාවනා කරන්න ඉඳගන්න හැම සැරේම, සිත එකඟ වෙච්ච ගමන් සිත ඒ මට්ටමට යනවා. මේ දර්ශන නැති කර ගන්න හොඳ විදියක් මට කියා දෙන්න බැරිද?"

අතුලෝ හිමියන් මෙසේ පිළිතුරු දෙති :

"සමහර මේ දර්ශන ගොඩක් විනෝදජනක ඒවා වෙන්න පුළුවන්, කෙනෙක් බැඳ තබාගන්න තරම්. නමුත් ඔබ ඒවාගේ සිරවී සිටියොත් ඔබේ කාලය නාස්ති වෙන එක විතරයි වෙන්නේ. ඒ දර්ශන නැතිකර ගන්න පුළුවන් පහසුම විදිය තමයි ඒ දර්ශන වල පෙනෙන දේ දිහා බලන් නැතිව ඉන්න එක. ඒ වෙනුවට ඒ දර්ශන දකින කෙනා දිහා බලන්න. එවිට ඔබ දකින්න අකැමති දේ නිකම් ම නැති වෙලා යාවි."

9. බාහිර දේවල් පමණයි

අතුලෝ හිමි 1981 දෙසැ. 10 දින බැංකොක් නගරයේ සුකුම්විට් මාවතේ ධම්මමොන්කොන් ආශ්‍රමයේ වාර්ෂික උත්සවයට සහභාගී වූහ. අසල පිහිටි ගුරු විද්‍යාලයෙන් තාවකාලිකව මහණ වූ විශාල කාන්තාවන් සංඛ්‍යාවක් තමන් කළ විපස්සනා භාවනාවේ ප්‍රතිඵල ගැන උන්වහන්සේ සමඟ සාකච්ඡා කිරීමට පැමිණියහ. ඇතැමෙක් පැවැසුවේ තමන්ගේ හිත තැන්පත් වූ විට තම හදවතේ බුද්ධ රූපයක් දකින බවයි. තවත් ඇතැමෙක් දිව්‍ය ලෝකයේ තමන්ට ලැබෙන්න නියමිත් දිව්‍ය මාළිගා දකින බවත්, තවත් කෙනෙක් දෙව්ලොව ඇති චූළාමණී ස්තූපය[1] දුටු බවත් පැවැසූහ. ඔවුන් සැම කෙනෙක්ම තමන් ලැබූ ප්‍රතිඵල ගැන ආඩම්බර වන බවක් පෙනුනි.

අතුලෝ හිමි මෙසේ පැවැසූහ:

"ඔබට දකින්නට ලැබුණු ඒ සැම සියළු දෙයක්ම බාහිර දේවල් පමණයි. ඔබලාට ඒවා කිසිසේත්ම පිළිසරණක් කර ගන්න බෑ."

---

1. බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා වැඩ සිටින දෙව් ලොව ඇති ස්ථූපයකි.

10. සිතුවිලි නතර කිරීම

1964 මාර්තු මස උගත් භාවනායෝගී භික්ෂු පිරිසක් පළමු 'ධර්ම ප්‍රචාරක' කණ්ඩායම ලෙස අතුලෝ හිමියන්ට ගෞරව දැක්වීමටත්, ධර්ම ප්‍රචාරක වැඩ වලදී ප්‍රයෝජනවත් විය හැකි අවවාද අනුශාසනා ලබා ගැනීමටත් පැමිණියහ. අතුලෝ හිමියෝ ඔවුනට පරමාර්ථ ධර්මය කියා දුන්හ. ඒ අනෙක් අයට කියා දීම සඳහාත්, තමන්ට ම ඒ තත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා පුහුණු වීම සඳහාත්ය. අවසානයේ ඔවුනට ගෙනයාමටත්, සිතීමටත් නැණවත් පඬුරක් දුන්හ.

"ඔබ කොපමණ සිතුවත්, ඔබට දැන ගන්නට බැහැ. ඔබ සිතන එක නතර කළොත් විතරයි දැනගන්න පුළුවන්. නමුත් දැනගැනීමට සිතීම උදව් කරගන්න වෙනවා."

11. දියුණුවද? පිරිහීමද?

ඒ හමුව අතරතුර එක් අවස්ථාවක අතුලෝ හිමි ධර්ම ප්‍රචාරකයන්ට මෙලෙස අවවාද කලහ.

"ඔබ බුදුදහම පතුරවන්න හා දේශනා කරන්න පිටතට ගියාම එය බුදුදහමේ දියුණුවට හෝ පරිහානියට හේතු වෙන්න පුළුවන්. ඇයි මම එහෙම කියන්නේ? ධර්ම ප්‍රචාරයට යන සෑම කෙනෙක්ම තීරණාත්මක සාධකයක් වන නිසයි. ඔබ ගොස් සුදුසු පරිදි හැසිරෙනවනම්, තමන් භාවනා යෝගියෙක් බව සිහියේ තබාගෙන ඊට ගැලපෙන ලෙස හැසිරෙනවනම්, ඔබව දකින කෙනාට දැනට ශ්‍රද්ධාව නැතිනම්, ඔහුට ශ්‍රද්ධාව අළුතින් ඇති වේවි. දැනට ශ්‍රද්ධාව ඇති කෙනෙක් නම්, ඔහුගේ ශ්‍රද්ධාව වැඩි වේවි. නමුත් ඔබ ඊට විරුද්ධ ආකාරයට හැසිරෙනවනම්, දැනට ශ්‍රද්ධාව තිබෙන අයගෙත් ශ්‍රද්ධාව නැති වී යාවි. ශ්‍රද්ධාව නැති අය තවත් ඉවතට තල්ලු කර දමාවි. එම නිසා මා ඔබෙන් ඉල්ලා සිටිනවා ඔබ දැනුමෙනුත් හැසිරීමෙනුත් පරිපූර්ණ වන්න කියා. නොසැළකිලිමත් හෝ ප්‍රමාදී වන්න එපා. ඔබ මිනිසුන්ට යමක් කරන්න උගන්වනවා නම් ඔවුන්ට ආදර්ශයක් වෙන්න ඔබත් ඒ දේ කරන්න."

12. පිනට ආසාවක් ඇත්තේ නැත

1953 වස්කාලයට ප්‍රථම අතුලෝ හිමියන්ගේ නෑයෙකු වූ වයස්ගතව පැවිදි වී සිටි පූජ්‍ය චෝ ෆෝච් හිමි අවුරුදු කිහිපයක් පැංන්ගා පලාතේ අජාන් තේට් හා අජාන් සාම් තෙරුන් වහන්සේලාත් සමඟ චාරිකාවේ වැඩම කොට අතුලෝ හිමියන්ට ගෞරව දැක්වීම සඳහාත් භාවනාව ගැන වැඩිදුරටත් උපදෙස් ගැනීම සඳහාත් අතුලෝ හිමියන් බැහැදැකීමට වැඩියහ. උන්වහන්සේ කුළුපග ලෙස කතා කරමින් මෙසේ පැවසූහ: "ඔබ වහන්සේ දැන් උපෝසථාගාරයකුත් හදලා. මේ විශාල, ලස්සන ශාලාවකුත් හදලා බොහොම විශාල පිං කන්දරාවක් එකතුකර ගන්න ඇති."

අතුලෝ හිමි මෙසේ පිළිතුරු දුන්හ:

"මම මොනවා හරි හැදුවනම් හැදුවේ පොදු යහපතට, ලෝකයාගෙත් ආරාමයේත් ආගමෙත් උන්නතියට. එච්චරයි. පිං ගැන කියනවනම්, මෙහෙම පිනකින් මම මොනවා බලාපොරොත්තු වෙන්නද?"

13. පාඩමක් කියා දුන්නද?

දෙවන ලෝක යුද්ධය අවසන් වී වසර 6ක් ගතවූ පසුත් ලොවට උරුම වූයේ දුප්පත් කමත්, සෑම නිවසකටම බල පෑ ආහාර හිඟයත්, වෙනත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වල හිඟයත්ය. විශේෂයෙන් රෙදි වල හිඟයක් තදින් පැවැතුනි. සාමණේර නමකට හෝ භික්ෂුවකට තුන් සිවුරු කට්ටලයම තිබුනේ නම් ඔහු වාසනාවන්තයෙකි.

එකල මම අතුලෝ හිමියන් සමඟ සිටි විශාල සාමණේර පිරිසෙන් කෙනෙකු වීමි. දිනක් අතුලෝ හිමියන්ගේ ඥාති පුත්‍රයෙකු වූ ප්‍රොම් සාමණේර නම, චුම්පොන් සාමණේර වහන්සේ අළුත් ලස්සන සිවුරක් පොරවගෙන සිටුනු දැක උන්වහන්සේගෙන් මෙසේ ඇසීය. "මේ සිවුර ඔබට කෙහෙන්ද ලැබුනේ?". චුම්පොන් සාමණේර නම මෙසේ පිළිතුරු දුන්හ: "මම අතුලෝ ස්වාමීන් වහන්සේට මගේ වාරයේ උපස්ථාන කර කර ඉන්න කොට උන්වහන්සේ දැක්ක මගේ සිවුර ඉරිලා තියෙනවා. දැකලා මේ අළුත් සිවුර මට දුන්නා."

ප්‍රොම් සාමණේර වහන්සේද අතුලෝ හිමියන්ගේ පා සම්භාහනය කිරීමට අවස්ථාව ලැබුණු විට ඉරුණු සිවුරක් පොරවගෙන ගියේ අළුත් සිවුරක් ලැබීමේ අපේක්ෂාවෙනි. ගුරු හිමියන්ට වත් දක්වා ආපසු ඒමට සැරසුනු සාමණේර හිමියන්ගේ ඉරුණු සිවුර දුටු අතුලෝ හිමි තමාගේ ඥාති පුත්‍රයා ගැන අනුකම්පාව උපදවා නැගිට කැබිනට්ටුව ඇර යමක් දෙමින් මෙසේ කීහ:

"ආහ්, ඕක මහගන්න. ඔහොම ඉරුණු සිවුරක් ඇඳගෙන එහෙ මෙහෙ යන්න එපා."

බොහොම කණගාටු සහගත සිතකින් ප්‍රොම් සාමණේර නමට අතුලෝ හිමියන් අතින් ඉඳිකටුවයි නූලයි පිළිගැනීමට සිදුවිය.

14. සිතින් විඳවීම

දිනක් මැදිවයස් කාන්තාවක් අතුලෝ හිමියන්ට ගෞරව දැක්වීමට පැමිණියාය. තමා හොඳ සමාජ තත්වයක සිටින බවත්, කිසිම දෙයකින් අඩුවක් නැති බවත් ඇය විස්තර කළාය. නමුත් ඇය තම පුතනුවන් ගැන ශෝකී වූවාය. ඔහු අකීකරු, පිළිවෙලක් නැති, ඇති සියළුම නරක විනෝදවීම් වලට ඇබ්බැහි වූවෙකි. ඔහු තම දෙමාපියන්ගේ ධනය මෙන්ම හදවත්ද දවන්නේ ඔවුනට ඉවසාගත නොහැකි මට්ටමකිනි. ඇය අතුලෝ හිමියන්ගෙන් උපදෙස් ඉල්ලා සිටියේ තම ශෝකය අඩු කර ගැනීමටත් තම පුතා නරක වැඩවලින් බේරා ගැනීමටත්ය. අතුලෝ හිමියන් මේ සම්බන්ධව ඇයට උපදෙස් කිහිපයක් ලබා දුන් අතර ඇයට සිත නිශ්චල කර ගැනීමටත් අතහැරීම පුරුදු කිරීමටත් උපදෙස් දුන්හ. ඇය පිටවී ගිය පසු උන්වහන්සේ මෙසේ කීහඃ

"මේ දවස්වල මිනිස්සු විඳවන්නේ සිතුවිලි නිසා."

15. උනන්දු කරවන වචන

ධර්ම දේශනාවකදී අතුලෝ හිමියන් මෙසේ පැවැසූහ:
"සර්ව සම්පූර්ණ වූ භෞතික දේවල් අද ලෝකයේ තියෙනවා. ඒවා ලබාගන්න තරම් නුවණත් හැකියාවත් නැති අය ඒවා ලබාගැනීමට නොයෙක් කරදර වෙනවා. ඒවා ලබාගැනීමට නුවණත් හැකියාවත් තිබෙන අය ඒ වටිනා දේවල් ගොඩක් ලබාගෙන සෑම විටම තම ජීවිතය පහසුවෙන් හා සැපදායක ලෙස ගත කරනවා. නමුත් ආර්යයන් වහන්සේලා කිසිම දෙයක් නැති සමාපත්තියකට සමවැදිලා ඒවායින් මිදීමට උත්සාහ ගන්නවා. මොකද?

ලෝක විෂය පථයේ ඔබට තියෙන්නේ ඔබට තියෙන දේවල්,
ධර්ම විෂය පථයේ ඔබට තියෙන්නේ ඔබට නැති දෙයක්."

16. උනන්දු කරවන තවත් වචන

"ඔබ සිත, ඒ සිත යොමුවන සියලු දේවලින් වෙන්කර ගත්තොත්, සිත තවදුරටත් දුකත් එක්ක බැඳී නැහැ. දකින රූප, ශබ්ද, ගඳ-සුවඳ, රස, කායික ස්පර්ශයන් හොඳ හෝ නරක වන්නේ සිත ඒවා වෙත ගොස් ඒ ආකාරයට ඒවා හැඩ ගස්වන නිසයි. සිතට ප්‍රඥාව නැතිනම්, එය දේවල් වැරදියට තේරුම් ගන්නවා. වැරදි විදියට තේරුම් ගත්තම, කායිකව හා මානසිකව බැඳ දමන මේ දේවල් වල බලපෑමට සිත නතු වෙලා මුලාවට පත්වෙනවා.

අප විඳින කායික දුක් වේදනා වලින් යම් තරමකට හෝ අපව මුදවා ගැනීමට අනිත් මිනිස්සුන්ට පුළුවන්. නමුත් කෙලෙස් හා ආශාව (තණ්හාව) නිසා සිත බැඳී ගොස් තිබෙන මානසික දුක් වේදනා වලින් මිදීම සඳහා කටයුතු කිරීමට අප තනි තනිවම උත්සහ ගත යුතුයි.

ආර්යයන් වහන්සේලා දෙයාකාරයේම දුක් වේදනා වලින් නිදහස් වෙලයි ඉන්නේ. මේ නිසයි දුක් වේදනා වලට ඔවුන් යටපත් කරන්න බැරි.''

17. උනන්දු කරවන වචන තව දුරටත්

"කෙනෙක් කෙස් රැවුල් බා කහට පාට සිවුරක් පෙරෙව්වමම ඒක තමයි මහණ කමේ ලකුණ. නමුත් ඒක බාහිර පැවිද්දක් විතරයි. නමුත් ඔහුගේ සිතේ ඇති අවුල, සියළුම නරක සිතුවිලි සිතින් බාපු දවසට තමයි ඔහු ඇතුලතින් පැවිදි වුනයි කියලා කියන්න පුළුවන් වෙන්නේ.

හිස කෙස් බැවම උකුණන් වැනි පුංචි කෘමි සතුන්ට එතැන පදිංචි වෙන්න බෑ. එලෙසින්ම සිත සිතුවිලි වලින් මිදිලා සංස්කාර (සිතින් කරන සකස් කිරීම්) වලින් නිදහස් වුනාම දුකට එහි පදිංචි වෙන්න බෑ. මේ තත්වය ඔබේ සාමාන්‍ය තත්වය බවට පත්කර ගත්තම තමයි ඔබට සැබෑ පැවිද්දෙක් කියලා කියන්න පුළුවන්."

18. "බුද්ධෝ" මොන වගේද?

1978 මාර්තු 31 දින බැංකොක් නුවර ධර්මය ඉගැන්වීමට අතුලෝ හිමියන්ට ඇරැයුම් ලැබිණි. එහිදී පැවැත්වූ ධර්ම සාකච්ඡාවේදී ගිහි කිහිප දෙනෙක්ම 'බුද්ධෝ'[1] මොන වගේදැයි සැක පහල කළහ. ඔවුනට පිළිතුරු දීමට තරම් අතුලෝ හිමියන් කාරුණික වූහ.

"ඔබ භාවනා කරන විට සිත පිටතට යවන්න එපා. සිත කිසිම දැනුමකට සම්බන්ධ කරන්නත් එපා. ඔබ කිසියම් පොතකින් හෝ ගුරුවරයකුගෙන් ලබාගත් දැනුම රැගෙන ඇවිත් තත්වය සංකීර්ණ කරගන්න එපා. සිතේ පැලපදියම් වූ සියළු සිතුවිලි කපා දමන්න. එසේ කර සිත තුල සිදුවන දෑ වලින්ම දැනුම මතුවෙන්න ඉඩ හරින්න. සිත නිශ්ශබ්ද වූ විට එය ඔබටම වැටහෙනවා ඇති. නමුත් ඔබට ගොඩක් භාවනා කරන්න සිදු වේවි. ඥානය වර්ධනය වෙන්න සුදුසු වෙලාව ආවාම එය ඉබේම වර්ධනය වේවි. ඔබ යමක් දන්නේ නම් ඒ දැනුම ඔබේ සිතෙන්ම මතුවූවක් වන්නට ඉඩ හරින්න.

නිශ්ශබ්ද සිතකින් මතුවන දැනුම ඉතාම සියුම්, ඒ වගේම ගැඹුරුයි. ඒ හින්දා ඔබේ දැනුම නිශ්ශබ්ද, නිසල මනසකින් මතුවෙන්න ඉඩ හරින්න.

සිතට එකම කාර්යයක යෙදෙන්න ඉඩ හරින්න. එය බැහැරට යවන්න එපා. සිතට සිතෙහිම රැඳී ඉන්න ඉඩ දෙන්න. සිතට තමන්ගේ පාඩුවේ භාවනා කරන්න ඉඩ හරින්න. සිතටම 'බුද්ධෝ, බුද්ධෝ' කියන්න ඉඩ දෙන්න. එවිට සැබෑ 'බුද්ධෝ' සිතෙහි පහල වේවි. එවිට 'බුද්ධෝ' මොන වගේදැයි ඔබටම වැටහේවි. එතැන තියෙන්නේ එච්චරයි. ගොඩක් දේවල් නෑ."

(පටිගත කිරීමකින් උපුටා ගන්නා ලදී)

---

1. තායි භාවනායෝගීන් අතර ප්‍රචලිත භාවනා මන්ත්‍රයකි.

19. හොඳ දෙයක් අවශ්‍ය අයට යමක්

1983 සැප්තැම්බර් මුල අභ්‍යන්තර කටයුතු අමාත්‍යංශයේ ගෘහණියන්ගේ සංගමයේ කණ්ඩායමක් සමාජසේවා වැඩකටයුතු සඳහා ඊසානදිග පලාතට පැමිණියහ. දිනක් හවස 6.20ට පමණ ඔවුහු අතුලෝ හිමියන්ට ගෞරව දැක්වීමට අවස්ථාව උදාකර ගත්හ. ඔවුන් ගෞරව දක්වා පිළිසඳර කතා නිම කිරීමෙන් පසු ඔවුනට සුර (Amulets)[1] කිහිපයක් උන්වහන්සේගෙන් ලැබුණි. උන්වහන්සේ අසනීප තත්වයෙන් පසුවන බව දුටු ඔවුහු ඉක්මනින් පිටව ගිය නමුත් එක් කාන්තාවක් පමණක් නැවැතුනේ අතුලෝ හිමියන්ගෙන් ඉල්ලීමක් කිරීමටය:

"ස්වාමීනි, මටත් හොඳ දෙයක් (සුරයක්) ලැබුනොත් හොඳයි."

අතුලෝ හිමියන් මෙසේ පිළිතුරු දුන්හ: "හොඳ දෙයක් අවශ්‍ය නම් භාවනා කළ යුතුයි. ඔබ භාවනා කළොත් සිත සන්සුන් වේවි. එවිට වචනයත් ක්‍රියාවත් සන්සුන් වේවි. ඔබේ වචනයත් ක්‍රියාවත් හොඳ වේවි. ඔබ ඒ විදියට හොඳින් සිටියොත් ඔබ සතුටින් ඉඳීවි."

"ස්වාමීනි, මට වැඩ රාජකාරි ගොඩක් තියෙනවා. රජයේ වැඩ මා කාර්යබහුල කරලයි තියෙන්නේ. ඉතින් භාවනා කරන්න වෙලාවක් කොයින්ද?"

අතුලෝ හිමියන් මෙලෙස පැහැදිලි කළහ:

"ඔබට හුස්ම ගන්න වෙලාවක් තියෙනවනම් ඔබට භාවනා කරන්නත් වෙලාවක් තියෙනවා."

---

[1] තායිලන්තයේ ආරක්ෂක සුර (Amulets) සඳහා ඇත්තේ උනන්දුවකට වඩා උමතුවකි. අපට මෙය මිත්‍යාදෘෂ්ඨික වැඩක් සේ පෙනුනත් එය ලංකාවේ පිරිත් නූල් බැඳීමට බොහෝ සමානය.

20. තියෙනවා, නමුත් ඇත්තේ නෑ

වර්ෂ 1979 අතුලෝ හිමියන් චන්තබුරි වෙත ගියේ විවේක ගැනීමටත් අජාන් සොම්චයි හිමි හමුවීමටත්ය. ඒ අවස්ථාවේ, අතුලෝ හිමියන්ට වර්ෂයකින් පමණක් බාල බැංකොක් වල බුප්පාරාමයේ වැඩිහිටි භික්ෂුවක් වූත් දකුණු පලාතේ සංඝනායක වූත් පූජ්‍ය ධම්මවරලන්කන් හිමි එහි භාවනා කිරීමට පැමිණ සිටියේ තම මහළු වයසත් නොසළකාය. අතුලෝ හිමි භාවනායෝගී භික්ෂුවක් බව දැනගත් කල්හි උන්වහන්සේ බොහෝ උනන්දු වී භාවනාවේ ප්‍රතිඵල ගැන බොහෝ වේලාවක් සාකාච්ඡා කළහ. තමාගේ වගකීම් ගැන කථා කළ උන්වහන්සේ පැවසුවේ බොහෝ වයසට යනතෙක්ම අධ්‍යාපන හා පරිපාලන වැඩවල යෙදෙමින් තම ජීවිතයේ විශාල කාලයක් නාස්ති කර ගත් බවයි. අතුලෝ හිමියන් සමඟ භාවනාව ගැන සාකච්ඡා කළ උන්වහන්සේ අවසානයේ මෙසේ ඇසූහ. "ඔබට තවම කේන්තිය තියෙනවද?" අතුලෝ හිමියන්ගේ ක්ෂණික පිළිතුර වූයේ:

"තියෙනවා, නමුත් මං ඒක අල්ලගන්නේ නෑ."

21. දැනගැනීම

අතුලෝ හිමි බැංකොක් නුවර චූළලොංකෝන් රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී උන්වහන්සේගෙන් ධර්මය ඇසීමටත් ගෞරව දක්වීමටත් විශාල පිරිසක් පැමිණියහ. භාවනාව ගැන උනන්දු වූ අය අතර කොංසුක් මහතාද විය. ඔහු අපේ කාලයේ දැඩි විනයක් තිබූ භාවනා මධ්‍යස්ථානයක් වූ නන්තබූරි පලාතේ සංසදාන ආරාමයේ අජාන් සනවංග් හිමියන්ගේ ශිෂ්‍යයකු විය. ඔහු ධර්මය පුහුණු කිරීම පිළිබඳ මාතෘකාවට පැමිණියේ මෙලෙස ප්‍රශ්ණයක් අසමිනි. "ස්වාමීනි, කොහොමද කෙනෙක් කේන්තිය නැති කර ගන්නේ?"

අතුලෝ හිමි මෙසේ පිළිතුරු දුන්හ:

"කේන්තිය නැති කරන කෙනෙක් නෑ. එය මතු වුනාම ඒ ගැන දනුවත් වන එක විතරයි එතැන තියෙන්නේ. ඔබ ඒක දනගත්තම, ඒ කේන්තිය නිකම්ම නැති වෙලා යනවා."

22. ධර්ම මාර්ගය

චූළලොංකෝන් රෝහලේ දී අතුලෝ හිමියන්ට උපස්ථාන කළ බොහෝ සාමණේර හා භික්ෂූන් වහන්සේලාව වික්ෂිප්ත මෙන්ම පුදුම කරවූ කාරණය වූයේ ඇතැම් දිනවල අළුයම 1.00ත් පසුවීමෙන් පසුව අතුලෝ හිමියන් තමන් ඉදිරියේ විශාල පිරිසක් සිටින විටෙක මෙන් විනාඩි දහයක් පමණ ධර්මය විස්තර කොට පසුව ගාථාවක් පවසා ආශිර්වාද කරනු අසන්නට ලැබීමයි. මුලින් කවුරුවත් ඒ ගැන ඇසීමට ඉදිරිපත් නොවූ නමුත් මෙම සිදුවීම බොහෝ වාරයක් සිදුවූ පසු තමන්ගේ සැකය තවදුරටත් සඟවාලිය නොහැකි වූ තැන ඔවුහු ඒ පිළිබඳව විමසූහ.

අතුලෝ හිමි මෙසේ පිළිතුරු දුන්හ:

"මේ සැක හා ප්‍රශ්ණ කිරීම් ධර්මය පුහුණු කිරීමේ මාර්ගය නොවෙයි."

23. කිරාමැන කතා කරන බව

බූරිරාම් පලාතේ ධර්මය පුහුණුවන්නන් පිරිසක් පලාත් අභිචෝදක පොලිස් ලුතිනන්වරයාගේ මූලිකත්වයෙන් අතුලෝ හිමියන් හමුවීමට පැමිණියේ උන්වහන්සේට ගෞරව දැක්වීමටත්, ධර්මය ඇසීමටත්, ඔවුන්ගේ ධර්ම පුහුණුව තව දියුණු කර ගැනීමට උපදෙස් ගැනීමටත්ය. ඔවුහු ප්‍රසිද්ධ අජාන්වරු (ගුරුවරු) සියළු දෙනා යටතේම පාහේ පුහුණුව ලබා තිබූ අතර උන්වහන්සේලා විසින් නොයෙක් ආකාරයටත්, ඇතැම් විට එකිනෙකට පටහැනි ක්‍රම වලටත් ධර්මය කියා දී තිබූ අතර මෙය තව තවත් ඔවුන් තුල සැක සංකා ඉපදවීමට හේතු වී තිබුණි. ඔවුන් කියා සිටියේ පුහුණුව සඳහා කාලය සොයා ගැනීම ඔවුනට ගැටළුවක් බැවින් නිවැරදි හා වඩාත් පහසු ක්‍රමය කියා දෙන ලෙසය. 'පහසුම ක්‍රමය' ඔවුනට වඩාත් ගැලපෙන ක්‍රමය බව ඔවුහු කීහ. අතුලෝ හිමි මෙසේ පිළිතුරු දුන්හ.

"සිත වෙතටම යොමු වී සිත දෙස බලා සිටින්න."

24. ලේසියි, නමුත් අමාරුයි

බැං සී හි පිහිටි පළමු වන ගුවන් හමුදා ගුවන්විදුලියේ පිරිසක් ඊසාන දිග පලාතට පැමිණියේ එම පලාතේ නොයෙක් ආරාම වල වැඩ සිටින අජාන් වරුන්ට ගෞරව දැක්වීමටත් ආධාර පිරිනැමීමටත්ය. ඔවුහු අතුලෝ හිමියන්ට ගෞරව දැක්වීමට පැමිණ ආධාර පිරිනමා කුඩා සිහිවටන ලැබූහ. ඉන්පසු ඔවුහු විවේක ගැනීමටත් සාප්පු සවාරි යෑමටත් පිටත්ව ගිය අතර හතර පස් දෙනෙකුගෙන් යුත් කුඩා කණ්ඩායමක් රැඳුනේ ඔවුන් නිතර පීඩා විඳි මානසික ආතතියෙන් හා මානසික පීඩනයෙන් අත්මිදීම සඳහා පහසු ක්‍රමයක් අසා දැන ගැනීම සඳහායි. 'කුමන ක්‍රමයකින් වඩාත් ඉක්මන් ප්‍රතිඵල ලැබේද?' යි ඔවුහු විමසූහ.

අතුලෝ හිමි මෙසේ පිළිතුරු දුන්හ:

"ඔබේ සිත බැහැරට යවන්න එපා."

25. එය අත හරින්න

දිනක් එක් මහාචාර්යවරියක් අතුලෝ හිමියන්ගේ ධර්ම දේශනාවක් අසා, 'දුක පැළඳීමේ' ('ශෝක කිරීම' සඳහා යොදන තායි යෙදුමකි) නිවැරදි ක්‍රමය විමසුවාය. ඇය මෙසේද කීවාය. "පිළිගත් ක්‍රමයට අනුව නිවැරදිව 'දුක පළඳින්න' අද මිනිසුන් දන්නේ නෑ. හය වන රාමා රජතුමා, ඔහුගේ කාලයේ ඒ සඳහා හොඳ ප්‍රමිතියක් නියම කරලා තිබුණා. තමන්ගේ පවුලේ කෙනෙකු හෝ තමන්ගේ වැඩිහිටි ඥාතිවරයෙක් මිය ගිය විට තිබුණු ක්‍රමය තමයි දින 7ක් හෝ දින 50ක් හෝ දින 100ක් දුක පළඳින එක. නමුත් අද මිනිස්සු එහෙම නියමිත ක්‍රමයක් අනුගමනය කරන්නේ නෑ. ඒ හින්දා මම කැමති ඔබ වහන්සේගෙන් අහන්න දුක පළඳින නිවැරදි ක්‍රමය කුමක්ද කියා."

අතුලෝ හිමි මෙසේ පිළිතුරු දුන්හ:

"දුක කියන්නේ අවබෝධ කරගත යුතු දෙයක්. අවබෝධ කළ පසු අත් හරින්න. ඇයි ඔබට එය පළඳින්න උවමනා?"

26. සත්‍යයට අනුව සත්‍යය

එක් චීන කාන්තාවක් අතුලෝ හිමියන් හමුවීමට පැමිණ ගෞරව දක්වා මෙසේ විමසුවාය. "මට බූරිරාම් පලාතේ ප්‍රාකොන්චායි දිස්ත්‍රික්කයට යන්න වෙලා තියෙනවා එහෙ සිටින මගේ ඥාතීන්ගේ නිවෙස් අසල ව්‍යාපාරයක් ඇරඹීමට. නමුත් ප්‍රශ්ණය වෙලා තියෙන්නේ ඒ අය කියනවා වඩාත් හොඳට විකිණෙන්නේ එක්කෝ අරක, නැත්නම් මේක, නැත්නම් වෙන එකක් කියලා. ඉතින් මට හිතා ගන්න බෑ මොනවා විකුණන්න සුදුසුද කියලා. ඉතින් මම ආවේ කුමක් විකිණිය යුතුද කියලා ඔබ වහන්සේගෙන් උපදෙසක් ලබා ගැනීමටයි."

අතුලෝ හිමි මෙසේ පිළිතුරු දුන්හ:
"යමක් සල්ලි දීලා මිලදී ගන්න මිනිස්සු ඉන්නවා නම් ඒ ඕන දෙයක් විකුණන්න හොඳයි."

27. එය වැදගත් නැහැ.

1979 මැයි 8 වැනිදා සවස හමුදා නිලධාරීන් දස දෙනෙකු පමණ බැංකොක් යාමට පෙර අතුලෝ හිමියන්ට ගෞරව දැක්වීමට පැමිණියහ. ඉන් දෙදෙනෙකු ලුතිනන් ජනරාල් නිලයේ අය වූහ. උන්වහන්සේ සමග ටික වෙලාවක් කතා කිරීමෙන් අනතුරුව තම ගෙල පැළඳි ආරක්ෂක සුර බන්දේසියක තැබුවේ අතුලෝ හිමියන්ගේ සමාධි බලයෙන් ආශිර්වාද ලබා ගැනීම සඳහාය. උන්වහන්සේ එය ඉටුකර නැවත ඒවා ආපසු බාර දෙන ලදී. එක් ජනරාල් වරයෙකු එවිට මෙසේ ඇසීය. "මම අහලා තියෙනවා ඔබ වහන්සේ සුර වර්ග කිහිපයක්ම හදලා තියෙනවා කියලා. ගොඩක්ම ජනප්‍රිය වුනේ ඒවායින් මොන වර්ගයද?"

අතුලෝ හිමියන් මෙසේ පිළිතුරු දුන්හ:

"එකක් වත් ජනප්‍රිය නෑ."

28. දුර ලෝක දෙකක අය

දිනක් අතුලෝ හිමි ශාලාවේ ඉස්තෝප්පුවේ අසුන් ගෙන සිටියදී දුර පලාතකින් තරුණයන් තුන් හතර දෙනෙකු උනවහන්සේ බැහැ දැකීමට පැමිණියහ. ඔවුන්ගේ ගරුසරුවක් නැති හැසිරීම් විලාශයෙන් පෙනී ගියේ ඔවුන් නරක භික්ෂූන්ගේ ඇසුර ලබා ඇති බවය. එලෙසින්ම ඔවුන් සිතුවේ අතුලෝ හිමියන් ආරක්ෂක සුර පිළිබඳව උනන්දු වන කෙනෙකු ලෙසය. ඔවුහු තමන්ට සුවිශේෂී අද්භූත බල ඇති සුර දීපු තාන්ත්‍රික අජාන්වරු ගැන උන්වහන්සේට පැවැසූහ. අවසානයේ ඔවුහු උන්වහන්සේ ඉදිරියේදීම තමන්ගේ සුර ඉවතට ගෙන එකිනෙකාට ප්‍රදර්ශනය කර ගත්හ. එකෙකු ලඟ වල් ඌරු දලයක් විය. තවකෙකු ලඟ ව්‍යාඝ්‍ර දතකි. අනෙකා ලඟ කඟවේන අඟකි. සෑම කෙනෙක්ම ඒ තමන්ගේ සුර බලසම්පන්න යැයි ප්‍රකාශ කළහ. එක් අයෙක් අතුලෝ හිමියන්ගෙන් මෙසේ විමසීය. "ඒහ් ස්වාමීනි, මේවා අතරින් අනෙක්වාට වඩා හොඳ එක, සුවිශේෂී එක මොකක්ද?"

අතුලෝ හිමියන්ටද මෙය විනෝදයක් වූ බව පෙනුනු අතර සිනහවකින් මුව සරසාගත් උන්වහන්සේ මෙසේ කීහ.

"එකක්වත් හොඳ නැහැ. එකක්වත් විශේෂ නෑ. ඕවා ඔක්කොම සාමාන්‍ය සතුන්ගේ ශරීර කොටස් විතරයි."

29. සිත රැඳුන දේ

අතුලෝ හිමියන් වරක් මෙසේ පැවැසූහ. "1952 වස් කාලයේ මම අධිෂ්ඨානයක් කර ගත්තා මුළු ත්‍රිපිටකයම කියවලා බුදුන් වහන්සේගේ ඉගැන්වීමෙහි අවසානය තියෙන්නේ කොතැනද කියලා දැන ගන්න. කොතැනද චතුරාර්ය සත්‍යයේ, දුකෙහි කෙලවර තියෙන්නේ කියලා දැනගන්න. කොහොමද බුදුන් වහන්සේ එය සංක්ෂිප්ත කර දක්වන්නේ කියලා දැන ගන්න. ඉතින් මම අවධානයෙන් කියෙව්වම කිසිම දෙයක් හිතට වැදුනේ නැහැ. 'මේ තමයි දුකෙහි කෙලවර, මේ තමයි මාර්ගඵල වල කෙලවර, මේ තමයි නිවන' කියලා, එක දෙයක් හැරෙන්න. සැරියුත් හිමියන් නිරෝධ සමාපත්තියෙන් නැඟිට්ටට පස්සේ බුදුන් වහන්සේ අහනවා "සාරිපුත්ත, ඔබේ සමේ වර්ණය ඉතා පාරිශුද්ධයි. ඔබේ ඉන්ද්‍රියයන් ඉතාම ප්‍රසන්නයි. ඔබ කුමන විහරණයකින් දැන් වැඩිපුර වසන්නේද?" කියලා.

සැරියුත් හිමියන් පවසනවා "මම සුඤ්ඤතා විහරණයෙන් විසුවෙමි" කියලා.[1] ඒක නම් මගේ සිතේ තදින්ම රැඳුනා."

---

1. මජ්ඣිම නිකාය 3.5.9 පිණ්ඩපාතපාරිශුද්ධි සූත්‍රය

30. ඉගෙන ගතයුතු දේ හා නොගත යුතු දේ

අජාන් සුචින්නෝ හිමි බොහෝ කලකට පෙර (ගිහි කාලයේ) ධම්මසාත් විශ්ව විද්‍යාලයෙන් නීති උපාධිය ලැබූ, ධර්ම පුහුණුව ඉතා ඉහලින් අගය කළ කෙනෙකු විය. ඔහු පූජ්‍ය ලුයි හිමියන්ගේ ශිෂ්‍යයකු ලෙස වසර ගණනාවක් සිටි අතර ඉන්පසුව අතුලෝ හිමියන්ගේ කීර්තිරාවය අසා උන්වහන්සේ ලඟ පුහුණුව ලැබීමට පැමිණියේය. ඉක්බිති පැවිදි වූ උන්වහන්සේ අතුලෝ හිමියන් සමඟ කලක් වාසය කර විවේකය සොයාගෙන තනිව විසීමට තැනක් සෙවීමට චාරිකාවේ වැඩීම සඳහා සමුගැනීමට පැමිණියහ. අතුලෝ හිමියෝ මෙලෙස අවවාද කළහ.

"විනය ගැන කියන කොට ඔබ විනය පොත් හොඳින් ඉගෙන ගත යුතුයි. සෑම විනය නීතියක්ම නිවැරදිව ඉගෙන ගෙන වරදක් නොවන ලෙස ප්‍රායෝගිකව භාවිතා කරන්න දත යුතුයි. ධර්මය ගැන කියන්න තියෙන්නේ ඔබ ගොඩක් කියෙව්වොත් ගොඩක් විතර්ක ඒවි, ඒ නිසා එය කියවන්න අවශ්‍යම නැහැ.[1] ඔබේ පුහුණුව ගැන පමණක් සිතන්න. ඒ හොඳටම ඇති."

---

1 පරිවර්තක නම් මෙම ප්‍රකාශයට කිසිසේත් එකඟ නැති බව නම් කිව යුතුමය. ධර්මය නොදන්නා අය පාර නිතරම වරද්දා ගන්නා අතර පහසුවෙන්ම අධිමානයට හසු වේ. ධර්ම ඥාණය ඇති අයද අධිමානයට හසු වන අවස්ථා ඇති නමුදු ධර්ම ඥාණය ඇති විට පාර වරද්දවා ගන්නා අවස්ථා අඩුය. (අධිමානය යනු උසස් තත්වයකට පත් නොවීම පත්වූහයි සිතීමයි. ලංකාවේ මෙය සුලභ සිද්ධියකි.)

31. කුමක් දෙස බලන්නද?

පූජ්‍ය තා නයේන් පැවිදි වූයේ මැදි වයසද පසු වූ විටය. සාක්ෂරතාවයක් නොමැති, මධ්‍යම තායි භාෂාව කතා කළ නොහැකි කෙනෙකු වුවත් ඔහු කෙරෙහි වරදක් දැකීමට නොහැකි තරමට කඩිසර, කීකරු, යහපත් අරමුණෙන් වැඩ කරන කෙනෙකු විය. අනෙක් භික්ෂූන් චාරිකාවේ වැඩම කිරීමට හෝ වෙනත් අජාන්වරයෙකු යටතේ ඉගැනීමට හෝ පිටත්ව යනු දුටු විට ඔහුට ද එලෙස යෑමේ ආශාවක් ඇති විය. අතුලෝ හිමියන් වෙතට ගොස් ඒ සඳහා අවසර ඉල්ලූ විට ඒ අවසරය ද ලැබුණි. නමුත් අනතුරුව ඒ පිළිබඳව ඔහුට අසහනයක් ඇති වී මෙසේ ඇසීය. "මට කියවන්න බෑ. මම ඒ අයගේ භාෂාව දන්නේ නෑ. මම කොහොමද ඒ අයත් සමඟ පුහුණු වන්නේ?"

අතුලෝ හිමියන් මෙසේ උපදෙස් දුන්හ:

"පුහුණුව කියන්නේ අක්ෂර මාලාවක අකුරුවත්, භාෂාවක වචනවත් නොවෙයි. ඔබ දන්නේ නැති බව දන්න එක හොඳ ආරම්භයක්. පුහුණු වෙන්න ඕන මේ විදියට: විනය සම්බන්ධව කරන්න තියෙන්නේ අජාන්වරයා දෙස බලන එක. ඔහුව ආදර්ශයට ගන්න එක. ඔහු කරන දෙයින් පිටස්තර කිසි දෙයක් කරන්න එපා. ධර්මය සම්බන්ධව කරන්න තියෙන්නේ සිත දිහා බලන එක. සිත ගැනම පුහුණු වෙන එක. ඔබ සිත අවබෝධ කර ගත්තොත් එපමණකින්ම සියල්ල අවබෝධ කර ගත්තා වෙනවා."

32. ප්‍රශ්ණ හා වගකීම්

සංඝ පරිපාලනයේ දී කුදු මහත් කටයුතු වලට අමතරව තිබෙන විශාලතම ගැටළුවක් වන්නේ විහාරාධිපති හිමිවරුන්ගේ හිඟ පාඩුවයි. ඇතැම් ආරාම වල විහාරාධිපතිකම සඳහා ඇති බල අරගල ගැන අසන්න ලැබෙතත් අතුලෝ හිමියන්ගේ ගෝලයන් විහාරාධිපති තනතුරට පත් කිරීම සඳහා පෙළඹවීමට හෝ බල කිරීමට සිදු විය. සෑම වර්ෂයකම දායක කණ්ඩායම් පැමිණ තමන්ගේ ආරාමයේ නායක කම භාර ගැනීමට ශිෂ්‍යයෙකු පත් කරන ලෙස අතුලෝ හිමියන්ගෙන් ඉල්ලා සිටිති. අතුලෝ හිමියන් ඒ සඳහා සුදුස්සෙකු දුටුවහොත් ඔහුට ඒ සඳහා ඉදිරිපත් වන ලෙසට ඉල්ලා සිටීමට සිදුවෙයි. නමුත් බොහෝ විට ඒ භික්ෂූන් වහන්සේ ඊට කැමති වන්නේ නැත. නිදහසට කාරණා ලෙස සාමාන්‍යයෙන් ඉදිරිපත් කරන්නේ "මම ඉදිකිරීම් වැඩ දන්නේ නෑ. අනෙක් හාමුදුරුවරුන් පුහුණු කරන්න දන්නේ නෑ. බණ කියන්න දන්නේ නෑ. අමුත්තන් පිළගන්නත් මහජන සබඳතා පිළිබඳවත් මට දක්ෂතාවයක් නෑ" යන්නයි.

අතුලෝ හිමියන් මෙලෙස පිළිතුරු දෙති:

"ඕවා එකක්වත් ඇත්තටම අවශ්‍ය නෑ. ඔබේ වගකීම වන්නේ එදිනෙදා වත් පිළිවෙත් ටික කරන එක විතරයි. පිණ්ඩපාතෙ වඩින එක, දානෙ වළඳන එක, පර්යංක භාවනාවේ යෙදෙන එක, සක්මන් භාවනාවේ යෙදෙන එක, මිදුල් අතුපතුගාන එක, දැඩිව විනය රකින එක. එච්චරයි. ඒ හොඳටම ඇති. ඉදිකිරීම් වැඩ ගැන කියන්න තියෙන්නේ ඒක දායකයන්ගේ වැඩක් කියන එක. ඒක කරන නොකරන එක ඒ අයගේ වැඩක්."

33. අල්පේච්ඡතාව හා සතුට

අතුලෝ හිමියන් තම අවසාන කාලයේ සෑම සැන්දෑවකම සවස 5.00ට පමණ සාමණේර හෝ භික්ෂුනමකගේ උදව් ඇතිව උණු වතුර පැන් පහසු කළහ. ඇඟ වියලා ප්‍රබෝධමත් වූ පසු ඒ මොහොතේ සිතට ආ දහම් කරුණු ටිකක් වදාරති. එක්වරක් උන්වහන්සේ මෙසේ පැවැසූහ.

"අපි භික්ෂූන් වහන්සේලා විදියට අපේ භික්ෂුභාවය ගැන සන්තෘප්තියක් ඇති කර ගත්තොත් අපිට දැනෙන්නේ සතුටක් හා සමාදානයක් විතරයි. ඒ වුනාට භික්ෂුවක් විදියට වෙන දේවල් පිටුපස දුවන්න ගියොත් අපිට හැමවිටම දුකේ ගිලී ඉන්න වේවි. ඔබ ආශාව නතර කර ගත්තොත්, සෙවීම නතර කර ගත්තොත් ඒක තමයි සැබෑ භික්ෂුභාවය. ඔබ සැබෑ භික්ෂුවක් වී දුප්පත් (අල්පේච්ඡ) වන තරමට සතුට වැඩිවේවි."

34. ගොඩක් වැඩ අවශ්‍ය නෑ

"ඔබ මුළු ත්‍රිපිටකයම කියෙව්වත්, ගොඩක් සූත්‍ර කට පාඩම් කර ගත්තත්, සිත් දිනා ගන්නා ආකාරයට ඒවා දේශනා කරත්, ගොඩක් මිනිස්සු ඔබට ගරු කරත්, ගොඩක් ගොඩනැගිලි හැදුවත්, අනිත්‍ය දුක්ඛ අනාත්ම බොහෝම විස්තර ඇතිව දේශනා කළත්, ඔබ පුහුණුවේ ප්‍රමාදී වෙනවානම් ඔබ පොඩ්ඩක්වත් දහම් රසය විඳලා නැහැ. මොකද ඔය සියල්ල බාහිර දේවල් පමණයි. ඒවායින් සැලසෙන්නේ බාහිර සේවයක් පමණයි. සමාජයට, මිනිස්සුන්ට, අනාගත පරපුරට සේවයක් විතරයි. ඒවා ආගමේ සංකේත විතරයි. තමාට ම සැබෑ සේවයක් සලසවන එකම දේ දුකින් මිදීම විතරයි.

ඔබට දුකින් මිදෙන්න ලැබෙන්නේ ඔබේ එකම හිත දැන ගත්තොත් විතරයි."

35. හිතන්නෙපා දක්ෂයි කියලා

අතුලෝ හිමියන්ගේ එක් ශාඛා භාවනා සෙනසුනක පහක් හයක් පමණ භික්ෂු පිරිසකට වඩාත් දැඩිව පුහුණුවේ යෙදීමට අවශ්‍ය විය. ඒ සඳහා ඔවුහු වස්සාන තුන් මස තුල කතා නොකර සිටීමට දිවුර ගත්හ. එනම් දෛනිකව කෙරෙන වන්දනාවත්, සති දෙකකට වරක් කෙරෙන ප්‍රාතිමෝක්ෂ දෙසීමත් හැරෙන්න ඔවුන්ගේ මුවින් කිසිම වචනයක් පිට නොවිය යුතු විය. වස්කාලය අවසානයේ ඔවුහු අතුලෝ හිමියන් බැහැ දැකීමට පැමිණ තම දැඩි පුහුණුව ගැන කීහ. ඔවුන්ගේ වත් පිළිවෙත්වලට අමතරව මුළු වස්කාලය තුලම ඔවුහු වචනයක් හෝ කතාකර තිබුණේ නැත.

අතුලෝ හිමියන් මඳක් සිනාසී මෙසේ කීහ:

"ඒක හරි හොඳයි. කතා නොකර ඉන්න කොට වචනයෙන් වන වැරදි වෙන්නේ නෑ. නමුත් ඔබ කියනවානම් ඔබ කතා කළේ නෑ කියලා, ඒක වෙන්න විදියක් නෑ. වේදනා සංඥා නැති නිරෝධ සමාපත්තියට සමවදින ආර්යයන් වහන්සේලාට පමණයි කතා නොකර ඉන්න පුළුවන්. අනෙක් සියලු දෙනාම දිවා රෑ දෙකේම නොනවත්වා කතාකරනවා. විශේෂයෙන් කතා නොකර ඉන්න දිවුර ගත්ත අය. ඒ අය අනිත් සියලු දෙනාටම වැඩියෙන් කතා කරනවා. අනිත් අයට ඇහෙන සද්දයක් නොකර ඉන්න එක විතරයි ඒ අය කරන්නේ."

36. වැරදි පැත්තට යන්න එපා

අතුලෝ හිමියන් තම හදවතින් මතුවූ ප්‍රඥා සහගත ප්‍රකාශ වලට අමතරව ත්‍රිපිටකය පිළිබඳව ඇති පරිචය නිසා පෙළ පොතින් දහම් පාඨද ගෙනහැර දැක්වූහ. උන්වහන්සේ කෙටි නමුත් පුහුණුවට ඍජුවම අදාල වන වැදගත් යැයි සිතූ පාඨ අප වෙනුවෙන් ප්‍රකාශ කළහ. උදාහරණයක් ලෙස උන්වහන්සේ ගෙනහැර දැක්වීමට කැමති වූ පාඨයක් වූයේ: "මහණෙනි, මේ බ්‍රහ්මචර්යාව තිබෙන්නේ ජනයා මෙලෙස මා ගැන දනීවායි ජනයා රැවටීමට නොවේ, ජනයා ලවා ගුණ කියවා ගැනීමටත් නොවේ. ලාභ සත්කාර, ගරු බුහුමන්, ප්‍රසිද්ධිය ලබා ගැනීමටත් නොවේ. වාදයන්ගෙන් ජය ලැබීමටත් නොවේ. මේ බ්‍රහ්මචර්යාව තිබෙන්නේ සංවරය පිණිසයි, (කෙලෙස්) ප්‍රහීණ කිරීම පිණිසයි, නොඇලීම පිණිසයි, (දුකෙහි) නිරෝධය පිණිසයි."[1]

අතුලෝ හිමියෝ එයට මෙයද එකතු කරති.

"පැවිදිවන අය, පුහුණු වන අය යා යුත්තේ මේ දිසාවටයි. මේ දිසාව හැරෙන්න අනිත් සෑම දිසාවක්ම වැරදියි."

1. අංගුත්තර නිකාය 4.1.3.5 බ්‍රහ්මචර්ය සූත්‍රය

37. බුද්ධ වචනයක්

අතුලෝ හිමියන් වරක් මෙසේ පැවැසූහ: ''මිනිසුන්, සාමාන්‍ය මිනිසුන් (පෘතග්ජනයින්) සේ සිටින තාක් කල් මාන්නය හා මතවාද (දෘෂ්ඨි) තිබෙනවා. මාන්නය තිබෙන තාක් කල් අනෙක් අයගේ දෘෂ්ඨි කෝණ අනුව බලන්න බැරිව යනවා. ඔවුන්ගේ දෘෂ්ඨි එකඟ නොවන විට ඔවුන් රණ්ඩු කරමින්, විවාද කරමින් කාලය ගත කරනවා. ධර්මයට පැමිණි ආර්ය පුද්ගලයාට වෙනත් කෙනෙක් එක්ක රණ්ඩු ඇති කරවන කිසිම දෙයක් නෑ. ඒ වුනාට අනෙක් මිනිසුන් ඔහුගේ එක එක දේවල් දකිනවා. ඔහු එය ඒ අයගේ වැඩක් ලෙස අතහැර දමනවා. බුදුරජාණන් වහන්සේ වරක් ප්‍රකාශ කළා වගේ:

"මහණෙනි, නුවණැතියන් විසින් ලෝකයෙහි යමක් ඇතැයි කියත්ද, මමද එය ඇතැයි කියමි. නුවණැතියන් විසින් ලෝකයෙහි යමක් නැතැයි කියත්ද, මමද එය නැතැයි කියමි... මම ලෝකයා සමඟ විවාද නොකරමි. ලෝකයා මා සමඟ විවාද කරයි."[1]

1. සංයුක්ත නිකාය 3 ඛන්ධ සංයුත්තය 1.2.5.2 පුප්ඵ සූත්තං

38. නිහැඬියාවේ ගැඹුර

1983 පෙබරවාරි 21 දින අතුලෝ හිමියන් බොහෝ රෝගාතුරව බැංකොක් නුවර චූළලොංකෝන් රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී පූජ්‍ය සාම් අකිඤ්චනෝ හිමි උන්වහන්සේ බැලීමට වැඩියහ. ඒ වෙලාවේ අතුලෝ හිමියන් විවේක ගනිමින් සිටි අතර සාම් හිමියන් ඔහු අසලින් හිඳගෙන ඇඳිලි බැඳ ගෞරව දැක්වූහ. අතුලෝ හිමියෝ ද ඇඳිලි බැඳ සමාචාර දැක්වූහ. ඉන්පසු උන්වහන්සේලා දෙනම ම ඉතාම නිශ්චලව බොහෝ වේලාවක් හිඳගෙන සිටියහ. ඉතාම දිගු වේලාවකට පසු පූජ්‍ය සාම් හිමියන් නැවත වතාවක් ඇඳිලි බැඳ 'මම දැන් යන්නම්' යි පැවැසූහ. අතුලෝ හිමියන්ද දෑත් එක්කොට 'හොඳයි' යැයි පිලිතුරු දුන්හ. පැය දෙකක් පමණ වූ මුළු කාලය තුලම ඔවුන් කතා කරනවා මට ඇසුනු එකම වචන කිහිපය එය විය. සාම් හිමියන් පිටව ගිය පසු ඉතාම කුතුහලයෙන් යුක්තව මම මෙය ඇසීමි. "පූජ්‍ය සාම් ස්වාමීන් වහන්සේ මෙතැනට වැඩලා ගොඩක් වෙලා හිටියා. ඇයි උන්වහන්සේට මොකුත් කතා කළේ නැත්තේ?"

අතුලෝ හිමියන් මෙලෙස පිළිතුරු දුන්හ:

"කළ යුතුදේ සිදුවනා. ඊට එහා කතා කරන්න දෙයක් තිබුණේ නැහැ."

39. ඉවසීමේ පාරමිතාව

මා අතුලෝ හිමියන් සමඟ ගත කළ බොහෝ වර්ෂ ගණනාව තුල උන්වහන්සේ කෙරෙන් කිසියම් දෙයකින් ඉවසිය නොහැකි මට්ටමට හිරිහැර වී සිටින බවක් පෙන්වන හැසිරීමක් මා කිසිවිටෙක දැක තිබුණේ නැත. කිසිම දෙයක් ගැන කිසිම විටෙක පැමිණිලි කරනවා අසා තිබුනේද නැත. උදාහරණයක් ලෙස කිසියම් උත්සවයක ප්‍රධාන වැඩිහිටි භික්ෂුව ලෙස කටයුතු කරන විට තමාට අවශ්‍ය පරිදි කටයුතු සකස් කිරීමට කිසිම විටෙක උන්වහන්සේ සංවිධායකවරුන්ගෙන් ඉල්ලීමක් හෝ ඔවුනට බලපෑමක් හෝ කළේ නැත. උන්වහන්සේට දීර්ඝ වේලාවක් ඉඳගෙන ඉන්න සිදු වුවත්, කාලගුණය බොහෝ උණුසුම් වී දහදිය දැමුවත් ඒ ගැන කිසිවිටෙක පැමිණිලි කළේ නැත. අසනීප වී වේදනාවෙන් පෙළුනත්, දානය ප්‍රමාද වුවත්, කොතරම් කුසගින්නේ සිටියත්, ඒ ගැන කිසි විටෙක මැසිවිලි නැගුවේ නැත. ආහාරය කොතරම් ඇල්මැරුණු නීරස දෙයක් වුවත් එය රසවත් කිරීමට කිසි දෙයක් ඉල්ලුවේ නැත. ඒ වෙනුවට උන්වහන්සේ වෙන වැඩිහිටි භික්ෂුවක් යම් කිසි විශේෂ සැළකිල්ලක් අනෙක් අයගෙන් ලබා ගැනීමට අනවශ්‍ය උත්සහයක් දරනු දුටු විට උන්වහන්සේ පැවසුවේ:

"ඔබට මෙතරම් සුළු දෙයක් ඉවසන්න බැරිද? ඔබට මෙච්චර දෙයක් ඉවසන්න බැරි නම් තණ්හාවයි කෙලෙසුයි පරාජය කරන්නේ කොහොමද?" කියායි.

40. පිරිසිදු වචනය

අතුලෝ හිමියො වචනයෙන් ඉතා පිරිසිදු වූහ. උන්වහන්සේ කතා කළේ ප්‍රයෝජනවත් දෙයක් පමණි. තමුන්ගේ වචන වලින් උන්වහන්සේ කිසිවිටෙක තමන්ට හෝ වෙන කෙනෙකුට හිංසාවක් කළේ නැත. වෙන අය විවේචනය කරනවා ඇසීමේ අරමුණින් ඇතැම් අය උන්වහන්සේට ඇම දී, පෙළඹවීමට උත්සහ කළත් උන්වහන්සේ හසු වූයේ නැත.

උන්වහන්සේ හමුවීමට පැමිණි මිනිසුන් මෙවැනි ප්‍රකාශ කළ අවස්ථා බොහෝ විය: "ස්වාමීනි, ඇයි අපේ රටේ සුපතල සමහර ධර්මදේශකයන් වහන්සේලා අනෙක් අයට පහර දීමට කැමති? නැතිනම් සමාජය හෙලා දකින්නේ? නැතිනම් වෙන වැඩිහිටි භික්ෂූන් වහන්සේලා විවේචනය කරන්නේ? ඔබ මට ගෙවීමක් කළත් මට නම් ඒ වගේ හාමුදුරුවරුන්ට ගෞරව දක්වන්න බෑ."

අතුලෝ හිමියො එවිට මෙලෙස පිළිතුරු දෙති:

"ඒක ඒ අයගේ දැනුමේ මට්ටමයි, අවබෝධයේ මට්ටමයි. ඒ අයගේ දැනුමේ මට්ටමට අනුරූපව කටට ගලාගෙන එන දේ ඒ අය කියනවා. ඒ අයට ගෞරව දක්වන්න කියලා කවුරුවත් ඔබට ගෙවන්නේ නෑ. ඔබට ඒ අයට ගෞරව දක්වන්න අවශ්‍ය නැත්නම් ගෞරව නොදක්වා ඉන්න. ඒ අය ඒක ගණන් ගන්න එකක් නෑ."

41. භූතයින් ගොදුරු කර ගන්නා භික්ෂූන්

සාමාන්‍යයෙන් අතුලෝ හිමියෝ භික්ෂූන් හා සාමණේරවරු භාවනා වැඩීම සඳහා වනගත වීමටත්, ධූතාංග වැඩීමටත් උනන්දු කරවීමට කැමති වූහ. වරෙක උන්වහන්සේගේ නවක හා වැඩිහිටි බොහෝ ශිෂ්‍යයන් එක් රැස් වූ අවස්ථාවක පුහුණුව ඉක්මන් කරවීමට ඔවුන්ව ඝන වනාන්තරයේ විවේකය සෙවීමටත්, ගල්ලෙන් හා කඳුවල ජීවත්වීමටත් උනන්දු කරවූහ. එලෙස ජීවත් වීමෙන් තමන්ගේම පහත් මානසික ගති වලින් නිදහස් වීමට ඔවුනට හැකි වේවි. එක් භික්ෂුවක් නොසැළකිල්ලෙන් මෙසේ කීය:

"මම නම් ස්වාමීනි, ඒ වගේ තැන් වලට යන්න ඉදිරිපත් වෙන්නේ නෑ. මට බයයි භූතයන් මාව ගොදුරු කර ගනීවි කියලා."

අතුලෝ හිමියන් ක්ෂණිකය පැවැසුවේ:

"හාමුදුරුවරු ගොදුරු කර ගන්න භූතයෙක් කවමදාක කොතැනක හෝ ඉඳලා තියෙනවද? භූතයින්ව ගොදුරු කර ගන්න හාමුදුරුවරු විතරයි ඉන්නේ. ඊට අමතරව ඔවුන් ඒකෙන් ලොකු නිෂ්පාදනත් කරනවා (සුර පිළිබඳවයි). හිතන්න මේ ගැන. ගිහි උදවිය අපට ගෙනත් දෙන සෑම දෙයක්ම පාහේ ගෙනත් දෙන්නේ ඔවුන්ගේ මියගිය ඥාතීන්ට පිං අනුමෝදන් කරන්නයි, ඒ අයගේ මියගිය දෙමාපියන්, ආච්චි, සීයා, සහෝදර සහෝදරියන් වෙනුවෙන්. ඉතින් භික්ෂූන් වහන්සේලා විදියට ඒවා ලැබීමට සුදුසු විදියට, ඊට ගැලපෙන විදියට අපි හැසිරෙනවාද? ඒ මිය ගිය ඥාතීන්ට පිං ලැබෙන විදියට දියුණු කරපු මොන මානසික ගුණාංගද අපට තියෙන්නේ? භූතයන් ගොදුරු කර ගන්නා භික්ෂුවක් නොවීමට ඔබ පරෙස්සම් වන්න."

42. හොඳයි, නමුත්...

වර්තමානයේ අළුත් ගුරුවරුන් හා අළුත් භාවනා මධ්‍යස්ථාන ගැන උද්යෝගිමත් වන භාවනාවේ යෙදෙන්නන් බොහෝ දෙනෙකි. යම් සේ ලොතරැයි ලෝලීන් ලොතරැයි අංක ගැන අනාවැකි කියන හාමුදුරුවරු ගැන උද්යෝගිමත් වන්නා සේ, නැතිනම් සුර ලෝලීන් බලවත් සුර හදන හාමුදුරුවරු ගැන උද්යෝගිමත් වන්නා සේ, විපස්සනා ගුරුවරුන් ගැන විපස්සනා ලෝලීන්ද උද්යෝගිමත් වෙති. මෙවැනි බොහෝ දෙනෙක් යම් ගුරුවරයෙක් ගැන ශ්‍රද්ධාව ඇති කරගත් පසු, අන් අයට වඩා ඒ ගුරුවරයාගේ ගුණ කියන අතර අනෙක් අයටද ඒ අදහස දරන ලෙස හා ඒ ගුරුවරයාට ගරු කරන ලෙස බල කර සිටිති. විශේෂයෙන් වර්තමානයේ තමන්ගේ දේශනා පටිගත කර රටපුරා විකුණන ප්‍රසිද්ධ දේශකයන් වහන්සේලා සිටිති. වරක් එක් කාන්තාවක් ප්‍රසිද්ධ දේශකයන් වහන්සේලාගේ දේශනා අඩංගු ටේප් පටි බොහෝ ගණනක් අතුලෝ හිමියන්ට ඇසීම සඳහා ගෙනාවාය. නමුත් උන්වහන්සේ ඒවා ඇසුවේ නැත. එක් හේතුවක් වූයේ උන්වහන්සේ උපන්තේකට කවමදාවත් රේඩියෝවක් හෝ ටේප් අසන යන්ත්‍රයක් තමන් වහන්සේ වෙත නොතිබීමයි. එහෙම දෙයක් තිබුනත් එය ක්‍රියාත්මක කිරීමට දැනුමක් උන්වහන්සේට තිබුණේ ද නැත. පසුව එක් අයෙක් ටේප් අසන යන්ත්‍රයක් ගෙනවිත් ඒ බොහෝ ටේප් පටි අතුලෝ හිමියන්ට අසන්නට සැලැස්සුවාය. ඉන්පසු ඇය ඒ ගැන උන්වහන්සේගේ අදහස් විමසා සිටියාය. උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ:

"හොඳයි. ඔහුට ලස්සනට තමාගේ අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්, වචන පාවිච්චියත් ඉහලයි, හැබැයි කිසිම හරයක් නැහැ. ඔබ දේශනාවක් අසන සෑම වාරයක ම දැනුම, පුහුණුව හා මාර්ගඵල ගැන රසයක් ඔබට ලබා ගත හැකි විය යුතුයි. එතකොටයි එහි හරයක් තියෙන්නේ."

43. ව්‍යාකූල වූ යෝගීන්

වර්තමානයේ භාවනාව ගැන උනන්දු වන බොහෝ දෙනෙක් නිවැරදි භාවනා ක්‍රමය ගැන බොහෝ ව්‍යාකූල හා සැක සහිත තත්වයකට පත් වී සිටිති. විශේෂයෙන් මෙය භාවනාවට නවකයින් වූවන් අතර දක්නට ලැබෙන අතර මීට හේතු වී ඇත්තේ භාවනා ගුරුවරුන් බොහෝ විට එකිනෙකට පරස්පර විරෝධී උපදෙස් දීමයි. වඩාත්ම නරක තත්වය නම් ඔවුන් සාධාරණ හා බාහිර ආකාරයට කාරණා විස්තර නොකොට අනෙක් භාවනා ගුරුවරු හා ක්‍රම නිවැරදි විය හැකි යැයි පිළිගැනීමට මැලිවීමයි. අනෙක් භාවනා ක්‍රම අවඥාවට ලක් කරන පුද්ගලයින්ද නැතිවාම නොවේ. මේ නිසා විවිධ සැක සංකා වලින් පෙලෙන බොහෝ දෙනෙකු අතුලෝ හිමියන් හමුවීමට පැමිණ මේ ගැන විමසූ විට උන්වහන්සේ මෙලෙස පිළිතුරු දෙනු මම බොහෝ විට අසා ඇත්තෙමි.

"ඔබ භාවනාව ආරම්භ කරන විට ඕනෑම ක්‍රමයකින් භාවනාව ආරම්භ කරන්න පුළුවන්. මොකද ඒ සියලු ක්‍රම යොමුවන්නේ එකම ප්‍රතිඵලයකටයි. භාවනා ක්‍රම බොහෝමයක් ඇති වීමට හේතුව මිනිසුන් විවිධ ගති ස්වභාවයෙන් යුක්ත වීමයි. මේ නිසයි පළමු පියවර ලෙස සිතට එක්තැන් වීමට හා තැන්පත් වීමට අරමුණක් ලෙස, විවිධ රූප සටහන් හෝ 'බුද්ධෝ' හෝ 'අරහං' වැනි වචන නැවත නැවත කීමට උපදෙස් දෙන්නේ. සිත එක්තැන් වී නැවතුනාම භාවනා වචනය නිකන්ම හැලිලා යාවි. අන්න එතකොටයි සියලුම භාවනා ක්‍රම එකම රසයකට, එකම මාර්ගයකට පිවිසෙන්නේ. වෙනත් වචන වලින් කියනවා නම් එතැන තියෙන්නේ එහි උත්තරීතර දෙය ලෙස ප්‍රඥාවත්, සාරය ලෙස විමුක්තියත් පමණයි."

44. සිතේ ස්වභාවය

අතුලෝ හිමියන් බැහැදැක ගෞරව කිරීමට පැමිණෙන සෑම කෙනෙක්ම පවසන එක් දෙයක් ඇත. එනම් ඔහු වයස අවුරුදු 100 පමණ වුව ද සම ඉතා කාන්තිමත් බවත්, නිරෝගී සෞඛ්‍යයෙන් පසුවන බවත්ය. උන්වහන්සේ සමඟ බොහෝ කලක් එකට ජීවත් වූ අප උන්වහන්සේගේ මුහුණ අඳුරු වෙනවා හෝ විඩාපත් බවක් හෝ වේදනාවෙන් හෝ නොසතුටෙන් මුහුණ හැකිලෙනවා හෝ දැක ඇත්තේ ඉතා කලාතුරකිනි. උන්වහන්සේට රෝග අඩු වූ අතර නිතරම යහපත් මනෝභාවයකින් විසූහ. කිසි විටෙක අවට සිදුවන දේවලින් කැළඹුනේ හෝ නින්දා-ප්‍රශංසා වලින් බලපෑමක් ඇති වූයේ හෝ නැත.

වරක් වැඩිහිටි භාවනායෝගී භික්ෂූන් වහන්සේලා එක් රැස් වූ අවස්ථාවක දුකට ඉහලින් ජීවත් වන කෙනෙකුගේ සාමාන්‍ය චිත්ත ස්වභාවය ගැන කතාවක් ඇති විය. ඒ අවස්ථාවේ අතුලෝ හිමියෝ මෙසේ පැවැසූහ.

"කනස්සලු නොවීම හා කිසිදෙයක නොඇලීම, ධර්මය පුහුණු කරන අයගේ චිත්ත විහරණය එයයි."

45. අළුත් ගුරුවරු සොයා යාම

අද සිටින භාවනා යෝගීන් වර්ග දෙකකට බෙදිය හැක. පලමු කොටස පුහුණුව පිළිබඳ මූලික මූලධර්මයන් ඉගෙන ගන්නා විට හෝ ගුරු උපදේශයන් ලැබ මාර්ගයට පිවිසුනු විට, තමාට හැකි උපරිම අයුරින් එම මාර්ගයේ ඉදිරියට යාමට උත්සුක වන අයයි. දෙවැනි කණ්ඩායම ගුරුවරුන්ගෙන් නිවැරදි උපදෙස් ලැබුණත් පුහුණුව පිළිබඳ නිවැරදි මූලධර්ම ඉගෙන ගත්තත් ඒ ගැන අවංකවම උනන්දු නොවන අයයි. ඔවුන්ගේ උත්සහය ලිහිල්ය. ඒ අතරම වෙනත් භාවනා මට්‍යස්ථාන වල වෙනත් ගුරුවරුන් සොයා යාමට උත්සුක වෙති. කොතැනක හෝ හොඳ මධ්‍යස්ථානයක් ඇතැයි ඇසූ විට එහි යති. වැඩිපුර සිටින්නේ මේ දෙවැනි කණ්ඩායමට අයත් අයයි.

වරක් අතුලෝ හිමියන් තම ශිෂ්‍යයන්ට මෙලෙස අවවාද කළහ.

"ඔබ භාවනා මධ්‍යස්ථාන බොහෝ ගණනකට යමින් බොහෝ ගුරුවරුන් යටතේ පුහුණු කළොත්, ඔබේ පුහුණුවෙන් ප්‍රතිඵල ලැබෙන්නේ නෑ. මොකද ඒක හරියට ආපහු ආපහු මුලට යනවා වගේ වැඩක් නිසා. ඔබේ පුහුණුවට ස්ථාවර පදනමක් ලැබෙන්නේ නෑ. සමහර විට ඔබ සැක සහිතව ව්‍යාකූල බවට පත්වන්නත් පුළුවන්. සිත ස්ථාවර වන්නේ නෑ. එවිට ඔබේ පුහුණුව පිරිහිලා දියුණුවක් නැති වී යනවා."

46. ගැලී සිටීම හා පසෙකින් තැබීම

අද සිටින ධර්මය පුහුණුවන්නන් හා ශිෂ්‍යයන් කොටස් දෙකකට බෙදිය හැක. පළමු කොටස නම් දුකින් මිදීම සඳහා අවංකවම පුහුණුවන හා ඉගෙන ගන්නා පිරිසයි. දෙවැනි කොටස ඉගෙන ගන්නේත් පුහුණු වන්නේත් තමා ලැබූ දේ ගැන පාරම්බෑමට හා දින ගණන් වාද කරමින් කල් මැරීමටයි. ඔවුන් සිතන්නේ බොහෝ පෙළ පාඨ කට පාඩම් කරගෙන සිටීම හා බොහෝ ගුරුවරුන් පැවැසූ දේ මතකයෙන් කීමට හැකි වීම වැදගත්කමේ ලකුණක් ලෙසයි. මේ දෙවැනි කොටසේ අය අතුලෝ හිමියන් හමුවීමට ආ විට ඔවුහු බොහෝ විට පුහුණුව සඳහා උපදෙස් නොවිමසා උන්වහන්සේ ඉදිරියේ තමුන්ගේ දැනුම හා මතවාද විස්තරාත්මකව ඉදිරිපත් කරති. එසේ වූ විට උන්වහන්සේ සෑම විටම ඔවුන්ට සාවදානව සවන් දුන්හ. ඔවුන්ගේ කතාව අවසන් වූ විට, ඊට තවත් දෙයක් උන්වහන්සේ එකතු කරති.

"පෙළ පොත් වල හා ගුරුවරු කෙරෙහි ගැලී සිටින අයට දුකින් මිදීමට පුළුවන් කමක් ලැබෙන්නේ නැහැ. ඒ වගේම පෙළ පොත් හා ගුරුවරුන් ඇසුරු නොකර දුකෙන් මිදෙන්නත් බෑ."

47. සිත එකඟ කරගත නොහැකි නම්

සමාධිය වඩන විට හැමෝටම එකම වේගයෙන් ප්‍රතිඵල නොලැබේ. සමහරුන්ට ඉක්මන් ප්‍රතිඵල ලැබෙන අතර අනෙක් අයට ප්‍රතිඵල ලැබෙන්නේ සෙමිනි. ඇතැමෙකුට චිත්ත සමාධියක් කිසිසේත්ම නොලැබෙන තරම්ය. එසේ වුවත් ඔවුන් මන්දෝත්සාහී නොවිය යුතුය. දානයට හෝ සීලයට වඩා චිත්ත භාවනාව පිනකි, කුසලයකි. අතුලෝ හිමියන්ගේ බොහෝ ශිෂ්‍යයෝ මෙසේ අසති: "මම බොහෝ කාලයක් සමාධිය වඩන්න උත්සහ කළා. නමුත් මගේ හිත එක තැනක නවතින්නෙ ම නැහැ. නිතරම බැහැරට යනවා. මට පුහුණු වෙන්න පුළුවන් තව විදියක් තියෙනවාද?"

අතුලෝ හිමියො ඇතැම් විට මේ අනෙක් විදිය කියා දෙති:

"සිත එක තැනක නතර වන්නේ නැත්නම් අඩුම ගණනේ එය ගොඩක් ඈතට නොයන බවට වග බලාගන්න. කයෙහි ම සිත පිහිටුවා ගන්න. සතිය භාවිතා කරන්න. අනිත්‍ය දුක්ඛ අනාත්මතාව සිහි කරන්න. අසුභ සංඥාව වඩන්න. එහි අසාර බව දකින්න. සිත මේ ආකාරයට පැහැදිලිව දකින විට කළකිරීම (නිබ්බිදාව), නොඇල්ම හා උපේක්ෂාව මතු වේවි. මෙයත් පඤ්ච උපාදානස්කන්ධයන් පසාරු කරගෙන යාවි."

48. දහමේ සැබෑ පදනම

භාවනා යෝගීන් කතා කරන්න බොහෝම කැමති දෙයක් ඇත. එය නම් "භාවනා කරන කොට ඔබට මොනවද පෙනෙන්නේ? ඔබට දර්ශනය වන්නේ කුමක්ද?" යන්නයි. එසේත් නැතිනම් තමන් බොහෝ වේලාවක් භාවනා කළ මුත් කිසිම දෙයක් නොදුටු බවට පැමිණිලි කරති. එසේත් නැති නම් ඔවුහු හැමතිස්සේම තමන් දුටු අර දෙය හෝ මේ දෙය ගැන කතා කරමින් කාලය ගත කරති. මේ නිසා ඇතැමෙක් භාවනා කරන විට තමන් කැමති දේ දැකිය යුතුය යන වැරදි අවබෝධයට, නිගමනයට එළඹෙති.

අතුලෝ හිමියන් මෙවැනි අයට අනතුරු අඟවන්නේ මෙවැනි බලාපොරොත්තු වැරදි මාර්ගය බවත්, භාවනාවේ අරමුණ ධර්මයේ සැබෑ පදනමට පැමිණීම බවත් පවසමිනි.

"ධර්මයේ සැබෑ පදනම සිතයි. එම නිසා සිත දෙසම බැලීමට යොමුවන්න. තමුන්ගේ සිත විනිවිද දකින තුරු එහි යෙදෙන්න. ඔබ ඔබේ සිත පරිපූර්ණ ලෙස අවබෝධ කළේ නම් එපමණකින්ම ඔබ ධර්මයේ පදනමට පැමිණ තිබෙනවා."

49. ප්‍රමාද නොවීමට අවවාදයක්

තමාගේ ගෝල භික්ෂූන්ගේ හා සාමණේරවරුන්ගේ ප්‍රමාදය හා නොසැළකිල්ල නැති කිරීමට අතුලෝ හිමියෝ තදින් තරවටු කිරීමට තියුණු ක්‍රම යොදා ගත්හ.

"ගිහි උදවිය බොහෝ දුෂ්කරතා මැද්දේ තමන්ගේ රැකියාවල බොහෝ මහන්සි වී යෙදෙන්නේ තමන්ගේ පවුල රැක බලා ගන්න, දරු මුණුබුරන් රැකබලා ගන්න, අවශ්‍ය බඩු මුට්ටු, මුදල් හා ආහාර ලබාගන්න. ඒ අය කොතරම් මහන්සි වුවත්, කොතරම් විඩාපත් වුනත්, ඒ අයට දිගටම වෙහෙස වෙන්න සිදුවෙනවා. ඒ අතරම ඔවුනට පිං ලබා ගන්නත් වුවමානායි. ඒ නිසයි තමන් හරිහම්බ කරන දෙයින් කොටසක් පින්කම් වලට කැප කරන්නේ. ඒ අය උදේ පාන්දරින් නැගිටලා ප්‍රණීත කෑම පිළියෙල කරනවා අපේ පාත්තර වලට දමන්න. ඒවා අපේ පාත්තර වල තැන්පත් කරන්න කලින් හිස් මුදුනට ඔසවලා ප්‍රාර්ථනයක් කරනවා. පාත්තරේට ආහාර දැමූ පසු පිටුපසට ගොස් දණ ගසා වඳිනවා. ඒ අය මෙලෙස කරන්නේ අපේ පුහුණුවට උදව් කර පිං ලබා ගන්නයි.

ඉතින් ඒ අයට දෙන්න අපේ පුහුණුවේ පිනක් තියෙනවද? ඒ දෙන ආහාර පිළිඅරගෙන කන්න තරම් සුදුසු කමක් ලැබෙන විදියට ඔබ හැසිරිලා තියෙනවද?"

50. ඇතැම් විට දැඩි විය

අජාන් සම්රෙත් කුඩා වියේ පැවිදිව අවුරුදු 60ක් පමණ වනතුරු පැවිදි දිවියක් ගත කළේය. ඔහු භාවනා ගුරුවරයෙකුව, දැඩි ප්‍රතිපත්ති ඇතිව, හොඳ කීර්තිරාවයක් දිනා බොහෝ දෙනාගේ ගෞරවය දිනා සිටියේය. නමුත් ඔහුට ගමන සම්පූර්ණ කිරීමට නොහැකි විය. ඔහු දායකයෙකුගේ දුවක් කෙරෙහි පෙමින් වෙළුනු නිසා ඔහුගේ සිත පිරිහිණි. මේ නිසා උපැවිදි වී විවාහ වීමට අතුලෝ හිමියන්ගෙන් සමුගැනීමට පැමිණියේය.

බොහෝ දෙනෙක් මේ ආරංචියෙන් කම්පා වූ අතර, ඔහුගේ පුහුණුව ගැන සිතා එය විය හැකි දෙයකැයි විශ්වාස නොකළහ. මරණය තෙක් භාවනායෝගී දිවිපෙවතක් ගෙවනු ඇතැයි ඔවුහු අපේක්ෂා කළහ. ඒ ආරංචිය සැබෑ නම් එය භාවනායෝගී සමාජයට තදබල පහරක් වේවි. මේ නිසා වැඩිහිටි භික්ෂූන් වහන්සේලාත් උන්වහන්සේගේ ශිෂ්‍යයොත් ඔහුගේ අදහස වෙනස් කර උපැවිදි වීම වැළැක්වීමට ඔවුනට කළ හැකි සෑම දෙයක්ම කළහ. විශේෂයෙන්ම අතුලෝ හිමියන් ඔහු කැඳවා ඒ අදහස වෙනස් කරවීමට කතා කළ නමුත් එය සඵල නොවීය. අවසානයේ අජාන් සම්රෙත් මෙසේ කීහ: "මට පැවිද්දේ ඉන්න බෑ. මම භාවනාවට ඉඳගත් සෑම වෙලාවකම පෙනෙන්නේ මා ඉදිරියේ පාවෙන ඇගේ මුහුණ විතරයි."

අතුලෝ හිමියෝ බොහෝ සැරෙන් මෙසේ පැවැසූහ:

"ඒකට හේතුව ඔබ ඔබේ සිත ගැන භාවනා නොකිරීමයි. ඔබ භාවනා කරන්නේ ඇගේ පස්ස පැත්ත ගැනයි. ඉතින් පස්ස පැත්තම පේන එක අහන්න දෙයක්යැ. යනවා යන්න මෙතනින්! ගිහින් කැමති දෙයක් කර ගන්නවා!"

51. නියම මඟින් බැහැර නොවීම

මා අතුලෝ හිමියන්ගේ කුදු මහත් කටයුතු කරමින්, උන්වහන්සේගේ අවසන් මොහොත දක්වා අවුරුදු තිහක පමණ කාලයක් උපස්ථාන කළෙමි. මා දුටු දෙයක් නම් උන්වහන්සේගේ ක්‍රියා පිළිවෙත හැම විටම ධර්ම විනයට අනුකූලව පැවැතීම හා දුක කෙලවර කිරීමේ මාර්ගයට අනුකූලව පැවැතීමයි. යන්ත්‍ර මන්ත්‍ර හෝ සුර හෝ වෙනත් සැක සහිත කිසිදු හෝ මිත්‍යා දෙයක යෙදී මාර්ග යෙන් බැහැර නොවූහ. මිනිසුන් තමාගේ හිසට පිඹ ආශිර්වාද කරන ලෙස කී විට "ඇයි මම ඔයාගේ ඔලුවට පිඹින්නේ?"යැයි විමසූහ. තමුන්ගේ වාහනයේ ශුභ ලකුණක් යොදන ලෙස ඉල්ලූ විට "මොකටද ශුභ ලකුණක් දාන්නේ?"යැයි විමසූහ. වැඩ කටයුත්තක් ඇරඹීමට ශුභ දිනයක් හෝ මාසයක් පවසන ලෙස ඉල්ලූ විට "හැම දවසම හොඳ"යැයි පැවැසූහ. උන්වහන්සේ බුලත් සපන විට මිනිසුන් හපය ඉල්ලූ විට මෙසේ පැවැසූහ.

"ඔබට මොකටද ඒක? ඒක ජරාවක්නේ."

52. කයේ සෙලවීමක් පමණයි

අතුලෝ හිමියන් කිරීමට උනන්දුවක් නැති දේ උන්වහන්සේ ලවා කරවීමට ක්‍රියාකල පිරිසේ කොටස්කාරයෙකු වී මා විසින් උන්වහන්සේට වරදක් කළේ යැයි පසුතැවිලි වූ අවස්ථා තිබුණි. ඉන් පළමු අවස්ථාව නම් සකොන් නඛෝන් පලාතේ පා සුත්ථාවාත් ආරාමයේ අජාන් මන් කෞතුකාගාරය විවෘත කිරීමේ උත්සවයට උන්වහන්සේ සහභාගී වූ අවස්ථාවයි. එදින තම ගුරුවරුන් වෙතට ගොස් ගෞරව දැක්වීමටත්, යම් යම් උදව් ලබා ගැනීමටත් බොහෝ භාවනා ගුරුවරුන් හා ගිහි පින්වතුන් පැමිණ සිටියහ. බොහෝ මිනිසුන් අතුලෝ හිමියන්ගෙන් තමන්ගේ හිසට පිඹින ලෙස ඉල්ලා සිටියහ. නමුත් උන්වහන්සේ ප්‍රතිචාරයක් නොදක්වා පාඩුවේ සිටින විට "කරදරෙන් බේරෙන්න එය කරන්නැ"යි මම අයැද සිටියෙමි. ඉන්පසුව උන්වහන්සේ ඔවුන්ගේ හිස් වලට පිම්ඹහ. බේරෙන්න බැරිම තැන ඔවුන්ගේ වාහන වල ශුභ ලකුණු යෙදූහ. සුර ඉල්ලා කරන කරදර වල ඉවරයක් නැති වූ තැන තමන්ගේ නමින් සුර සාදා ගැනීමට අවසර දුන්හ. උන්වහන්සේට ඔවුන් ගැන අනුකම්පාවක් ඇති වූ විට වන්දනාවේ දී 'ජයග්‍රහනයේ' ඉටිපන්දම දැල්වීමටත්, සුර වලට ආශිර්වාද කිරීමේ උත්සව වලටත් සහභාගී වූහ. පසුව උන්වහන්සේ මෙලෙස කී විට මට දැනුනේ නොමඳ සහනයකි:

"මාගේ මේ ක්‍රියා සමාජ සම්මුතියට අනුව සිදු කරන බාහිර කායික සෙලවීමක් පමණයි. එහෙම නැතිව කොහෙත්ම උපතකට යාමට හෝ භව පැවැත්මකට යාමට හෝ මාර්ගඵල නිවන් ලැබීමට හෝ කරන මානසික සෙලවීමක් නොවේ."

53. අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න

"84,000ක් ධර්මස්කන්ධයම මිනිසුන් සිත දෙස බැලීමට යොමු කිරීවීම සඳහා තියෙන උපක්‍රම විතරයි. බුදු දහමේ ඉගැන්වීම් ගොඩක් තියෙන්නේ මිනිසුන්ගේ කෙලෙස් විවිධ නිසා, නමුත් දුක් කෙළවර කරන්න තියෙන්නේ එක විදියයි. එනම් නිවනයි. ධර්මය නිවැරදිව පුරුදු කරන්න අපිට මේ ලැබිල තියෙන්නේ ඉතාම දුර්ලභ අවස්ථාවක්. අපි මේ අවස්ථාව ගිලිහී යන්න ඉඩ හැරියොත් අපිට මේ ජීවිත කාලයේ විමුක්තිය ලබා ගන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. නැවත මේ ධර්මය ම මුන ගැසෙන්න පෙර ඉතාම දිගු කාලයක් මිත්‍යාදෘෂ්ඨි වල අතරමං වෙලා ඉන්න වෙනවා. ඉතින් දැන් අපට බුදු දහම හමු වෙලා තියෙන එකේ අපි ප්‍රමාද නොවී විමුක්තිය ලැබීමට කටයුතු කළ යුතුයි. එහෙම නැති වුනොත් මේ වටිනා අවස්ථාව මඟ හැරේවි. චතුරාර්ය සත්‍යය අමතක වී ගිය පසු ඉතා දිගු කාලයකට විශාල දුක් කඳක් සමඟ අන්ධකාරය මිනිසුන් වසා ගනීවි."

54. විද්‍යාවේ සීමා

අතුලෝ හිමියන් ඉගැන්වීම සඳහා උපමා යොදා ගත්තේ වරක් දෙවරක් නොවේ. වරක් උන්වහන්සේ මෙසේ පැවැසූහ.

"බාහිර ප්‍රඥාව කියන්නේ සිතුවිලි වල ප්‍රඥාවටයි. එයට බෑ සිතට නිවන් අවබෝධ කර දීමට. ඔබට නිවනට යාමට අවශ්‍ය නම් ආර්ය මාර්ගය පිළිබඳව වූ ප්‍රඥාව මත රැඳිය යුතුයි. අයින්ස්ටයින් වැනි විද්‍යාඥයින්ගේ ඥානය බොහෝ පුළුල් මෙන්ම බොහෝ හැකියා වලින්ද යුක්තයි. එයට කුඩාම පරමානුවක් බිඳ සතරවන මානයකට යා හැකියි. නමුත් අයින්ස්ටයින්ට නිවන ගැන අවබෝධයක් තිබුණේ නෑ. ඒ නිසයි ඔහුට නිවන් දකින්න බැරිවුනේ.

ආර්ය මාර්ගය ගැන අවබෝධය ලැබූ සිතකට විතරයි සැබෑ බෝධියට, සම්බෝධියට, පූර්ණ බෝධියට අපව ගෙන යා හැක්කේ. දුකෙන් විමුක්තිය ලබා නිවනට ගෙන යා හැක්කේ එවැනි සිතකට පමණයි."

55. දුක නැති කිරීම

1977 වසරේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යංශයේ ඉහල නිලධාරීන්ට නොයෙක් ගැහැට විඳින්නට සිදු වූ වසරකි. ධනය අහිමි වීම, නිලතල අහිමි වීම, විවේචන හා දුක ඊට අයත් විය. නොවැළැක්විය හැකි ලෙස දුක හා කනගාටුව අඹු දරුවන්ටද බලපෑවේය. දිනක් ඔවුන්ගේ බිරින්දෑවරු පිරිසක් අතුලෝ හිමියන් බැහැ දැක ගෞරව දක්වා තම දුක් ගැනවිල්ල ඉදිරිපත් කළේ එම දුකෙන් මිදීම සඳහා උපදෙසක් බලාපොරොත්තුවෙනි. උන්වහන්සේ මෙසේ පැවැසූහ.

"ශරීරයට බාහිර වූ, ඉක්ම ගිය, අතීතයට ගිය දේ ගැන ශෝක නොකළ යුතුයි. මොකද ඒ දේවල් ඒවාට අයත් කටයුත්ත නිවැරදිව හා පරිපූර්ණව සිදු කර අවසන්."

56. සත්‍යය හැමවිටම එකයි

උගත් මිනිසුන් බොහෝ දෙනෙක් පවසා ඇත්තේ අතුලෝ හිමියන්ගේ ඉගැන්වීම් සෙන් හා පදනම් සූත්‍රයේ (Platform sutra) ඉගැන්වීම් හා සමාන බවක් පෙන්වන බවයි. මා මේ ගැන බොහෝ වාරයක් ඇසීමෙන් පසු අවසානයේ උන්වහන්සේ මෙසේ පැවසූහ.

"ධර්මයේ තියෙන සත්‍යතාව හැම විටම ලෝකයේ දකින්නට තියෙනවා. බුදුරජාණන් වහන්සේ බුදු වූ පසු මේ සත්‍යය ලෝකයාට උගන්වපු එකයි කළේ. සත්ත්වයන්ට ගොරෝසු හෝ සියුම් නොයෙක් නැඹුරුතා තියෙන නිසා උන්වහන්සේ බොහෝ වචන පාවිච්චි කළා. ධර්මස්කන්ධ 84,000ක්, නුවණැති මිනිසුන් විසින්, සත්‍යය සොයන මිනිසුන්ට සත්‍යය කියා දෙන්න ගියාම ඒ සත්‍යය විස්තර කිරීමට ගැලපෙනම වචන තෝරා ගන්න වෙන්නේ වචන ගැන කරදර නොවී, පොතේ තියෙන වචන වලවත් පොඩ්ඩක්වත් නොබැඳී, අර්ථය වඩාත් නිවැරදි හා පරිපූර්ණ වන ආකාරයේ සත්‍යයේ ක්‍රම පාවිච්චි කරලයි."

57. ගැඹුරු භාවනාව

කෝක්මෝන් ආරණ්‍ය සේනාසනයේ අජාන් බේට් සමාධි භාවනාව පිළිබඳව අතුලෝ හිමියන් සමඟ සාකච්ඡා කිරීමට පැමිණ මෙසේ විමසූහ. "මම බොහෝ කල් සිට සමාධිය වඩනවා. මට දැන් බොහෝ වේලාවක් අර්පණා සමාධියට සමවැදී ඉන්න පුළුවන්. භාවනාවෙන් නැගිට්ටට පස්සෙත් සමහර දවස් වලට බොහෝ වේලාවක් යනකම් ප්‍රීතිමත් සුඛයක් දැනෙනවා. සමහර වෙලාවට තද ආලෝකයක් තිබෙන බවක් දැනෙනවා. කය ගැනත් මට හොඳින්ම අවබෝධ වෙලයි තියෙන්නේ. ඊළඟට මම කළ යුතු යමක් තියෙනවද?"

අතුලෝ හිමියන් මෙසේ පිළිතුරු දුන්හඃ

"ඒ අර්පණා සමාධියේ බලය හිත පිරික්සන්න යොදා ගන්න. ඊට පස්සේ කිසිවක්ම ඉතිරි නොවන සේ සිතේ පැලපැදියම් වූ සිතුවිලි සියල්ල අතහැර දමන්න."

58. සුඤ්ඤතාව

පසුව දවසක අජාන් බේට් තවත් භික්ෂූන් දෙනමක් හා විශාල ගිහි පිරිසක් සමඟ අතුලෝ හිමියන්ට ගෞරව දැක්වීමට පැමිණියහ. අතුලෝ හිමියන් අළුතින් පැමිණි පිරිසට භාවනාව පිළිබඳව උපදෙස් දුන් පසු අජාන් බේට් තමාට පෙර දිනක දුන් උපදෙස පිළිබඳව වැඩිදුරටත් විමසා සිටියහ: "සියළුම අරමුණු අතහරින එක මට කරන්න පුළුවන් සුළු කාලයකට පමණයි. මට ඒ විදියට දිගු කාලයක් ඉන්න බැහැ."

අතුලෝ හිමියන් මෙසේ පැවැසූහ:

"ඔබ සුළු කාලයකට සියළු අරමුණු අතහැරියත්, ඔබ සියුම් ලෙස සිත නිරීක්ෂණය කළේ නැත්නම් හෝ සතිමත් බව හොඳින් වැඩී නැත්නම්, ඇත්තටම ඔබ කරන්නේ ගොරෝසු අරමුණක් අතහැර සියුම් අරමුණක් අල්ල ගන්න එක වෙන්න පුළුවන්. ඒ හින්දා ඔබ සියළුම සිතුවිලි නතර කොට සිත සුඤ්ඤතාවේ තැන්පත් වන්න ඉඩ හරින්න."

59. නොපැහැදිලි තැනක්

වරක් කෙනෙක් මෙසේ ඇසීය: "මම ඔබ වහන්සේගේ චරිතාපදානයේ තිබෙනවා දැක්කා, ඔබ වහන්සේ චාරිකාවේ යෙදෙන අතරතුර සිත කෙලෙස් සමඟ එකතුවීමත්, කෙලෙස් සිත සමඟ එකතු වීමත් යන සංසිද්ධිය ගැන හොඳ අවබෝධයකට පැමිණියා කියලා. එහි තේරුම කුමක්ද?"

අතුලෝ හිමියෝ මෙසේ පිළිතුරු දුන්හ:
"සිත කෙලෙස් සමඟ එකතු වීම කියලා කියන්නේ බාහිර දේවල් වල පැවැත්මක් ඇති කිරීමට සිත සිතුවිලි වලට, ක්‍රියාවට, වචනයට, බල කිරීමයි. ඒවා හොඳ දේවල් කරනවා, නරක දේවල් කරනවා, කර්ම විපාක වලට පාර කපනවා. ඊට පස්සේ එය මගේ, ඒ මමය, ඒ මාගේ ආත්මයයි, එය අනුන්ගේ කියලා ඒවායේ එල්බ ගන්නවා. කෙලෙස් සිත සමඟ එකතු වෙනවා කියන්නේ බාහිර දේවල් ඒවායේ ශක්තියෙන් සිත ඒවායේ බලපෑමට යටත් කර ගැනීමටයි. එයට ආත්මයක් තියෙනවා කියන අදහසේ සිත තදින් අලවා, සත්‍යයෙන් බැහැර වන නොයෙක් උපකල්පන ගොඩනැඟීමට සැලැස්වීමටත්ය."

60. පොතේ දැනුම හා ප්‍රායෝගිකව ලත් දැනුම

වරක් කෙනෙක් මෙසේ ඇසීය: "සීල සමාධි ප්‍රඥා විමුක්ති පිළිබඳව මා පොත පතින් හා නොයෙක් අජාන්වරුන්ගෙන් අසා ගෙන මතක තබා ගත් කරුණු, ඔබ වහන්සේ ඒවායේ සාරය ලෙස අවබෝධ කරගත් කරුණු සමඟ ගැලපෙනවද?"

අතුලෝ හිමියන් මෙලෙස පිළිතුරු දුන්හ:

"සීලය කියන්නේ වැරදි වලින් තොර සිතෙහි සාමාන්‍ය ස්වභාවයයි. ඒ කවර ආකාරයේ හෝ වරදක් කිරීමට එරෙහිව සන්නාහ සන්නද්ධ වූ සිතයි. ඒ සීලය දිගටම පවත්වා ගැනීමෙන් ලැබෙන ප්‍රතිඵලය සමාධියයි. ඒ කියන්නේ දෘඪ වූ, නිසල බව ශක්තිය කර ගෙන ඊළඟ තත්වයට ඔසවන සිතයි. ප්‍රඥාව - 'දන්නා දෙය' - කියන්නේ හිස්, සැහැල්ලු, සැනසිලි සහගත, ඇති දේ ඇති සැටියෙන් විනිවිද පැහැදිලිව දකින සිතයි. ඒ සුඤ්ඤතාවයෙන් සුඤ්ඤතාවයට යන සිත විමුක්තියයි. ඒ කියන්නේ එම සැනසිලි සහගත තත්වයත් අතහැර, කිසිවක් නැති, කිසිදු වූ සිතුවිල්ලක් ඉතිරි නොවූ පූර්ණ ශූන්‍ය තත්වයකට පත් වීමයි."

61. සිතුවිලි ඇති වන විට

වරක් කෙනෙක් මෙසේ පැවැසීය. "මා සිත නිශ්චල භාවයට ගෙනා විට, එය නිශ්චල භාවයේ තදින්ම තියාගන්න මා උත්සහ ගන්නවා. නමුත් සිතට අරමුණක් හෝ සිතුවිල්ලක් ආ විට මා පවත්වාගන්න උත්සහ ගන්න තත්වය නැති වෙලා යන්න පටන් ගන්නවා."

අතුලෝ හිමියන් මෙලෙස පිළිතුරු දුන්හ:

"ඒක එහෙම නම් එයින් පෙන්නුම් කරන්නේ ඔබේ සමාධිය දුර්වල බවයි. මේ සිතුවිලි බොහෝ ශක්තිමත් නම්, විශේෂයෙන්ම ඒවා ඔබේ දුර්වල ස්ථාන ඇසුරු කොට ගෙන ඇතිවන්නේ නම්, ඔබට ඒවා සමඟ ඔට්ටු වෙන්න සිදු වන්නේ විදර්ශනා ක්‍රම වලින්. ගොරෝසු ස්වභාවික සංසිද්ධිය වන මේ කය ගැන සිත යොමු කරන්න. සවිස්තරාත්මකව එය විශ්ලේෂණය කරන්න. කය සම්පූර්ණයෙන්ම අවබෝධ වන තුරු අනුපස්සනා කළ පසු, මානසික සංසිද්ධි අනුපස්සනා කරන්න යොමුවන්න. ඒ කියන්නේ සියලුම දේ, ඔබ විසින් විශ්ලේෂණය කර ඇති සියළුම දේ, යුගල වශයෙන්, උදාහරණයක් ලෙස කළු - සුදු, ආලෝකය - අඳුර ආදී ලෙස අනුපස්සනා කරන්න."

62. නිර්මාංශ ප්‍රශ්ණයක්

වස් කාලයකට පෙර භික්ෂු පිරිසක් පැමිණියේ අතුලෝ හිමියන්ට ගෞරව දැක්වීමටයි. ඉන් එක් අයෙක් මෙසේ පැවැසීය. "මම බොහෝ කාලයක් තිස්සේ භාවනා කරනවා. දැන් මට යම් සමාධියක් තියෙනවා. නමුත් මට මස් කෑම පිළිබඳව ප්‍රශ්ණයක් තියෙනවා. මට මස් වර්ගයක් දැකපු පමණින් ඒක අයත් වූ සතා ගැන දුකක් ඇතිවෙනවා. මට ආහාරයක් වීමට උගට ජීවිතය පූජා කරන්න වුනා නේද කියලා හිතෙනවා. මට දැනෙන්නේ මං ළඟ කරුණාවක් නෑ වගේ. මම ඒ විදියට පසුතැවිලි වන්න ගත්තම සිත සමාහිත කරගන්න එක දුෂ්කර වෙනවා."

අතුලෝ හිමියන් මෙසේ පිළිතුරු දුන්හ:

"භික්ෂූන් සතර පරිෂ්කාර පාවිච්චි කරන කොට පළමුව ප්‍රත්‍යවේක්ෂා කළ යුතුයි. එහෙම ප්‍රත්‍යවේක්ෂා කරන විට මස් වැළඳීම පීඩාවක් විදියට, සතුන් කෙරෙහි කරුණාව නොදැක්වීමක් ලෙස දකිනවා නම් ඔහු මස් කෑමෙන් වැළකී නිර්මාංශ ආහාර වේලක් ගත යුතුයි."

63. නිර්මාංශ ප්‍රශ්ණය ගැන තවත් දේ

ඉන් මාස තුන හතරකට පසු වස් කාලය අවසානයේ එම භික්ෂු පිරිස නැවත අතුලෝ හිමියන්ට ගෞරව දක්වීමට පැමිණ මෙසේ පැවැසූහ: "වස් කාලය පුරාවට අපි ගත්තේ නිර්මාංශ ආහාර. නමුත් එය ඉතාම දුෂ්කර වුනා. අපි හිටපු ගමේ මිනිස්සු නිර්මාංශ ආහාර ගැන මොකුත් දනං හිටියේ නැහැ. ඒවා සපයා ගැනීමත් අපට දුෂ්කර වුනා. අපේ දායකයන්ටත් එය මහත් කරදරයක් උනා. සමහර හාමුදුරුවරු ඌනපෝෂනයට ලක් වුනා. තවත් සමහරුන්ට වස් කාලයවත් ගෙවා ගන්න බැරි වෙච්ච තරම්. අප කළ යුතුව තිබුණු තරමට භාවනාව වඩන්නත් අපට බැරි වුනා."

අතුලෝ හිමියන් මෙසේ පිළිතුරු දුන්හ:

"භික්ෂුවක් සතර පරිශ්කාර පාවිච්චි කරන කොට පළමුව ප්‍රත්‍යවේක්ෂා කළ යුතුයි. එහෙම ප්‍රත්‍යවේක්ෂා කරන කොට ඔහු තමා ඉදිරියේ ඇති ආහාර, එළවළු වේවා, මස් වේවා, මාළු වේවා, බත් වේවා, තුන් ආකාරයෙන් පිරිසිදු යැයි දන්නවා නම් (ත්‍රිකෝටි පාරිශුද්ධි බව), එනම් එම සතා තමාට දානය දීම සඳහා ම මැරුවයි කියලා දක්කේ නැත්නම්, ඇසුවේ නැත්නම්, සැකයක් ඇතිවුනේ නැත්නම්, ඒ වගේම ඒ ආහාර ලැබුනේ ධාර්මික විදියට නම්, දායකයන් ශ්‍රද්ධාවෙන් පූජා කළ දේ නම්, ඔහු විසින් ඒ ආහාර වැළඳිය යුතුයි. අපේ ගුරුවරු පුරුදු කළෙත් මෙහෙම තමයි."

64. නිර්මාංශ ප්‍රශ්ණය ගැන තව දුරටත්

1979 වර්ෂයේ තුන්වැනි මස අවපක්ෂයේ දෙවැනි දින අතුලෝ හිමියන් වැඩ සිටියේ ප්‍රකොන්චායි ආරණ්‍ය සේනාසනයේය. රාත්‍රී 8.00ත් පසුව එහෙ මෙහෙ ඇවිදිමින් ජනාකීර්ණ ස්ථාන අසල කුඩාරම් ගසාගෙන නැවතීමට ප්‍රිය කළ භික්ෂු පිරිසක් රාත්‍රිය ගත කිරීමට එහි වැඩියහ. අතුලෝ හිමියන්ට ගෞරව දැක්වීමෙන් පසු ඔවුනට තේරුණු හැටියට ඔවුන්ගේ පුහුණුවේ තිබූ සුවිශේෂීම දෙය ගැන කතා කළහ: "මස් කන අය සත්ත්ව ඝාතනයට රුකුල් දෙනවා. එළවළු විතරක් කන අය වැඩි කරුණාවක් පෙන්වනවා. ඒකට තියෙන සාක්ෂිය තමයි කෙනෙක් නිර්මාංශ වූ පසු සිත වඩාත් සිසිල් හා සාමකාමී වීම."

අතුලෝ හිමියන් මෙලෙස පැවැසූහ:

"ඒක බොහොම හොඳයි. ඔබලා නිර්මාංශ වෙච්ච එක බොහෝම හොඳයි. මම එය අගය කරනවා. මස් කන අය ගැන කියන්න තියෙන්නේ, ඒ මස් තුන් ආකාරයකින් පිරිසිදු නම්, එනම් එම සතා තමාට දානය දීම සඳහාම මැරුවයි කියලා දැක්කේ නැත්නම්, ඇසුවේ නැත්නම්, සැකයක් ඇති වුනේ නැත්නම්, ඒ මස ඔවුනට ලැබුනේ පිරිසිදු ධාර්මික විදියට නම්, ඒ මස වැළැඳීම කිසිම ආකාරයකින් ධර්ම විනයට විරුද්ධ නෑ. නමුත් ඔබ පවසනවා නම් ඔබේ සිත සිසිල් හා සාමකාමී වෙනවා කියලා, ඒක වෙන්නේ ධර්ම විනයට අනුකූලව නිවැරදි පුහුණුවේ යෙදීමෙන් ඇතිවන ශක්තිය නිසා. එය ඔබේ බඩේ තියෙන පරණ කෑම එක්ක හෝ අළුත් කෑම එක්ක හෝ කිසිම සම්බන්ධයක් නැහැ."

65. ව්‍යාපාර කටයුතු හා ධර්ම කටයුතු

ව්‍යාපාරිකයෝ පිරිසක් වරක් මෙසේ පැවැසූහ: "ව්‍යාපාරිකයන් විදියට අපේ කටයුතු තිබෙනවා, ඒ කියන්නේ සමහර විට අපිට අතිශයොක්තියෙන් කියන්න කරන්න වෙනවා, අධික ලාභ ගන්න වෙනවා. නමුත් අපි භාවනා කරන්න ගොඩක් කැමති. අපි දිනටමත් පටන්ගෙනයි තියෙන්නේ. නමුත් සමහරු අපට කියලා තියෙනවා අපේ ජීවන වෘත්තියත් එක්ක අපිට භාවනා කරන්න පුළුවන් කමක් නැහැ කියලා. ඒ අය කියනවා ලාභ ලබන්න විකුණන එක පවක් කියලා. ඔබ වහන්සේ මේ ගැන මොකද කියන්නේ?"

අතුලෝ හිමියන් මෙලෙස පැවැසූහ:

"ජීවත් වන්න අවශ්‍ය නිසා හැමෝටම රැකියාවක් අවශ්‍යයි. ඒ වගේම හැම රැකියාවකටම ඊට අදාල ප්‍රමිතියක් තියෙනවා නිවැරදි හා සුදුසු දෙය මෙකක්ද කියලා. ඔබ එම ප්‍රමිතීන් යහපත් විදියට අනුගමනය කරනවානම් එය පිං හෝ පව් නොවන මධ්‍යස්ථ ක්‍රියා විදියටයි ගැනෙන්නේ. ධර්ම පුහුණුව ගැන කියන්න තියෙන්නේ ඔබ එය කළ යුතු දෙයක් හැටියටයි. ධර්මය පුහුණු කරන අයට විතරයි ඕනෑම තත්වයක් යටතේ වැඩ කරන්න පුළුවන් කම ලැබෙන්නේ."

66. වැලලුනු අතීතය

අතුලෝ හිමියන් යොථාප්‍රාසිත් ආරණ්‍යය සේනාසනයේ වැඩවසන සමයේ වරක් විශාල භික්ෂු හා සාමණේර පිරිසක් උන්වහන්සේට ගෞරව දක්වීමට පැමිණියහ. ඔවුන් උන්වහන්සේගේ ධර්ම දේශනාවට සවන් දීමෙන් පසු, වයස් ගතව පැවිදි වූ නමුත් මනා සංවරයක් ඇති පූජ්‍ය තා ප්ලොයි හිමියො අතුලෝ හිමියන්ට මෙය කීහ:

"මම දැන් පැවිදිව සාමාන්‍යයෙන් දිගු කාලයක් වෙනවා. නමුත් මට තවම අතීතයට තිබෙන බැඳීම කපා දමන්න බැරිවුනා. මම මගේ සිත වර්තමානයේ තබා ගන්න කොච්චර උත්සහ කළත් සතිය අතපසු වී අතීතයට ලිස්සා යනවා. මට මෙය නවත්වා ගැනීමට වෙනත් ක්‍රමයක් කියා දෙන්න පුළුවන්ද?"

අතුලෝ හිමියන් මෙසේ කීහ:

"සිතට බාහිර සිතුවිලි දිගේ දුවන්න දෙන්න එපා. සතිය අතපසු වී ගියොත්, එය දැනගත් මොහොතේම, නැවතත් එය (සිත) ඇදලා ගන්න. හොඳ - නරක, සැප - දුක සිතුවිලි ඔස්සේ බලන්න යන්න සිතට ඉඩ දෙන්න එපා. ඒවට අනුකූල වෙන්නත් එපා, බලහත්කාරයෙන් ඒවා කපා දමන්න හදන්නත් එපා."

67. පුරුදු විදිය

1977 පමණ බැංකොක් නුවර ධම්මමොන්කොන් ආරාමයේ උත්සවයකට අතුලෝ හිමියන්ට ආරාධනා ලැබුණි. එම උත්සවය අතරතුර බුද්ධ ප්‍රතිමා හා සුර පූජ්‍යත්වයට පත් කිරීමේ උත්සවයක 'ආරක්‍ෂකයා' ලෙස අසුන් ගැනීමට උන්වහන්සේට ආරාධනා ලැබුණි. උත්සවයෙන් පසුව විවේක ගැනීම සඳහා බැහැර පිහිටි කුඩා කුටියකට උන්වහන්සේ වැඩම කළ අතර එහි දී බැංකොක් නුවර ඉගෙන ගන්නා උන්වහන්සේගේ ශිෂ්‍ය භික්‍ෂූන් විශාල පිරිසක් හමුවූහ. එක් භික්‍ෂුවක් පැවැසුවේ මීට පෙර කිසිදිනක අතුලෝ හිමියන් මෙවැනි උත්සවයකට සහභාගී වෙනවා තමන් දැක නැති බවත්, මෙය එවැනි ප්‍රථම උත්සවය විය හැකි යැයි තමා සිතන බවත් ය. ඉන්පසු තව දුරටත් විමසුවේ 'ආරක්ෂකයා' ලෙස අසුන් ගැනීම කෙසේ කළ යුතුද කියායි.

අතුලෝ හිමියන් මෙසේ පිළිතුරු දුන්හ.

"ආරක්‍ෂයා ලෙස හෝ ආශීර්වාද කිරීමකදී හෝ අසුන් ගන්නා විට අනෙක් අජාන් වරු කුමක් කරනවාදැයි කියන්න මම නම් දන්නේ නැහැ. මම නම් 'ආරක්‍ෂකයා' ලෙස අසුන් ගෙන සිටියෙත් පරණ පුරුදු විදියටම තමයි."

68. ''මට හොඳින් ඉගෙන ගන්න අවශ්‍යයයි''

වරක් එක්තරා ගැහැනු ළමයෙක් අතුලෝ හිමියන්ට මෙසේ පැවසුවාය. ''මට අපේ සීයා කියනවා ඇසුණා කාට හරි බුද්ධිමත් වෙන්නත් හොඳින් ඉගෙන ගන්නත් අවශ්‍ය නම් ඉස්සර වෙලා පර්යංක භාවනාවේ යෙදී සමාධිය වඩා සිත තැන්පත් කරගන්න අවශ්‍යයයි කියලා. මට බුද්ධිමත් වෙන්නත් හොඳින් ඉගෙන ගන්නත් අවශ්‍යයයි. ඉතින් මම භාවනා කරලා සිත තැන්පත් කරගන්න උත්සහ කරනවා. නමුත් සිතට පොඩ්ඩක්වත් තැන්පත් වෙන්න කැමැත්තක් නැහැ. සමහර වේලාවට සිත කලින්ටත් වඩා නොසන්සුන් වෙනවා. ඉතින් මේ විදිහට මගේ සිත තැන්පත් වෙන්නේ නැත්නම් මම කොහොමද හොඳින් ඉගෙන ගන්නේ'"

අතුලෝ හිමියන් මෙසේ පිළිතුරු දුන්හ.

''ඔබ පාඩම් කරන විට, පාඩම් කරන්නේ කුමක්ද කියලා දැනගන්න සිත යොමු කරන්න. එයම ප්‍රමාණවත් වේවි ඔබට හොඳින් අධ්‍යාපන කටයුතු වල යෙදෙන්න. සිත තැන්පත් නැති වේලාවට සිත තැන්පත් නැති බව දැනගන්න. ඔබට එය තැන්පත් කර ගන්න දැඩි වුවමනාවක් තියෙන නිසාමයි එය තැන්පත් නොවන්නේ. සන්සුන් විදියට භාවනා කරන්න. තමුන්ට උවමනා පරිදිම සිත තැන්පත් වන දිනයක් ඒවි.''

69. චාරිකා කිරීමේ අභිප්‍රාය

සමහර භික්ෂූ හා සාමනේරවරු වස් කාලයෙන් පසු කණ්ඩායම් ලෙස නොයෙක් තැන්වලට චාරිකාවේ යෑමට ප්‍රිය කරති. ඒ සඳහා උවමනා කළමනා රැස් කර ගැනීමේදී ඒ සෑම කෙනෙක්ම විශාල බඩු ගොඩක් රැස් කර ගන්නා අතර සම්පූර්ණ ධූතාංග ආම්පන්න කට්ටලයක්ද සකස් කර ගනිති. ඒ බොහෝ දෙනෙක් චාරිකාවේ යන්නේ විවේකය සොයාගෙන චාරිකාවේ යෑමේ පිළිවෙතින් බොහෝ වෙනස් වෙයි. උදාහරණයක් ලෙස ධූතාංග ආම්පන්න වලින් සැරසී වායුසමීකරණය කල සුඛෝපභෝගී බස්රථ වලින් යති. නැතිනම් සමාගම් කාර්යාලවල තම පැරණි මිතුරන් හමුවීමට යති. භාවනායෝගී භික්ෂුන් පිරිසක් මැද අතුලෝ හිමියන් වරක් මෙසේ පැවසුහ.

''තමුන් හොඳ පෙනුමැති චාරිකා භික්ෂුවක් ලෙස පෙන්වීම පොඩ්ඩක්වත් ගැලපෙන දෙයක් නොවේ. චාරිකාවේ යෑමේ අරමුණට එය පටහැණියි. ඔබ සෑම දෙනෙක්ම මේ ගැන හොඳින් සිතා බැලිය යුතුයි. භාවනා කරමින් චාරිකාවේ යෑමේ තියෙන්නේ එකම අරමුණයිඃ කෙලෙස් වලින් නිදහස් වීමට හිත හික්මවන එකයි, පිරිසිදු කරන එකයි. සිත අරන් යන්නේ නැතිව කයින් පමණක් භාවනා කරමින් චාරිකාවේ යෑම උසස් දෙයක් නොවෙයි.''

70. සිතුවිලි නතර කිරීම ගැන සිතුවිලි

භාවනා යෝගියෙක් වරක් මෙසේ කීය. ''ඔබ වහන්සේ උගන්වාපු දේට අනුකූලව මම හිතන එක නතර කරන්න උත්සාහ කරනවා. නමුත් ඒක කවදාවත් සාර්ථක වුනේ නැහැ. වඩාත් නරක දේ නම් මම දැන් ඉච්ඡාභංගත්වයටත් පත් වෙලා. මොළෙත් අවුල් වෙලා. ඒ වුනාට මට විශ්වාසයි ඔබ වහන්සේ උගන්වපු දේ වැරදි නැහැ කියලා. මම දැන් කුමක් කළ යුතුද කියලා උපදේශයක් ලබන්න කැමතියි.''

අතුලෝ හිමියන් මෙසේ පැවසූහ.

"එයින් පෙනෙන්නේ ඔබට මූලික කරුණ මග හැරුණු බවයි. ඔබට කියලා තියෙන්නේ හිතන එක නතර කරන්න කියලා. නමුත් ඔබ කරන එකම දෙය හිතන එක නතර කිරීම ගැන හිතන එකයි. ඉතින් කොහොමද සැබෑ නතර කිරීමකට පැමිණෙන්නේ? සිතීම නතර කිරීම ගැන තිබෙන ඔබේ අවිද්‍යාව සම්පූර්ණයෙන් නැති කර ගන්න. ඔබේ සිතුවිලි නතර කිරීම ගැන සිතුවිලි අතහැර දමන්න. එතකොට ප්‍රශ්ණෙ නිකම් ම විසඳේවි."

71. වෙනස් ප්‍රතිඵල

එකළොස්වන මාසයේ අවපක්ෂයේ දෙවැනි දින, එනම් සෑම වසරකම වස් පවාරණයෙන් දෙවැනි දින අතුලෝ හිමියන්ගේ උපන් දිනය යෙදේ. උන්වහන්සේගේ ශිෂ්‍යයෝ, ග්‍රන්ථධූර හා භාවනා කරන දොගොල්ලෝම, එදිනට උන්වහන්සේ බැහැ දැකීමට පැමිණ ගෞරව දක්වා පුහුණුව පිළිබඳ උපදෙස් පැතීමට හෝ වස්සාන කාලය තුළ පුහුණුවෙන් ලත් ප්‍රතිඵල වාර්තා කිරීමට හෝ කැමති වෙති. උන්වහන්සේ අපවත් වන තුරුම ඔවුන් විසින් මෙම සම්ප්‍රදාය අනුගමනය කරන ලදී. වරක් භාවනාව වැඩිය යුතු ආකාරය පිළිබඳව දීර්ඝ කරුණු දැක්වීමකින් පසු අතුලෝ හිමියෝ අවසානයට මෙම වචන ද එක් කළහ.

"කියවීමෙන් හා සවන් දීමෙන් ධර්මය ඉගෙනීම තුලින් ලැබෙන ප්‍රතිඵලය සංඥා හා සංකල්පයි. පුහුණුව තුලින් ධර්මය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රතිඵලය සිත තුල ඇතිවන සැබෑ ධර්ම මට්ටම්ය."

72. එකම තැනයි

පූජ්‍ය මහා තවීසුක් පාලි නවවැනි අවසන් ශ්‍රේණියේ විභාගය සමත් වූ අතුලෝ හිමියන්ගේ පළමු ශිෂ්‍යයාය. එම නිසා උන්වහන්සේගේ විභාග ජයග්‍රහණය සැමරීමට බුරපා ආරාමයේ අතුලෝ හිමියන්ගේ නමින් උත්සවයක් සංවිධානය කෙරුණි. මහා තවීසුක් හිමි අතුලෝ හිමියන්ට ගෞරව දක්වීමෙන් පසු, අතුලෝ හිමි උන්වහන්සේට කෙටි අවවාදයක් කළහ.

"නව වැනි පාලි ශ්‍රේණි විභාගය සමත්වීමට පුළුවන් වීමෙන් ඔබ කාර්යශීලී, ප්‍රමාණවත් බුද්ධියක් ඇති, ත්‍රිපිටකය ගැන විශාරදයෙක් බව පෙන්නුම් කරලා තියෙනවා. මෙයින් අධ්‍යාපන පාඨමාලාව අවසන් වූ බව සැළකෙනවා. නමුත් අධයාපනය ගැන පමණක් උනන්දු වීමෙන් දුකින් මිදීමට ලැබෙන්නේ නැහැ. ඔබ සිත හික්මවන පුහුණුව පිළිබඳවත් උනන්දු විය යුතුයි.

84,000ක් ධර්මස්කන්ධය ම ආවේ බුදුරජාණන් වහන්සේගේ සිතින්, සෑම දෙයක්ම එන්නේ සිතින්. ඔබට දැන ගැනීමට අවශ්‍ය ඕනෑම දෙයක් සිත තුලින් සොයාගන්න පුළුවන්."

73. ලෝකය සහ ධර්මය

1979 වසරේ මාර්තු 12 අතුලෝ හිමි සකෝන් නකොන් පලාතේ පූ පාන් කන්දේ පිහිටි ශ්‍රී කයෙව් ලෙන් ආරාමයට වැඩියේ දින දහයක හුදකලා කාලයක් හා විවේකය සඳහා ය. අවසන් දින සවස උන්වහන්සේ පිටව යාමට පෙර අජාන් සුවත් හිමි අනෙක් භික්ෂූන් හා සාමනේරවරුන් සමඟ පැමිණියේ ගෞරව දැක්වීමටයි.

අතුලෝ හිමි මෙසේ ප්‍රකාශ කළහ.

"මෙතැන විවේක ගැනීම හරිම සුව පහසුයි. වාතයත් පිරිසිදුයි. භාවනාවත් පහසුයි. එය මා චාරිකාවේ ගිය අතීතය සිහිපත් කරනවා."

ඉන්පසු උන්වහන්සේ කළ ධර්ම දේශනාවේ මෙම වැකියත් අන්තර්ගත විය.

''දැනගත හැකි සියල්ල අයත් වන්නේ ලෝකයටයි. දැනගත හැකි යමක් ඇත්තේ නැති එය ධර්මයයි. ලෝකයේ සෑම දෙයක්ම යුගල වලින් යුක්තයි. නමුත් ධර්මය කියන්නේ එකම එක දෙයක් පමණයි.''

74. ඇසිය යුතු (නැති) ප්‍රශ්නයක්

පුහුණුව පිළිබඳ උනන්දුවක් දක්වන ගිහි හෝ පැවිදි බොහෝ දෙනා උනන්දු වන්නේ තමාගේ පුහුණුව පිළිබඳව පමණක් නොවේ. උපදෙස් දීමට දක්ෂ ගුරුවරුන් සොයා ගැනීමටද උනන්දු වෙති. වරක් මධ්‍යම තායිලන්තයේ භාවනායෝගී භික්ෂු පිරිසක් පැමිණ දින ගණනාවක් නැවතී සිටියේ අතුලෝ හිමියන්ගේ ධර්ම දේශනා සහ භාවනා උපදෙස් වලට සවන් දීමටය. ඉන් එක් භික්ෂුන් වහන්සේ නමක් අතුලෝ හිමියන්ට තම හැඟීම ප්‍රකාශ කළ සිටියහ. ''මම නොයෙක් ගුරුවරු සොයා ගොස් තිබෙනවා. ඒ සැම කෙනෙක්ම හොඳින් ඉගැන්වුවත් ඒ අය සාමාන්‍යයෙන් උගන්වන්නේ එක්කෝ විනය ගැන විතරයි. එහෙමත් නැත්නම් චාරිකාවේ යෑමත් ධූතාංග පුහුණුවත් ගැන, නැත්නම් සමාධිය වැඩීමෙන් ලැබෙන ප්‍රීතිය හා සිතේ තැන්පත් කම ගැන, නමුත් ඔබ වහන්සේ ඉහළටම යන සෘජු මාර්ගය උගන්වනවාඃ අනාත්මය, සුඤ්ඤතාව හා නිවන. මට සමාවෙන්න මෙහෙම කෙළින් අහනවට ඔබ වහන්සේ නිවන ගැන උගන්වන්නේ එය සාක්ෂාත් කරලද?''

අතුලෝ හිමි මෙසේ පිළිතුරු දුන්හ.

"සාක්ෂාත් කරන දෙයක් ඇත්තේ නැහැ. සාක්ෂාත් නොකරන දෙයකුත් නැහැ."

75. පුහුණුවේ ප්‍රයෝජනය

අතුලෝ හිමියන්ගේ සමීප ඥාතියෙක් වූ අජාන් බේට් වාසය කළේ කෝක්මෝන් ආරාමයේය. වයස්ගතව මහණ වුවද භාවනා පුහුණුවේදී හා ධුතාංග පුහුණුවේදී උන්වහන්සේ ඉතා දැඩි වූහ. එම පුහුණුවෙන් හොඳ ප්‍රතිඵල ලැබී ඇතැයි අතුලෝ හිමි උන්වහන්සේට ප්‍රශංසා කළහ. අජාන් බේට් රෝගාතුරව මරණාසන්න වූ විට, මරණයට පෙර අවසන් වරට අතුලෝ හිමියන් දැකබලා සමුගැනීමට අවශ්‍ය බව ප්‍රකාශ කළහ. මෙය මා අතුලෝ හිමියන්ට දැනුම් දුන් පසු අජාන් බේට් බැලීමට වැඩියහ. එහි සපැමිණි විට අජාන් බේට් නැගිට අතුලෝ හිමියන්ට වැඳ නමස්කාර කොට නැවත පැදුරේ වැතිරුනේ වචනයක්වත් කතා නොකරය. නමුත් ඔහුගේ මඳ සිනාවත් සතුටු මුහුණත් පැහැදිලිව ම පෙනුනි.

අතුලෝ හිමියන් මෘදු පැහැදිලි හඬකින් මෙසේ පැවසුහ.

"ඔබ පුහුණු වීමට වෑයම් කළ සෑම පුහුණුවක්ම විශේෂයෙන් යොදා ගත යුත්තේ මේ අවස්ථාවේදී. මිය යන්න වේලාව ආවහම සිත එක් තැන් කරගෙන කිසිම අරමුණක් ගන්නේ නැතිව සියල්ල අත හරින්න."

76. නොපෙනෙන අනාගතයට පැතුම්

ගිහි පින්වතුන් අතුලෝ හිමියන් හමුවීමට පැමිණි විට සාමාන්‍යයෙන් උන්වහන්සේ ඔවුන්ගෙන් පුහුණුව පිළිබඳව ගැඹුරු දේවල් නොවිමසති. උන්වහන්සේ සාමාන්‍යයෙන් අසන්නේ ''ඔබ භාවනා කරලා තියෙනවාද?" කියයි. සමහරු ''ඔව්'' යැයි පවසන අතර අනෙක් අය ''නැත'' යයි පවසති.

මේ දෙවැනි කණ්ඩායමට අයත් එක් කාන්තාවක් අනෙක් අයට වඩා විවෘතව කතා කළාය. ''මට නම් පෙනෙන විදියට භාවනා කරන්න තරම් අපි කරදර වෙන්න හේතුවක් නැහැ. මම සෑම වසරකම විවිධ පන්සල් වලදී වෙස්සන්තර ජාතකය අඩුම ගානේ 13 වතාවක්වත් අසනවා. ඒ පන්සල්වල හාමුදුරුවරු කියනවා වෙස්සන්තර ජාතකය ඇහුවම මම සහතික ලෙසම මෛත්‍රී බුදු හාමුදුරුවන්ගේ කාලයේ ඉපදිලා කරදර මොකුත් නැතිව සැප පහසුව පමණක් අත් විඳිනවා කියලා. ඉතින් භාවනා කර කර මා මටම කරදර කරගන්නේ මොකටද?''

අතුලෝ හිමි මෙසේ පැවසූහ.

"විශිෂ්ට දේවල් ඔබේ ඇස් පනාපිටම තියෙනවා. ඒත් ඔබ ඒවා ගැන උනන්දුවක් දක්වන්නේ නෑ. ඒ වෙනුවට නොපෙනෙන ඈත අනාගතයේ, නිකන් කතාවක් විතරක් වෙච්ච දෙයක් ගැන බලාපොරොත්තු තබනවා. මේක වැඩකට නැති (අදක්ෂ) මිනිසෙකුගේ ලක්ෂණයක්. ගෞතම බුද්ධ ශාසනයේ මාර්ගඵල නිවන් අප ලඟ සර්ව සම්පූර්ණව තවම තියෙද්දිත් ඔබ ප්‍රමාදයට පත්වෙවී ඒ ගැන උනන්දුවක් දක්වන්නේ නැතිව ඉන්නවා. මෛත්‍රී බුද්ධ ශාසනය පැමිණි දවසට ඔබ ඔයිටත් වඩා ප්‍රමාදයට පත්වේවි."[1]

---

[1] මෙය ලංකාවේ මෛත්‍රී බුදුන් දක නිවන් දකින්න සිතන අයටත් බුදු වෙන්න හීන දකින අයටත් වැදගත් උපදෙසකි.

77. පරෙස්සම් සතුට

තමන් යටතේ පුහුණුව සඳහා පැමිණි පිරිස් පුහුණුවට තවම කැපවීමක් නොමැතිව ලෞකික රසවින්දනයන් හා සතුටුවීම් වල යෙදෙමින්, ධර්ම පුහුණුව සඳහා ඒවා අත හැරීමට සූදානමක් නොමැතිව සිටින බව දුටු විට අතුලෝ හිමියෝ ඇත්ත ඇති සැටියෙන් පැහැදිලිව දැක ගැනීම පිණිසත් යමක් සිතීම පිණිසත් ඔවුනට අවවාද කරති.

"මම ඔබලාගෙන් ඉල්ලා සිටිනවා 'සතුට' පරීක්ෂා කර බලන්න කියලා. ඔබේ ජීවිතයේ ඔබ වැඩියෙන්ම සතුටු වූ මොහොත හරියට කොතැනද කියලා බලන්න කියලා. ඔබ ඇත්තටම ඒ අවස්ථාව දිහා බැලුවොත් තේරෙයි එය එපමණයි කියලා. ඔබ ඇත්දැක තිබෙන අනෙක් සෑම දෙයකටම වැඩි දෙයක් එතැන නෑ කියලා. ඇයි එතැන ඊට වැඩි දෙයක් නොවුනේ? හේතුව ලෝකයේ ඊට වැඩි දෙයක් නැති නිසා. ලෝකයාට දෙන්න තියෙන්නේ ඔච්චරයි. ආයෙ ආයෙ කරත් ඔයිට වැඩි දෙයක් ඇත්තේ නැහැ. නමුත් ඊට වඩා සුවිශේෂී, ඊට වඩා ශ්‍රේෂ්ඨ, ඊට වඩා පරෙස්සම් සතුටක් තියෙන්න ඕනි. මේ නිසා තමයි ආර්යයන් වහන්සේලා සීමිත සතුටක් කැප කරන්නේ කය නැවැත්වීමෙන් සිත නැවැත්වීමෙන් කෙලෙස් නැවැත්වීමෙන් ලබන සතුටක් සෙවීමට. කිසිවකට සම කළ නොහැකි පරෙස්සම් සතුට එයයි."

78. ගැටෙන්න එපා

අතුලෝ හිමියන් වස් 50ක් එක දිගට ගත කළ බුරපා ආරාමය පිහිටා ඇත්තේ සූරින් නගර මධ්‍යයේ පලාත් කාර්යාල වලට ඉදිරි පස හා පලාත් අධිරකණයේ අල්ලපු වැටේය. මේ නිසා වාහන ශබ්දය නිරතුරුවම ආරාමයේ සාමයට හා නිශ්ශබ්දතාවයට බාධා කරයි. විශේෂයෙන් වාර්ෂික අලි උත්සවයේදීත් වෙනත් නිවාඩු දින වලත් දින හත හෝ දින 15 දක්වා දිවෙන ඝෝෂා හා දීප්තිමත් එළි පවතී. ස්ථාවර භාවයට නොපැමිණි සිත් ඇති භික්ෂූන් හා සාමණේරවරු මෙයින් බොහෝ හිරිහැරයට පත් වෙති. ඔවුන් මේ ප්‍රශ්ණය අතුලෝ හිමියන් වෙත ගෙන ආවිට ලැබෙන්නේ එකම පිළිතුරකිඃ

"ඇයි ඔය දේවල් ගැන උනන්දු වෙවී කාලය නාස්ති කර ගන්නේ? ආලෝකයේ ස්වභාවය දීප්තිමත් වෙන එක, ශබ්දයේ ස්වභාවය ඝෝෂාකාරී වන එක. ඒක තමයි ඒවායේ කටයුත්ත. ඔබ අසන්න සිත් යොමු කළේ නැත්නම් ප්‍රශ්ණය එතනින් ඉවරයි. තමාගේ වටපිටාවත් සමඟ ගැටෙන්නේ නැතිව කටයුතු කරන්න. මොකද, ඒවායේ ස්වභාවය ඒ විදියම තමයි. ගැඹුරු ප්‍රඥාව භාවිතා කරලා ඒවා ගැන සැබෑ අවබෝධයක් ලබා ගන්න. එතකොට හරි."

79. විමතිය උපදවන කතාවක්

මාගේ එක් දුර්වලතාවයක් වූයේ අතුලෝ හිමියන් සමඟ මඳ කවට කමෙන් යුක්තව කතා කිරීමට කැමති වීමයි. මීට හේතුව වූයේ උන්වහන්සේ කිසි විටෙක අමනාප නොවීමත්, උන්වහන්සේට සමීපව සිටි භික්ෂූන් හා සාමණේරවරුන්ට හැම විටම මිත්‍රශීලීව උන්වහන්සේ වෙත එළඹිය හැකි වීමත්ය. වරක් මම මෙසේ ඇසුවෙමි. "පොත් වල තිබෙනවා දෙවිවරු බිලියන ගණනින් බුදුරජාණන් වහන්සේගෙන් බණ අසන්න පැමිණියා කියලා. ඒ ඔක්කොටම ඉන්න පුළුවන් තරම් ඉඩක් තියෙන්න පුළුවන්ද? ඒ ඔක්කොටම ඇහෙන්න තරම් බුදුන් වහන්සේගේ කටහඬේ ශබ්දය ප්‍රමාණවත්ද?"

අතුලෝ හිමියන් දුන් පිළිතුර ඇසූ මට මහත් පුදුමයක් ඇති වූයේ එවැනි දෙයක් කිසිම පොතක කියවා හෝ කිසිම කෙනෙකුගෙන් මීට පෙර අසා හෝ නැති බැවිනි. ඒ වගේම උන්වහන්සේ මෙය කියනවා ඇසුණේ දැඩිසේ ගිලන්ව මරණාසන්න කාලයේ දී පමණි.

උන්වහන්සේ පැවැසුවේ:

"දෙවිවරු බිලියන මිලියන ගණනක් රැස්වුනත් ගැටළුවක් වෙන්නේ නැහැ. මොකද පරමාණුවක ඉඩ ප්‍රමාණයක දෙවිවරු අට දෙනෙකුට ඉන්න පුළුවන්."

80. මෙවැනි ප්‍රශ්ණත්

ළමුන් හෝ වැඩිහිටියන් වේවා, නුවණැතියන් හෝ අනුවණයින් වේවා තේරුමක් නොමැතිව විවාද කරන විසඳුමක් නොමැති පැනයක් තිබේ. එනම් 'පළමුව බිහිවුනේ කිකිළියද නැතිනම් බිත්තරයද?' යන්නයි. බොහෝ සෙයින් මේ ගැන විවාද කරන්නේ විහිළුවට වන අතර නිගමනයකට නම් නොපැමිණෙති. මෙවැනි ආකාරයේ ප්‍රශ්ණයකට අතුලෝ හිමියන් පිළිතුරු නොදෙනු ඇතැයි සිතා ඇතැමුන් මේ ප්‍රශ්ණය උන්වහන්සේ වෙත ඉදිරිපත් කරති. මින් පෙර කිසි කෙනෙකු පිළිතුරු නොදුන් ආකාරයෙන් එයට පිළිතුරක් දෙනු වරක් මම ඇසුවෙමි. දිනක් පූජ්‍ය බර්මි හිමි අතුලෝ හිමියන්ගේ පා සම්භාහනය කිරීමට පැමිණ මෙසේ ඇසූහ. "ස්වාමීනි, පළමුව බිහි වූයේ කුමක්ද? කිකිළියද? බිත්තරයද?"

අතුලෝ හිමි මෙසේ පිළිතුරු දුන්හ:

"ඒ දෙකම බිහිවුනේ එකට."

81. බැනුමක්

භාවනා නොකරම, ඉක්මනින්ම ප්‍රතිඵල ලබා ගැනීමට කෙසේ පුහුණු කළ යුතුදැයි විමසන අය ගැන අතුලෝ හිමියන්ට කේන්ති ගියා යැයි පෙනුනු අවස්ථාද තිබුණි.

මෙලෙස ඔවුනට උන්වහන්සේ දොස් නගති.

"අපි පුහුණු වන්නේ සංවරය සඳහා, අතහැරීම සඳහා, ආශාව දුරුකිරීම සඳහා, දුක කෙළවර කිරීම සඳහා. දිව්‍ය විමාන දකින්න නොවෙයි. නිවන දැකීමවත් අපි අපේ අරමුණ කරගන්නේ නෑ. මොනවත් දකින්න දඟලන්නේ නැතිව සංසුන්ව පුහුණුව කරගෙන යන්න. මොකද නිවන කියන්නේ හැඩයක් නැති ශූන්‍ය දෙයක් විතරයි. එයට සම කළ හැකි දෙයක් හෝ එය රැඳෙන පදනමක් හෝ ඇත්තේ නැහැ. ඔබ දිගටම පුහුණුව කරගෙන ගියොත් විතරක් තමුන්ටම එය දැන ගන්න ලැබේවි."

82. එකක් අතහැර වෙන දෙයක් අල්ලා ගැනීම

අතුලෝ හිමියන්ගේ එක් ගිහි ගෝලයෙක් පැමිණියේ අතුලෝ හිමියන්ට ගෞරව දක්වා තම පුහුණුවෙන් ලත් ප්‍රතිඵල ආඩම්බරයෙන් වාර්තා කිරීමටයි: "ඔබ වහන්සේ අද දැකගන්න ලැබිච්ච එක ඇත්තටම සතුටක්, මොකද මම ඔබ වහන්සේ දීපු උපදෙස් වලට අනුව භාවනා කරලා පියවරෙන් පියවර ප්‍රතිඵල ලැබුවා. මම භාවනා කරන කොට බාහිර සංඥා අතහරිනවා. එවිට සිතේ කළබල සන්සිඳෙනවා. සිත එක් තැන් වෙලා නිශ්චල වෙනවා. ඉන්පසු සමාධියට වැටෙනවා. සිතුවිලි සියල්ල අතුරුදහන් වෙලා ප්‍රීතිය පමණක් ඉතිරිවෙනවා. ප්‍රබෝධමත් කරවන සිසිල් අසීමිත ප්‍රීතියක්. මට කැමති තාක්කල් ඒ තත්වයේ ඉන්න පුළුවන්."

අතුලෝ හිමියන් මඳ සිනාවක් පා මෙසේ පැවැසූහ:

"ඔබට ප්‍රතිඵල ලැබුනු එක බොහෝම හොඳයි. සමාධියෙන් ලැබෙන ප්‍රීතිය ගැන කියන්න තියෙන්නේ එය සැබෑම ප්‍රීතියක් කියලා. එයට සම කළ හැකි කිසිවක් නැහැ. නමුත් ඔබ එම තත්වයේ සිරවුනොත් ඊට වැඩිමනත් දෙයක් ලැබෙන්නේ නැහැ. පැවැත්ම, උපත, තණ්හාව හා ඇලීම කපා දමන්න පුළුවන් ආර්ය මාර්ගය පිළිබඳ ප්‍රඥාව එයින් ලැබෙන්නේ නැහැ. ඒ හින්ද ඊළඟ පියවර තමයි ඒ ප්‍රීතියත් අතහැරලා පංචස්කන්ධ හොඳින් දැන ගැනීමට ඒ ගැන භාවනා කරන එක."

83. උපමාවක්

"ලෝකෝත්තර තත්වය ස්පර්ශ කළ ආර්යයන් වහන්සේගේ සිත, ලෝකයේ කුමන වටපිටාවක් යටතේ ජීවත් වුවත් ලෝකීය දේවල් හා මිශ්‍ර වන්නේ හෝ ලෝකයා විසින් කැළඹීමට පත් කිරීමට හැකි වන්නේ හෝ නැත. අෂ්ඨ ලෝක ධර්මයන්ට (ලාභ - අලාභ, නින්දා - ප්‍රශංසා, කීර්ති - අපකීර්ති, සැප - දුක) එය යටපත් කිරීමට හෝ සාමාන්‍ය මිනිසෙකුගේ මානසික මට්ටමට එය පත් කිරීමට හෝ නොහැක. තණ්හාවේ හෝ කෙලෙස් වල බලයට එය කවරදාවත් නතු නොවේ.

එය හරියට පොල් කිරි වගේ. එය පොල් මදයෙන් මිරිකා අරගෙන ඉහල උෂ්ණත්වයට රත් කර තෙල් වෙන් කර ගත්තට පස්සේ ඔබට එය නැවත පොල් කිරි කළ නොහැක. ඔබ එම තෙල් කොපමණ පොල් කිරි සමඟ කලවන් කරත් ඔබට කොහොමටවත් එම තෙල් නැවත පොල් කිරි කරන්න බැහැ."

84. තවත් උපමාවක්

"මාර්ගඵල නිවන් කියන්නේ පුද්ගලික දෙයක්. තමුන් විසින්මයි එය දැන ගත හැක්කේ. ඒ මට්ටම දක්වා පුහුණුවේ යෙදුනු අය ඒවා දැන ගනීවි. තමුන්ටම ඒවා පැහැදිලි වී බුදු දහම කෙරෙහි තමුන්ගේ සියළු සැක සම්පූර්ණයෙන්ම අවසන් වී යාවී. ඔබ ඒ මට්ටමට පැමිණ නැතිනම් ඔබට කරන්න පුළුවන් වන්නේ අනුමාන කරන එක විතරයි. වෙන කෙනෙක් කොච්චර ව්‍යක්ත ලෙස ඒවා ඔබට විස්තර කරත් ඔබේ දැනුම අනුමානයක් විතරයි. ඕනෑම අනුමානයක් කියන්නේ අවිනිශ්චිත දෙයක්.

එය හරියට ඉබ්බයි මාළුවයි වගේ. ඉබ්බා ලෝක දෙකක ජීවත් වෙනවා. ගොඩබිම ලෝකයයි ජලජ ලෝකයයි. මාළුවා ජීවත් වන්නේ ජලජ ලෝකයේ විතරයි. ඌ ගොඩබිමට දැම්මොත් මැරෙනවා. දවසක් ඉබ්බා වතුරට බැහැපු දවසක ඌ මාළු රංචුවකට කිව්වා ගොඩබිම කොච්චර විනෝදජනකද කියලා. එහි තියෙන පාට, අලෝකය හා වතුරේ සිටීම නිසා වන කිසිදු අපහසුවක් එහි නැති බව ඌ විස්තර කළා. කුතුහලයට පත් වෙච්ච මාළුවන්ට ගොඩබිම මොන වගේද කියලා දැන ගන්න ඕන වුනා. ඉතින් උන් ඉබ්බගෙන් ඇහුවා "ගොඩබිම ගොඩක් ගැඹුරුද?" කියලා.

ඉබ්බා උත්තර දුන්නාඃ "ගොඩබිම කොහොමද ගැඹුරු වෙන්නේ. ඒ ගොඩබිමනේ."

මාළුඃ "ගොඩබිම ගොඩක් රළ ගහනවද?"

ඉබ්බාඃ "එහෙ කොහොමද රළ ගහන්නේ? ඒ ගොඩබිමනේ."

මාළුඃ "එහෙ බොර වෙලාද තියෙන්නේ?"

ඉබ්බාඃ "එහෙ කොහොමද බොර වෙන්නේ? ඒ ගොඩබිමනේ."

බලන්න මාළු අහපු ප්‍රශ්ණ දිහා. ඔවුන් ප්‍රශ්ණ අහන්නේ ඔවුන්ට ජලය ගැන තිබ්බ අත්දැකීම් වලින්. ඉබ්බට කරන්න පුළුවන් 'නෑ' කියන එක විතරයි.

"සාමාන්‍ය මිනිසෙකුගේ සිතක් මාර්ග-ඵල-නිවන් ගැන කරන අනුමානයත් මාළුන්ගේ අනුමානයට වඩා වෙනස් නැහැ."

85. අදාල දේ හා අදාල නැති දේ

1981 අප්‍රේල් 2 දින හවස මාලිගයේ පැවැත්වුනු උත්සවයකින් පසු අතුලෝ හිමියෝ ආපසු බොවෝන් ආරාමයට වැඩම කොට රාජකීය විහාරයේ විවේක ගනිමින් සිටියහ. ඉහල නිලයක් දරන, භාවනාවත් කරන එක් භික්ෂුවක් උන්වහන්සේ සමඟ ධර්ම සාකච්ඡාවක් කරනු පිණිස එහි වැඩියහ. ඔහුගේ පළමු ප්‍රශ්ණය වූයේ මෙයයි: "සමහරු කියනවා කලින් ආත්මයේ යක්ෂයකු වී සිටි කෙනෙකුට මනුෂ්‍ය ආත්මයක් ලැබුණු පසු හොඳින් මන්තර උගත හැකි බවත් ඒවා ඉතා බලසම්පන්න ලෙස භාවිතා කරන්න පුළුවන් බවත්. මේ කතාව ඇත්තද?"

කෙලින් හිඳගත් අතුලෝ හිමි මෙලෙස පිළිතුරු දුන්හ:

"මම ඔය වගේ දේවල් ගැන කොහොමටවත් උනන්දු වී නැහැ. නමුත් ඔබ කවමදාවත් මේ කරුණු ගැන සිතලා තියෙනවද? 'හසිතුප්පාද' - ඒ කියන්නේ සිනාසීමට කිසිදු අරමුණක් නොමැතිව සිත තනිව සිනාසෙන, සිතේ ඇතිවන චලනයක්. එය සිදුවන්නේ ආර්යයන් වහන්සේ කෙනෙකුගේ සිතේ විතරයි. එය සාමාන්‍ය කෙනෙකුගේ සිතේ සිදුවන්නේ නැහැ. මොකද එය තිබෙන්නේ සංස්කාර හේතුවලට එහායින්. සම්පූර්ණයෙන්ම ස්වාධීන දෙයක්."

86. පන්සිල් පද පහවත් නැහැ

ශ්‍රේෂ්ඨ වැඩිහිටි භික්ෂූන් වහන්සේලාට සාමාන්‍යයෙන් බොහෝ ගිහි හා පැවිදි ශිෂ්‍ය පිරිසක් සිටිති. මේ පිරිසේ හොඳ හා නරක දෙවර්ගයම සිටිති. විශේෂයෙන් භික්ෂූන් අතර හොඳ බොහෝ දෙනෙක් හා ඒ අතර මිශ්‍ර වූ නරක කිහිප දෙනෙකුත් සිටිති. අතුලෝ හිමියන්ට සමීපව සිටි භික්ෂූන් අතර සිටි එක් භික්ෂුවක් උවමනාවට වාඩා නිදැල්ලේ නොදුන් දේ ගැනීමට හුරු වී සිටියේය. මේ ගැන අන් අය පැමිණිලි කළද අතුලෝ හිමියන් ඒ ගැන යමක් නොකියා සිටීමටද හුරු වූහ.

වරක් උන්වහන්සේට මේ භික්ෂුව එලෙස ගත් දෙයක් නැවත අවශ්‍ය විය. උන්වහන්සේ වෙනත් භික්ෂූන් වහන්සේ නමකට පෙර කී භික්ෂුවගෙන් එය ඉල්ලා ගෙන පැමිණෙන ලෙස දැන්වූහ. නමුත් පළමු භික්ෂුව එය තමා නොගත් බව ප්‍රකාශ කෙළෙන් දෙවැනි භික්ෂුව අතුලෝ හිමියන් වෙත පැමිණ ඒ බව දැනුම් දුන්හ. උන්වහන්සේ ඒ ගැන දොස් නොපැවැරුවත් මෙසේ කීහ.

"සමහර හාමුදුරුවරු ශික්ෂාපද 227 රකින්න කොච්චර උනන්දු වෙනවද කියනවානම් ඒ අයට පංචශීලයත් අමතක වෙනවා."

87. නොසැලෙන ගුණය

ඒ වන විට රෑ 10ත් පසු වී තිබුණි. අතුලෝ හිමියන් හිඳගෙන විවේක ගන්නා බව දුටු බැවින් උන්වහන්සේ වෙත ගොස් කාරණය දැනුම් දුන්නෙමි: "ස්වාමීනි, අජාන් කාඕ අපවත් වෙලා." කීයටද? කොහොමද? කියා නොඅසා උන්වහන්සේ මෙසේ පැවැසූහ.

"ආහ් ඔව්, එහෙනම් අජාන් කාඕ අන්තිමට තමුන්ගේ සංස්කාර ගොඩ උස්සාගෙන යාමේ කරදරෙන් නිදහස් වුනා. මම අවුරුදු කිහිපයකට කලින් උන්වහන්සේ බලන්න ගියා. මම දැක්කා ඔහුගේ කායික සංස්කාර උන්වහන්සේට දෙන දුක් ගොඩ. උන්වහනසේට හැමතිස්සේම අනිත් අය තමන්ගේ වැඩ ටික කරල දෙනකන් බලන් ඉන්න සිද්ධ වුනා. මට නම් කය සම්බන්ධව කරපු අකුසල කර්ම නැහැ. නමුත් කය සම්බන්ධ අකුසල කර්ම වලින් ආර්යයන් වහන්සේලාට පවා මොන තත්වයට පත් වී සිටියත්, ඒවායින් සම්පූර්ණයෙන් නිදහස් වෙනතුරු, ඒවාත් එක්ක ගණුදෙනු ඉවර වෙනතුරු, ඒවාත් එක්ක අරගල කරන්න සිද්ධ වුනා. සාමාන්‍ය සිතේ ස්වභාවය තමයි මේ වගේ දේවල් සමඟ එකට ජීවත් වෙන එක. නමුත් දියුණු කළ සිතකට මේ දේවල් මතුවුනත්, ඒවා වහාම අතහැර දමා දුකක් නැතිව, ඇලීමක් නැතිව, ඒවා සමඟ කටයුතු කිරීමේ කරදරෙන් නිදහස් වෙලා සිතේ තැන්පත් කම පවත්වා ගන්න පුළුවන්. එච්චරයි."

88. ධර්මය ආරක්ෂාව සපයන අයුරු

සූරින්හී මහා ගින්න මිනිසුන් වෙත බොහෝ දුක් ගෙන ආයේය. විශාල දේපල හානියක් සිදු වූ අතර අහිමි වීම් පිළිබඳ විශාල දුකක්ද ගෙන ආයේය. සමහර මිනිස්සු උමතු වූහ. මිනිස්සු පෝලිමේ පැමිණ අතුලෝ හිමියන් හමු වී අතීතයේ කළ පින්කම් ගැන කියමින් වැලපෙන්නට වූහ: "අපි අපේ ආච්චිලා සීයලාගේ කාලේ ඉඳලමයි පන්සලේ පින්කම් කරන්නේ, ධර්මය පුහුණු කරන්නේ. ඇයි ඒ පින අපට උදව් කළේ නැත්තේ? ඇයි ධර්මය අපව ආරක්ෂා කළේ නැත්තේ? ගින්න අපේ ගෙවල් සම්පූර්ණයෙන් විනාශ කරලා දැම්මා." ධර්මය තමන්ගේ නිවෙස් ගින්නෙන් බේරා ගත්තේ නැතැයි කියා බොහෝ දෙනෙක් ආරාමයේ පින්කම් වලට සම්බන්ධ වීමත් නතර කළහ.

අතුලෝ හිමියන් මෙසේ කීහ.

"ධර්මය මිනිසුන්ට උදව් කරන්නේ කොහොමටවත් ඒ ආකාරයට නොවේ. ගින්න ක්‍රියා කළ යුතු ආකාරයටම ක්‍රියා කළා. මේකේ තේරුම තමයි විනාශය, අහිමි වීම, නැති වී යාම, වෙන් වීම හැමදාමත් මේ ලෝකයේ අපිත් එක්ක හිටිය කියන එක. නමුත් ධර්මය පුහුණු කරන අය, තමන්ගේ හදවතේ ධර්මය රැඳී තිබෙන අය මෙවැනි විපතක් සිදු වූ විට දන්නවා දුකක් ඇති නොවන විදියට හිත සකස් කර ගන්න. ධර්මය උදව් වෙන්නේ ඒ විදියටයි. එහෙම නැතිව එය කෙනෙක් වයසට යෑමෙන්, මරණයෙන්, බඩගින්නෙන් හෝ ගින්නෙන් බේරගන්නේ නැහැ. ඒක සිද්ධ වෙන්නේ ඒ විදිහට නෙවෙයි."

89. සැක දුරු කර ගැනීමේ මඟ

මිනිසුන් අතුලෝ හිමියන්ගෙන් මරණය හා පුනරුත්පත්තිය ගැන හෝ අතීත අනාගත ජීවිත ගැන විමසන විට ඒවාට පිළිතුරු දීමට උන්වහන්සේ කිසිවිටකත් උනන්දු නොවූහ. එලෙසින්ම සමහරු දිව්‍ය ලෝකයක් හෝ අපායක් ඇතැයි තමන් විශ්වාස නොකරන බවට වාද නගන විට ඊට එරෙහිව කරුණු දැක්වීමට හෝ එම වාද පරාජය කිරීමට සාක්ෂි ඉදිරිපත් කිරීමට උත්සහ නොකළහ. ඒ වෙනුවට උන්වහන්සේ මේ අවවාදය කළහ.

"ධර්මය පුහුණු කරන අය අතීත හෝ අනාගත ජීවිත ගැන හෝ දිව්‍යලෝකය අපාය ගැන හෝ හිතන්න අවශ්‍ය නැහැ. ඒ අය කළ යුතු එකම දේ තමයි සීල සමාධි ප්‍රඥා මූලධර්ම වලට අනුකූලව නිවැරදිව දැඩිව අපේක්ෂා සහගතව පුහුණු වෙන එක. පොත්වල තියෙන විදියට දේවලෝක 18ක් තියෙනවා නම් නිවැරදිව පුහුණුවේ යෙදෙන අය අනිවාර්යයෙන්ම ඒ මට්ටම් වලට යාවි. දිව්‍යලෝක හෝ නිවන කියල දේවල් නැත්නම් හොඳින් පුහුණුවන අයට මෙලොවදීම ලැබන ප්‍රතිඵල වලින් අඩුවක් වන්නේ නැහැ. ඔවුන් අනිවාර්යයෙන් උසස් මට්ටමක මිනිසුන් ලෙස සතුටින් ඉඳීවි.

අනිත් අය කියන දේට සවන් දීමෙන් හෝ පොත්වල කරුණු සොයා බැලීමෙන් හෝ ඔබේ සැක දුරු කර ගන්න ලැබෙන්නේ නැහැ. පැහැදිලි විපස්සනා ඥාන ලැබීමට ඔබ පුහුණුව ගැන මහන්සි විය යුතුයි. අන්න එතකොට සැකය සම්පූර්ණයෙන්ම නිකම් ම නැති වෙලා යාවි."

90. දැන ගන්න අවශ්‍ය එපමණද?

අහවල් කෙනාට අතීත ජීවිත බොහෝ ගණනක් සිහි කළ හැකි බවත්, ඔවුන් කවුරුන් වී එකල සිටියේද? එකල ඔවුන්ගේ මව හා ඥාතීන් කවුරුන් දැයි ඔවුන් දකින බවත් පවසමින් ඔවුන්ගේ පුනරුත්පත්තිය පිළිබඳ අතුලෝ හිමියන්ගේ අදහස විමසීමට කණ්ඩායම් වශයෙන් පිරිස් පැමිණියත් අතුලෝ හිමියන් ඔවුනට පවසන්නේ මෙබන්දකි.

"මම මේ වගේ ඥාන ගැන කවදාවත් උනන්දු වුනේ නැහැ. උපචාර සමාධියෙන් වුනත් ඒ ඥාන ලබාගන්න පුළුවන්. හැම දෙයක්ම එන්නේ සිතෙන්. ඔබට දැන ගන්න දැක ගන්න අවශ්‍ය ඕනෑම දෙයක් ගැන ඥාන දර්ශනය හිතට පුළුවන් බොහෝම ඉක්මනින් ඔබට ලබා දෙන්න. ඔබ මෙපමණ ඥානයකින් තෘප්තිමත් වෙනවනම් ඉන් ලැබෙන හොඳ ප්‍රතිඵලය තමයි ඔබ අපාය වල උපදින්න බිය වීම. එයින් ඔබ හොඳ දේවල් කරන්න පෙළඹේවි. දන් දේවි, සිල් රකීවි. එකිනෙකාට හිංසා කරගන්න එකක් නැහැ. ඔබේ පුණ්‍යකර්ම වල ප්‍රතිලාභ ගැන විශ්වාසයෙන් ඔබට සිනා සීමට හැකි වේවි. නමුත් සම්පූර්ණයෙන් දුකෙන් අත්මිදීම සඳහා කෙලෙස් දුරලන එක, අවිද්‍යාව තණ්හාව ඇලීම විනාශ කරන එක ඊට සම්පූර්ණයෙන්ම වෙනස් වූ දෙයක්."

91. විහිළු කතා නැහැ

මා අතුලෝ හිමියන් සමීපයේ ගත කළ එම දිගු කාලය තුල උන්වහන්සේ සිදුකළ ධර්ම දේශනා තුල කිසිම විටෙක ජන කතා හෝ විහිළු කතා තිබුනේ නැත. ජාතක කතා හෝ වර්තමානයේ සමාජ කතා හෝ තිබුනේ නැත. උන්වහන්සේගේ ඉගැන්වීම් තුල තිබුණේ අපෞද්ගලික, පරමාර්ථය පිළිබඳව, සරල හා පිරිසිදු ආර්ය සත්‍යය පමණි. නැතිනම් වචන පාවිච්චියේ දී ඉතා අරපිරිමැස්මෙන් කටයුතු කරන බවක් හඟවන පරෙස්සමෙන් තෝරගත් මත පලකිරීමක් පමණි. ආගමික උත්සවයක් ගැන හෝ පරිත්‍යාග පිරිනමන ආකාරය ගැන හෝ මූලික සීලය ගැන හෝ උන්වහන්සේ ඉගැන්වූයේ ඉතාම විසංයුක්ත ආකාරයකිනි. බොහෝ විට උන්වහන්සේ පවසන්නේ:

"උත්සව හා පින්කම් කුසල් ක්‍රියා විදියට සළකන්න පුළුවන්. නමුත් භාවනායෝගියෙකුගේ දෘෂ්ඨී කෝණයෙන් ඒවායින් ලැබෙන්නේ කුඩා කුසලයක් විතරයි. එච්චරයි."

92. අහඹු හමුවක්

අජාන් මන් කෞතුකාගාරය විවෘත කිරීමේ උත්සව වලින් පසු අතුලෝ හිමි තවත් මඟ ගෙවා ගොස් බාම් ගුහාවේ වැඩ සිටි අජාන් ෆන් හමුවීමට වැඩියහ. ඒ දිනවල විශාල වාහන වලට යා හැකිව තිබුණේ බාම් ලෙන පිහිටි කන්දේ පාමුලට පමණි. මේ නිසා අතුලෝ හිමියන්ට බොහෝ දුරක් කන්ද නැඟීමට සිදුවිය. මෙය උන්වහන්සේට ඉතා දුෂ්කර කටයුත්තක් වූ අතර අවස්ථා බොහෝ ගණනක් නැවතී මහන්සි හැරීමට සිදුවිය. උන්වහන්සේ එතරම් දුෂ්කර තත්වයකට පත් කිරීමට මගෙන් ලැබුණු දායකත්වය ගැන මට ඇති වූයේ දැඩි සිත් වේදනාවකි. අවසානයේ අපි කන්ද ඉහල පිහිටි හමුවීම් ශාලාවට පැමිණි පසු, අජාන් ෆන් හිමියන් පැමිණ ගෞරව දක්වීමෙන් පසු අජාන් තේට් හිමියන්ද එහි සැපත් වූහ.

විශිෂ්ඨ තෙරුන් වහන්සේලා තෙනමක් අහඹු ලෙස මෙලෙස හමු වී සාමකාමීව සිනාමුසු මුහුණින් මිත්‍රශීලීව කතාබහ කරනු ඇසීමෙන් හා දැකීමෙන් මා තුල වූ වේදනාව වියැකී ගොස් ඒ වෙනුවට දැඩි ප්‍රීතියක් ඇති විය. අජාන් ෆන් හිමියන් මෙලෙස අතුලෝ හිමියන්ට තම ප්‍රසාදය පල කළහ:

"ඔබ වහන්සේ බොහොම නිරෝගියි. මෙච්චර වයසට ගිහිල්ලත් කන්ද උඩටම නගින්න පුළුවන් වුනානේ."

අතුලෝ හිමියන් මෙලෙස උත්තර දුන්හ:

"මම ඇත්තටම එපමණ නිරෝගී නැහැ. මම ඔය කාරණය ගැන හිතලා බැලුවම මම දැක්කා මම කය සම්බන්ධව අකුසල කර්ම කරලා නැති බව. මට මේ කය තවදුරටත් පාවිච්චි කරන්න බැරි වුනාම මම එය අතහැර දමනවා. එච්චරයි."

93. තවත් අමුතු දෙයක්

මෙම ශ්‍රේෂ්ඨ තෙරුන් වහන්සේලා තෙනමගේ අහඹු හමුව ගැන ඒ අවස්ථාවේ එතැන සිටි විශාල දායක පිරිසට ඇති වූ උද්දාමය කොතෙක්දැයි ඔබට සිතාගත හැකිවනු ඇතැයි සිතමි. මෙවැනි අවස්ථා ඉතා දුර්ලභය. මේ නිසා සූරින් වල සිට පැමිණි ඡායාරූප ශිල්පීන් දෙදෙනා ඔවුන්ට හැකි පමණ ඡායාරූප ඒ අවස්ථාවේ දී ගැනීමට උත්සුක වූහ.

ආපසු පැමිණීම සඳහා බස් රථයට ගොඩ වූ පසු ඡායාරූප සඳහා වූ ඉල්ලුම තේරුම් ගත් ඡායාරූප ශිල්පීන් දෙදෙනා ප්‍රකාශ කළේ එම ඡායාරූප අඟල් 12 දක්වා විශාලනය කොට විකුණන බවත්, ලැබෙන ආදායම ජොව්ම් ප්‍රා ආරණ්‍ය සේනාසනයේ දියුණුවට යොදවන බවත්ය. එම අජාන්වරු සිටින ඡායාරූප විකිණීම පිණිස මිලක් නියම කිරීම එතරම් හොඳ දෙයකැයි මට සිතුනේ නැත. නමුත් බස් රථයේ සිටි සෑම කෙනෙක්ම පාහේ ඒවා සඳහා ඇණවුම් කළහ. එම ඡායාරූප ශිල්පීන් එම ඡායාරූප ශුද්ධ කළ විට දක්නට ලැබුනේ, ඔවුන් විසින් ලබාගත් විස්සකට අධික වූ සියළුම ඡායාරූප පිටපත් හිස් බවයි. ඒවා වලාකුළු නොමැති අහස මෙන් විය. ඡායාරූප සඳහා වූ සෑමදෙනාගේම බලාපොරොත්තු එයින් අවසන් වූ අතර එම ශ්‍රේෂ්ඨ තෙරුන් වහන්සේලා තෙනමගේ අවසන් හමුවීමත් එය විය.

94. උන්වහන්සේ දුටු ඇත්ත

මිනිසුන් අතුලෝ හිමියන්ගෙන් අජාන් මන් හිමියන් පිළිබඳව ඇති වර්ථාවලින් කිසිවක් කියවා ඇද්දයි විමසූ විට "ටිකක්" යැයි උන්වහන්සේ පිළිතුරු දෙති. එවිට නිරායාසයෙන් ම අසන ඊළඟ ප්‍රශ්ණය වනුයේ "ඒවායේ විස්තර කරන අභිඥා බල හා ප්‍රාතිහාර්යය සහගත සිදුවීම් ගැන ඔබ වහන්සේ මොනවද සිතන්නේ?" යන්නයි. අතුලෝ හිමියන් මෙලෙස උත්තර දෙති.

"මම අජාන් මන් හිමියන් සමඟ ජීවත් වන කාලයේ උන්වහන්සේ එහෙම දේවල් ගැන කියනවා මම කවදාවත් අහලා තිබුනේ නැහැ."

සාමාන්‍යයෙන් අතුලෝ හිමි අජාන් මන් හිමියන් ගැන කතා කරන විට කතාකරන්නේ උන්වහන්සේගේ ධූතාංග ගුණ ගැන පමණි.

"පසු පරම්පරාවේ භික්ෂූන් අතර අජාන් මන් තරම් දැඩිව මේවා පුරුදු කරන කිසිම කෙනෙක් මම දැකලා නැහැ. උන්වහන්සේ පෙරෙව්වේ විසි කරපු රෙදි කෑලි වලින් තමන් ම මහලා තමන් ම පඬු පොවපු සිවුරු විතරයි. වෙන කාගෙන්වත් ලැබුණු මහපු සිවුරු උන්වහන්සේ කවදාවත් පාවිච්චි කළේ නැහැ. මුළු ජීවිත කාලය ම ගත කළේ කැලේ කුටි වල. ඔහු වැළඳුවේ පිණ්ඩපාතයේ ගිහින් ලැබිච්ච දානය විතරයි. ඒකත් වැළඳුවේ පාත්තරෙන් විතරයි. දැඩිව ගිලන් වෙච්ච අවස්ථා වලත් ඇඳේ ඉඳගෙන පාත්තරේ ඔඩොක්කුවේ තියාගෙන අල්ලගෙන ඉන්නවා අනිත් අයට එයට ආහාර දමන්න. වස් කාලයක් ගත කළ පසු ලැබෙන කිසිම විශේෂ දෙයක් උන්වහන්සේ පිළිගත්තේ නැහැ. කඨිනය පිළිගත්තෙත් නැහැ. කවදාවත් ගොඩනැගිලි ඉදිකළේ නැහැ. කාටවත් ඉදිකරන්න කියල කිව්වෙත් නැහැ."

95. ප්‍රශ්ණ වලට ප්‍රශ්ණවලින් පිළිතුරු දීම

මා අතුලෝ හිමියන් සමග දිගු කාලීන සමීප ඇසුරක් පැවැත් වූ නිසා මා උන්වහන්සේගෙන් ප්‍රශ්ණයක් ඇසූ විට ප්‍රශ්ණයකින්ම පිළිතුරු දීමේ නැඹුරුවක් විය. මා ලවාම පිළිතුර සොයා ගැනීමට පෙළඹවීම එහි අරමුණ විය.

නිදසුනක් ලෙස මා මෙලෙස ඇසූවිට:

"රහතන් වහන්සේලාගේ සිත් පිවිතුරුයි ප්‍රභාෂ්වරයි. ඊළඟ ලොතරැයි අංක ගැන නිවැරදිව අනාවැකි කියන්න උන්වහන්සේලාට පුළුවන්ද?"

උන්වහන්සේගේ පිළිතුර:

"රහතන් වහන්සේලා ඒ වගේ දේවල් ගැන දැනගන්න උනන්දු වෙයිද?"

මෙලෙස ඇසූ විට:

"සාමාන්‍ය මිනිසුන් වාගේ රහතන් වහන්සේලාත් හීන දකිනවාද?"

උන්වහන්සේගේ පිළිතුර:

"සිහින කියන්නේ සංස්කාර ස්කන්ධයාගේ කටයුත්තක් නෙවෙයිද?"

මා මෙලෙස ඇසූ විට:

"තමන් කෙලෙස් හරිත වෙලා සිටිද්දී අනෙක් මිනිසුන්ට අර්හත්වයට පත් වෙන්නට උගන්වන්න පුළුවන් කම තිබිච්ච සාමාන්‍ය මිනිසුන් ඉඳලා තියෙනවාද?"

උන්වහන්සේ මෙලෙස පිළිතුරු දුන්හ:

"තමන් අසනීප වෙලා සිටිද්දී අනෙක් මිනිසුන් ඒ අයගේ ලෙඩ වලින් සුවපත් කරන්න පුළුවන් වෙච්ච දොස්තරලා ගොඩක් ඉඳලා නැතිද?"

96. අතුලෝ හිමියන්ගේ ස්වභාවය

කය: උන්වහන්සේ කායිකව නිරෝගීය, ක්‍රියාශීලිය. අඟ පසඟ නියමිත අනුපාත වලින් පිහිටා ඇත. පිරිසිදු ගන්ධයෙන් යුක්තය. අසනීප අඩුය. දවසකට වරක් උනුවතුරෙන් පැන් පහසු කිරීමට ප්‍රිය කළහ.

වචනය: උන්වහන්සේට ගැඹුරු කටහඬක් තිබූ නමුත් මෘදුව කතා කළහ. ස්වල්ප ලෙස කතා කළ උන්වහන්සේ, සත්‍යයවාදීව කෙළින් කතා කළ අතර කපටි වචන තිබුනේ නැත. කවදාවත් ඉගි කරමින් කතා කළේ නැත. රැවටිලි වචන/මුරුංගා අත්තේ තැබීම් නැත. උපහාසයෙන් කතා කළේ නැත. ඕපදූප කතා, ඉල්ලීම්, සමාව ගැනිලි තිබුණේ නැත. තමන්ගේ සිහින ගැන කතා කළේ නැත. ජාතක කතා, අද්භූත කතා කීවේ නැත.

මනස: උන්වහන්සේ ගැන සත්‍යයක් තිබුණි. යමක් කිරීමට සිතට ගත් විට එය සාර්ථක වනතුරු නතර වූයේ නැත. උන්වහන්සේ සැමවිටම කාරුණික, අනුකම්පා සහගත, නිශ්ශබ්ද, සන්සුන්, ඉවසන සුළු කෙනෙකු විය. කිසිවිටෙක තරහින් පිපුරුනේ නැත. නොඉවසිලිමත් බව හෝ අපේක්ෂාභංගත්වය පිළිබඳ ලකුණක් පෙන්වූයේ නැත. නැති වූ දෙයක් ගැන දුක් වූයේ නැත. කිසිවිටෙක කලබල වූයේ නැත. සැමවිටම සතිමත්ව අවධානයෙන් යුක්තව සතුටින් සිටියහ. කිසිවිටෙක දුක්වු බවක් දක්නට නොතිබුණි. නොතරම් මානසික මට්ටමකට උන්වහන්සේ කිසිවිටෙක පත්වූයේ නැත.

උන්වහන්සේ අපට හැම විටම ඉගැන්වූයේ:

"සිදුවීම් සිදුවීම් විදියට පැහැදිලිව අවබෝධ කරගන්න උත්සහ ගන්න. ඒ කියන්නේ ඒවා හට ගන්නවා, වෙනස් වෙනවා, ඊලඟට නැති වෙලා යනවා. ඒවා නිසා දුක් වෙන්න හෝ කණගාටු වෙන්න එපා."

97. වේදනාවට යට නොවීම

අතුලෝ හිමියන් චූළලොන්කෝන් රෝහලේ දැඩිව ගිලන්ව සිටියහ. උන්වහන්සේ එහි ගත කළ 17වන දිනයේ රාත්‍රිය වන විට උන්වහන්සේ කොතරම් වෙහෙසට පත් වී සිටියේ ද යත් වෛද්‍යවරුන්ට ඔක්සිජන් ලබා දීමට ද සිදුවිය. එදින රැය මැදියමත් ඉක්මගිය කල්හි එක්තරා ප්‍රසිද්ධ ස්වාමීන් වහන්සේ නමක් විශාල පිරිසක් සමඟ උන්වහන්සේට ගෞරව දැක්වීමට පැමිණියහ. මෙය විශේෂ අවස්ථාවක් වූ බැවින් ඔවුනට අතුලෝ හිමියන්ගේ කාමරයට පිවිසීමට මම ඉඩ ලබා දුනිමි. එම සම්පූර්ණ කාලය තුලම අතුලෝ හිමි දකුණු ඇලයෙන් දෑස් වසා වැඩ සිටියහ. එම භික්ෂූන් වහන්සේ ඇතුළු පිරිස වැඳ ගෞරව දැක්වීමෙන් පසු ඒ භික්ෂූන් වහන්සේ උන්වහන්සේ වෙත නැමී කනට මෙසේ පැවැසූහ. "ස්වාමීනි, ඔබට තවම දුක් වේදනා දැනෙනවාද?"

අතුලෝ හිමියන් මෙලෙස පැවැසූහඃ

"ස්වභාව ධර්මයට අනුකූලව කය හා විඳීම් තවම පවතිනවා. නමුත් මම ඒ විඳීම් එක්ක කොහොමටවත් සම්බන්ධ වෙන්නේ නැහැ."

98. පරෙස්සම් කෙටි මඟක්

1983 ජනවාරි 20 දින අතුලෝ හිමියන් චූළලොන්කොන් රෝහලින් පිටව යාමට මත්තෙන්, එම රෝහල ඉදිකර මිය පරලොව ගිය පැරණි පරම්පරාවේ අය වෙනුවෙන් සාංඝික දානයක් දී පිං පිරිනැමීමට උන්වහන්සේගේ ශිෂ්‍යයෝ තීරණය කළහ. එම උත්සවය අවසන් වීමෙන් පසු බොහෝ වෛද්‍යවරුන් හා හෙදියන් උන්වහන්සේට ගෞරව දැක්වීමට පැමිණ යළි සුවපත් වීම පිළිබඳව තම සතුට පල කළහ. ඔවුහු මිත්‍රශීලීව මෙසේ පැවැසූහ. "ඔබගේ සෞඛ්‍ය තවම බොහොම හොඳයි. නිරෝගියි. මුහුණත් හරිම එළියයි. ඔබ වහන්සේ අසනීප වී සිටි බවක් වත් පෙනෙන්න නැහැ. සමහර විට ඒ ඔබේ සමාධි බලයෙන් වෙන්න ඇති. අපිට නම් සමාධිය වඩන්න වෙලාවක් ඇත්තේ නැහැ. ඒ සඳහා වඩාත් සරල හා ඉක්මන් ක්‍රමයක් තියෙනවාද?"

අතුලෝ හිමි මෙසේ පැවැසූහ:

"ඔබට කොයි අවස්ථාවක හෝ යම් වෙලාවක් ලැබෙනවා නම් එය ධර්ම පුහුණුව සඳහා යොදවන්න. ක්‍රම වලින් ඉක්මන් ම හා ඍජු ම ක්‍රමය හිත හික්මවන එකයි, හිත පරීක්ෂා කරන එකයි."

99. සියල්ල ක්‍රියාව අනුවයි

මුළු ජීවිත කාලය පුරාවටම අතුලෝ හිමියන් නැකැත් විශ්වාස කළේ නැත. උන්වහන්සේගෙන් 'මහණ වෙන්න සුභ දවසක්' හෝ 'සිවුරු හැරීමට දිනයක්' හෝ 'සුභ හෝ අසුභ දිනයක්' ගැන විමසූ විට උන්වහන්සේ කිසි විටෙක ඒවාට අනුකූලතාවයක් දක්වා කතා කළේ නැත. "හැම දවසක්ම හොඳයි" යැයි ඒවාට පිළිතුරු දෙති. මිනිසුන් 'ශුභ වේලාවක්' විමසූ විට ඔවුන්ටම එය සොයා ගන්නැයි පිටත් කර යවති. නැතිනම් "පහසු ඕනෑම වෙලාවක් ශුභයි" යැයි පිළිතුරු දෙති.

උන්වහන්සේ මෙලෙස කතාව හමාර කරති.

"සියල්ල සිදුවන්නේ අපේ ක්‍රියාවට අනුවයි. හොඳ වෙලාව, නරක වෙලාව, සුභ වෙලාව, අසුභ වෙලාව, පින්-පව් මේ සියල්ල තීරණය වන්නේ මිනිසාගේ ක්‍රියාව අනුවයි."

100. මතු වී පෙනීමට තිබුණු අකැමැත්ත

අතුලෝ හිමි තමා වෙත අවධානය යොමු කර ගැනීමට හෝ කැපී පෙනීමට කිසිවක් නොකළහ. උදාහරණයක් ලෙස මිනිසුන්ට උන්වහන්සේගේ ඡායාරූපයක් ගැනීමට අවශ්‍ය වූයේ නම් එය නියමිත අවස්ථාවේදීම කර ගත යුතු විය. නිදසුනක් ලෙස ප්‍රාතිමෝක්ෂය ඇසීමට හෝ කෙනෙකු මහණ කිරීමට හෝ වෙනත් කොයි යම් උත්සව අවස්ථාවකදී තුන් සිවුර පෙරවූ අවස්ථාවක ඡායාරූපයක් සඳහා පෙනී සිටීමට ඉල්ලූ විට එය පහසුය. නමුත් උන්වහන්සේ සැහැල්ලුවෙන් සිටින අවස්ථාවක ඡායාරූපයක් ගැනීම සඳහා සිවුරු පොරවා ගන්නා ලෙස ඉල්වූයේ නම් ඒ සඳහා කැමතිකරවා ගැනීම ඉතා දුෂ්කර වනු ඇත.

වරක් බැංකොක් නුවර කාන්තාවක් සීත කාලයේ උන්වහන්සේට පෙරවීමට අනර්ඝ පොරෝනයක් ගෙනවිත් පූජා කළාය. මාස කිහිපයකට පසු ගිම්හාන කාලය මැද අතුලෝ හිමියන්ට ගෞරව දක්වීමට ඇය නැවත පැමිණියාය. කලින් අවස්ථාවේ පොරෝනය පූජා කරන අවස්ථාවේදී ඡායාරූපයක් ගැනීමට අමතක වූ බැවින් පොරෝනය රැගෙන විත් එය සමඟ ඡායාරූපයකට පෙනී සිටින ලෙස ඇය උන්වහන්සේගෙන් ඉල්ලා සිටියාය. උන්වහන්සේ "එවැනි දෙයක අවශ්‍යතාවයක් නැතැයි" මෘදුව පවසා එය ප්‍රතික්ෂේප කළහ. දෙවැනි වරටද තෙවැනි වරටද ඇය නැවත නැවතත් ඉල්ලූ නමුත් "අවශ්‍ය නැතැයි" පවසා ප්‍රතික්ෂේප කළහ.

ඇය ගිය පසු මාගේ සිතට අපහසුවක් දැණුනු බැවින් අතුලෝ හිමියන් වෙත ගොස් මෙසේ විමසුවෙමි. "ඇය කොතරම් නොසතුටු වූවාදැයි ඔබ වහන්සේට තේරුණේ නැතිද?"

අතුලෝ හිමි මඳ සිනාවක් පා මෙසේ කීහ:

"මට තේරුණා. ඇගේ නොසතුටට හේතුව ඇයට සතුටු කරන්න බැරි සිතක් තියෙන එකයි."

101. උපතේ අවසානය

වරක් වැඩිහිටි භාවනා ගුරුවරයෙක් පැමිණ අතුලෝ හිමියන් සමඟ ගැඹුරු ධර්ම කරුණු සාකච්ඡා කර අවසානයේ මේ ප්‍රශ්ණය ඇසුවේය. "සමහර වැඩිහිටි භාවනායෝගී භික්ෂූන් ඉතා හොඳින් හැසිරෙමින් විශාල ගෞරවයක් උපයා ගන්නවා. ඔවුන් බුදුදහමේ ප්‍රතිශ්ඨාවක් ලබා ඇතැයි අනෙක් භික්ෂූන් පවා පිළිගන්නවා. නමුත් ඊට පස්සේ මොනවහරි සිද්ධියක් වෙලා එක්කෝ සිවුරු හරිනවා, නැත්නම් ඔවුන්ගේ හැසිරීම් රටාව ධර්ම-විනයට විරුද්ධව අයාලේ යන්න පටන් ගන්නවා. ඇත්තටම පුනරුත්පත්තිය සම්පූර්ණයෙන් කපා දමන්න, උපත හා භවය සිඳ දමන්න ධර්මයේ කුමන මට්ටමකට පැමිණිය යුතුද?"

අතුලෝ හිමි මෙලෙස පැවැසූහ:

"විනයට අනුව දැඩිව හික්මිලා ධූතාංග රකින එක අනෙක් අයට බොහොම ආදර්ශයක් වගේම අගය කළ යුතු හැසිරීමක්. නමුත් ඔබ ඔබේ සිත අධිචිත්ත අධිප්‍රඥා මට්ටමට දියුණු කළේ නැත්නම්, එය නිවන් මට්ටමට නොපැමිණි නිසා එය ඕනෑම අවස්ථාවක පිරිහෙන්න පුළුවන්. ඇත්තටම රහතන් වහන්සේලා වැඩිය දැන ගත යුතු නැහැ. ඒ අය කළ යුත්තේ පඤ්ච උපාදානස්කන්ධ පැහැදිලිව දැක ගන්නත්, පටිච්ච සමුප්පාදය විනිවිද දැක ගන්නත් පුළුවන් මට්ටමට සිත දියුණු කරන එක විතරයි. එතකොට තමයි සංස්කාර ගොඩනඟන එක නතර කරන්න, සෙවීම නතර කරන්න, සිතේ ඇතිවන සියළුම සෙලවීම් නතර කරන්න පුළුවන් වෙන්නේ. අන්න එතනදි තමයි සියල්ල නතර වෙන්නේ. ඉතිරි වන්නේ පිවිතුරු පිරිසිදු ප්‍රභාශ්වර විශාල හිස්බවක්, මහා ශූන්‍යතාවයක් විතරයි."

102. උපමාවක්

"තමුන් තුල තිබෙන සැක දුරු කරගන්න, දැනගන්න, දැකගන්න තිබෙන උවමානව හැම දියුණු මිනිසෙකු තුලම තියෙන ලක්ෂණයක්. හැම විද්‍යාවක් ම හැම විෂය පථයක් ම බිහිවෙලා තියෙන්නේ මිනිසුන්ට ප්‍රශ්ණ අසන්නත් දැනගන්නත් ඇති කැමැත්ත නිසයි. ඒ නිසා තමයි ඔවුන් එම විෂය පථයේ අවසන් අරමුණට ලඟාවීමට ඉගෙනීමටත් පුහුණුවීමටත් උත්සහයක් ගන්නේ.

නමුත් බුදු දහමේ දී ඉගෙනීම හා පුහුණුව සමබරව කළ යුතුයි. එලෙසම ධර්මයේ ඉහලම දේ තමන්ටම සාක්ෂාත් කර ගැනීමට ඔබ ගන්න වීර්යය ඉතා දැඩි විය යුතුයි. ඒ ඉහලම දේ සාක්ෂාත් කළ විට තමයි තමුන්ට ම තමන්ගේ සැක දුරු කරගත හැකි වන්නේ.

මෙය හරියට කවමදාවත් බැංකොක් නොගියපු දුර ගම්පලාතක කෙනෙක් වගෙයි. එහෙ තිබෙන දියුණුවට අමතරව බැංකොක් වල 'මැණික් පවුරක්' (මාලිගය වටා ඇති ආරක්ෂක පවුර) හා 'විශාල රන් කන්දක්' (ස්‍රාකෙත් විහාරයේ චෛත්‍යය) ඇතැයි මිනිසුන් ඔහුට කී විට ඔහු බැංකොක් නුවරට යන්න සූදානම් වන්නේ මැණික් පවුරෙන් මැණික් ටිකකුයි රන් කන්දෙන් රන් ටිකකුයි ගේන්න පුළුවන් වෙයි කියලා හිතාගෙන. නමුත් ඔහු අවසානයේ බැංකොක් නුවරට ආ විට කෙනෙක් ඔහුට "අර තියෙන්නේ මැණික් පවුර, අර තියෙන්නේ රන් කන්ද" යැයි පෙන් වූ විට එකෙනෙහි ම ඔහුගේ සියළු ගැටළු හා බලාපොරොත්තු අවසන් වෙනවා."

"මාර්ග-ඵල හා නිවනත් ඒ වගෙයි."

103. පරෙස්සම් විහරණය

1976 දී ඊසාන දිග ප්‍රදේශයේ උතුරු දිගින් භාවනා ගුරුවරු දෙදෙනෙක් අතුලෝ හිමියන්ට ගෞරව දැක්වීමට පැමිණියා මතකයි. පුහුණුව ගැන ඔවුන් අතුලෝ හිමියන් සමඟ කතා කළ ආකාරය සතුටු දනවන හා දිරි ගන්වන සුළු විය. ඔවුන් තමන් දිගු කලක් ඇසුරු කළ හා යටතේ පුහුණු වූ විවිධ ගුරුවරුන්ගේ සීලය හා ලබා සිටි තත්වයන් මෙසේ විස්තර කළහ. "අහවල් තෙරුන් වහන්සේ නිතරම සාමාධි විහරණයෙන් වැඩ සිටියා. මේ අජාන්වරයා බ්‍රහ්ම විහරණෙයෙන් වැඩ සිටියා, උන්වහන්සේට බොහෝ මිනිසුන් ගරු කළේ ඒ නිසයි. අර තෙරුන් වහන්සේ අප්‍රමාණ බ්‍රහ්ම විහරණයෙන් වැඩ සිටියා, උන්වහන්සේට අසීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටියේත් අනතුරු වලින් බේරී සිටියෙත් ඒ නිසයි."

අතුලෝ හිමි මෙසේ කීහ:

"භික්ෂුවක් යම් තත්වයක් ලබා සිටී නම් ඒ තත්වයට එළඹ වාසය කිරීම හොඳයි. මා ගැන කියන්න තියෙන්නේ මා දැන ගැනීමත් සමඟ වාසය කරනවා කියලයි."

104. පරෙස්සම් විහරණය තව දුරටත්...

අතුලෝ හිමියන් දූන ගැනීමත් සමඟ වාසය කරනවා යැයි කී විට ඒ භික්ෂූන් දෙනම මඳ වේලාවක් නිශ්ශබ්දව සිට 'දූනගැනීමත් සමඟ වාසය කිරීම' කෙබඳු දැයි විස්තර කරන මෙන් ඉල්ලා සිටියහ.

අතුලෝ හිමි මෙසේ විස්තර කළහ:

"දූන ගැනීම කියන්නේ හිස්, ප්‍රභාශ්වර, පිවිතුරු, සංස්කාර සිදු කිරීම නතර කළ, සෙවීම නතර කළ, මනසේ සියළු චලන නතර කළ, කිසිවක් නැති, කිසිම දෙයක නොබැඳුනු සිතක සාමාන්‍ය තත්වයයි."

105. දුකෙහි කෙළවර

අතුලෝ හිමි පිවිතුරු සත්‍යය ගැනම කතා කිරීමට ප්‍රිය කළ බැවින් පිරිසිදු වචන ඇත්තෙක් වූහ. උන්වහන්සේ කතා කළේ බුදු දහමේ ඉගැන්වෙන පරමාර්ථ අරමුණ ගැන පමණි. උන්වහන්සේ ගෙනහැර පෑවේ දුක අවසන් කිරීමට යොමුවූ බුද්ධ වචනය පමණි. අතුලෝ හිමියන් නිතරම උධෘත කොට දක් වූ බුද්ධ වචනයෙන් මෙය වැටහෙනු ඇත.

බුදුන් වහන්සේ මෙසේ වදාළහ:

"මහණෙනි, යමක්හි පෘථිවි ධාතුව, ආපෝ තේජෝ වායු ධාතු නැතිද, ආකාසානඤ්චායතන සිත නැද්ද, විඤ්ඤාණඤ්චායතන සිත නැද්ද, ආකිඤ්චඤ්ඤායතන සිත නැද්ද, නේවසඤ්ඤානාසඤ්ඤායතන සිත නැද්ද, මේ ලෝකය නැද්ද, පරලෝකය නැද්ද, සඳ හිරු දෙදෙනා නැද්ද එසේ වූ ඒ ආයතනය (එනම් නිවන) ඇත. මහණෙනි, මම එහි (යමෙකුගේ) ඒමක්, යෑමක්, මරණයක්, ඉපදීමක් (ඇතැයි) නොකියමි. එය කිසිවක නොපිහිටි, පැවැත්මක් නැති, ආධාරකයක් නොමැති දෙයකි. මෙයම දුකෙහි කෙළවරයි."[1]

1. උදාන පාළි 8.1 පඨමනිබ්බානසුත්තං

106. අවසන් වරට රෝගී වීම

අතුලෝ හිමියන් රෝහලින් පිටවී ආවේ 1983 මුල් හරියේදීය. නමුත් ඒ උන්වහන්සේ රෝගී තත්වයෙන් සම්පූර්ණයෙන් සුව වී නොවේ. එයින් අට මසකින් එළඹෙණ ඔහුගේ 96 වන[1] උපන් දිනය වෙනුවෙන් පැවැත්වීමට සැලසුම් කර තිබූ විශේෂ පින්කම තෙක් දිවි රැක ගැනීමට උන්වහන්සේට සීමාන්තික ඉවසා දරා ගැනීමක් කිරීමට සිදුවිය. උත්සව දිනය ලඟා වත්ම රෝගී ලක්‍ෂණ වඩාත් උත්සන්න විය. වරින් වර වැළඳෙන උණ රෝගයත්, දැඩි තෙහෙට්ටුවත්, අපහසු ගතියත් ඒ අතර විය. නැවත චූළලොන්කොන් රෝහල වෙත රැගෙන යන්නදැයි මා විමසූ විට "අවශ්‍ය නැහැ" යැයි උන්වහන්සේ පිළිතුරු දුන්හ. මෙලෙසද කීහ: "මට ඕන වුනත් මාව රැගෙන යන්න එපා කියලා මම නියම කරනවා. මම සුවපත් වෙන්නේ නැහැ."

"කලින් සැරේ ඔබේ රෝගය මීට වඩා දරුණු වුණා. නමුත් හොඳ වුනා. මේ සැරේ එච්චර අමාරු නැහැ. අනිවාර්යයෙන් හොඳ වේවි." යැයි මා කී විට උන්වහන්සේ මෙසේ කීහ.

"ඒ කලින් සැරේ. මේ කලින් සැරේ නොවෙයි."

---

[1] 95 විය යුතුයි. - පරිවර්තක

107. අවසන් වරට පිටතට පැමිණීම

1983 ඔක්තෝම්බර් 29 පස්වරු 1.00 පසු වන විටත් අතුලෝ හිමියන්ගේ තත්වය පැවැති තත්වයට වඩා හොඳ වූයේ නැත. නමුත් මුහුණේ තිබුණේ අමුතුම දීප්තියකි. උත්සවය සඳහා සහභාගී වීමට ඔහුගේ අනුගාමිකයන් වූ ගිහි, ග්‍රාමවාසී භික්ෂු හා ආරණ්‍යවාසී භික්ෂු විශාල පිරිසක් පැමිණියහ.

හවස 3.00ට පමණ විශාල ආරණ්‍ය වාසී භික්ෂු පිරිසක් ගෞරව දක්වීමට පැමිණියෙන් අතුලෝ හිමි හිඳගෙන ඔවුන් සමඟ ධර්ම සාකච්ඡාවක් කළහ. පැහැදිලි හඬකින් කතා කරමින්, ඔවුන්ගේ සියළුම සැක හා ප්‍රශ්ණ විසඳා දෙන කලෙක මෙන් ධර්ම මාර්ගය ගැන සම්පූර්ණ අනුශාසනාවක් උන්වහන්සේ කළහ. උන්වහන්සේ විසින් එතෙක් කල් දෙන ලද සියළුම භාවනා උපදේශ කැටිකොට ප්‍රකාශ කළහ.

රෑ 10.00ට පමණ අතුලෝ හිමියන්ගේ ඉල්ලීමට අනුව අපි රෝද පුටුවකින් උන්වහන්සේව කුටියෙන් එලියට ගෙන ගියෙමු. උන්වහන්සේ සන්සුන්ව ආරාමයේ හාත්පස නැරඹූහ. ඒ උන්වහන්සේ පිටත දේවල් දකින අවසාන අවස්ථාව බව කාටවත් වැටහුනේ නැත.

108. අවසන් වරට ධර්මය ඇසීම

රෑ 10.00ත් පසු වූ කල අතුලෝ හිමි නැවත කාමරයට රැගෙන යන ලෙස අපට කීහ. ලොකු කොට්ටයක සහය ඇතිව උන්වහන්සේ ඇඳෙහි වැතිරුණි. ඉන් පසු කාමරයේ සිටි අටක් නවයක් පමණ වූ භික්ෂූන්ගෙන් උන්වහන්සේට ශ්‍රවණය කිරීම සඳහා ආශිර්වාද ගාථා පංති හත සජ්ඣායනා කරන ලෙස ඉල්ලා සිටියහ. ඉක්බිතිව සති-සම්බොජ්ඣංග සූත්‍රය තුන්වරක්ද, පටිච්චසමුප්පාදය තුන්වරක්ද සජ්ඣායනා කරන ලෙස කීහ. ඉන්පසුව අපට මහා සතිපට්ඨාන සූත්‍රය සජ්ඣායනා කරන ලෙස කී නමුදු කාටවත් එය මතක තිබුණේ නැත. එම නිසා උන්වහන්සේ ''ඔබගේ ගාථා පොත් දිගහැර පොත බලාගෙන කියන්න'' යැයි කීහ. නමුත් ගාථා පොතක්ද එතැන නොවීය. වාසනාවකට අතුලෝ හිමියන්ට උපස්ථාන කළ අජාන් පුන්සක් හිමියන් වෙත රාජකීය සජ්ඣායනා පොතක් තිබිණි. උන්වහන්සේ එම පොත ගෙන සූත්‍රය සොයමින් පිටු එහෙට මෙහෙට පෙරලන්නට වූහ. අවසානයේ අතුලෝ හිමි "කෝ දෙන්න" යැයි පොත ගෙන පොත දෙසවත් නොබලා අදාල තැනට පොත පෙරලා "මෙතැන ඉඳලා කියන්නැ"යි පැවැසූහ. අප සියළු දෙනා ම මවිතයට පත් කරමින් උන්හන්සේ හරියට ම මහා සතිපට්ඨාන සූත්‍රය ඇති 172 වැනි පිටට පොත පෙරලා තිබුණි. ඉතා දිග සූත්‍රයක් වූ එය සජ්ඣායනා කර නිම කිරීමට පැය 2කටත් වඩා වේලාවක් ගිය අතර අතුලෝ හිමි ඒ මුළුල්ලේම නිශ්ශබ්දව ඊට සවන් දුන්හ.

109. අවසන් වදන්

අප සතිපට්ඨාන සූත්‍රය නිමවා සුළු වේලාවකට පසු අතුලෝ හිමි බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණය මුල සිට අගට විස්තර කළහ. උන්වහන්සේ අවසානයට කී ටික මෙහි ඇතුලත් කරමි.

"ධ්‍යාන සමාපත්තියක සිට බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවේ නැහැ. සතර වන ධ්‍යානයෙන් නැඟිට්ටම උන්වහන්සේගේ මනෝ ස්කන්ධයන්[1] කිසිවක් ඉතිරි නොවී එක් වරම නිරුද්ධ වුනා. වෙනත් විදියකින් කියනවා නම් සම්පූර්ණ අවදිමත් සිතකින් උන්වහන්සේ විඳීම් ස්කන්ධයට (වේදනා ස්කන්ධයට) නිරුද්ධ වෙන්න ඉඩ හැරියා. සිතේ මූලික චිත්ත ස්වභාවයෙන්, සම්පූර්ණ සති සම්පජඤ්ඤයෙන් යුක්තව, වෙනත් කිසිම මනෝ භාවයකට සිත අන්ධ කිරීමට හෝ මුලා කිරීමට ඉඩ දෙන්නේ නැතිව. මෙය සිත එයින්ම පමණක් යුක්ත වූ අවස්ථාවක්. ඔබට ඒ තත්වය මහා ශූන්‍යතාවය ලෙස හෝ මූලික ලෝක ධාතුව ලෙස හෝ නිවන ලෙස හෝ වෙනත් කැමති දෙයකින් හඳුන්වන්න පුළුවන්. මං මෙච්චර කල් උත්සහ කළේ ඒ තත්වය ලබා ගන්න තමයි."

මේ අතුලෝ හිමියන්ගේ අවසන් වදන් වැලයි.

---

[1] රූපස්කන්ධය හැර ඉතිරි සතර

110. වන අසිරිය මොහොතකට නගරයේ

මෙයට අවුරුදු 100කට පමණ පෙර සිදු වූ සිදුවීම් කිහිපයක් දෙස බැලීමට අපි අතීතයට යමු. අතුලෝ හිමියන්ගේ හතර දෙනෙකුගෙන් යුත් සාමණේර හා භික්ෂු කණ්ඩායම අජාන් මන් හිමියන්ගේ කණ්ඩායමෙන් වෙන් වී කලසින් පලාතේ තා කන්ථෝ ප්‍රදේශය හරහා චාරිකා කරන්නට වන්හ. ඝන කැලෑ තුලින් ගමන් කිරීමේ දී ඔවුනට සියලුම ආකාරයේ අන්තරායන්ට හා කරදර වලට, සියළු ආකාරයේ වන සතුනට හා විශේෂයෙන් මැලේරියාවට මුහුණ දීමට සිදුවිය. අවසානයේ එක් භික්ෂුවක් මැලේරියාව සමඟ තවදුරටත් සටන් කළ නොහැකිව තම සගයන් ඉදිරිපිටම කණගාටුදායක ලෙස අපවත් වූහ. ඊටත් වඩා කණගාටුදායක සිද්ධිය වූයේ අතුලෝ හිමි පුංචි සාමණේර නමක් සමඟ එම කණ්ඩායමෙන් වෙන් වී කුට් කෝම් ගම අසල වනාන්තරයට ගිය කල්හි මැලේරියාව පැමිණ සාමණේර හිමියන්ගේ ජීවිතය ගෙන ගියේ අතුලෝ හිමි බලා සිටියදීම වීමයි. එම රෝගය සඳහා ඖෂධයක් උන්වහන්සේ වෙන නොවූයෙන් ශෝකයෙන් බලා සිටීම හැර වෙන කළ හැකි දෙයක් උන්වහන්සේට නොවීය.

දැන් අපි 1983 ඔක්තෝම්බර් 30 පෙරවරු 4.00 පසු වී සුළු වේලාවක් වෙත පැමිණෙමු. එකල තිබූ වන අසිරියම මොහොතකට අතුලෝ හිමියන්ගේ කාමරයට ආ සෙයක් වැන්න. උන්වහන්සේ දැඩිව ගිලන් වී සිටියත් ඒ අවට එකම හෙදියක් හෝ සේලයින් බිංදුවක් හෝ නොවීය. උන්වහන්සේ වට කරගෙන සිටියේ උන්වහන්සේගේ පැවිදි ශිෂ්‍යයන් පමණි. එය හරියට සම්පූර්ණයෙන්ම පිවිතුරු නිස්කලංක සන්සුන් නිරුපාදිශේෂ මරණයකින් සිරුර අතහැර දැමීම සඳහා උන්වහන්සේගේ නිදහස රැකදීමට ආරක්ෂක වළල්ලක් දැමුවාක් මෙනි.

111. උචිතම වේලාවකදී

බුදුරජාණන්වහන්සේ සය වසරක් දුෂ්කර ක්‍රියා කොට හිමිදිරියේ අරුණත් සමඟ උදේ 4.00 පසු වී බුද්ධත්වය ලැබූහ. බුදු වී අවුරුදු 45ක් ඉගැන්වූයේ සෑම දිනකම උදේ 4.00 පසු වී මහා කරුණා සමාපත්තියෙන් ලොව දෙස බලා 'කවරෙකුට අද දහම් දෙසන්නෙම්දැ'යි විමසාය. පරිනිර්වාණයට කාලය පැමිණි විටද උන්වහන්සේ ඒ වේලාවම තෝරා ගත්හ.

1888 ඔක්තෝබර් 4 දින සූරින් පලාතේ ප්‍රාසාත් ගමේ හටගත් සංස්කාර පොදිය ක්‍රමයෙන් වැඩුනේ නිවැරදි හා ගරු කටයුතු ආකාරයටය. උන්වහන්සේ කහට පැහැති සිවුර දරමින්, ජීවිතයේ අවසන් දිනය තෙක්ම ඉතා ආදර්ශමත් ආකාරයට පුහුණුවේ යෙදෙමින්, සැබැවින්ම ලොවට 'අනුත්තර පුණ්‍ය ක්ෂෙත්‍රයක්' වෙමින් ජීවත් වූහ. උන්වහන්සේ තමාගේ සැබෑ යහපත වෙනුවෙන් පරිපූර්ණ ආකාරයටත්, අනෙක් අයගේ සැබෑ යහපත වෙනුවෙනුත්, 1983 ඔක්තෝබර් 30 වනදා දක්වා කටයුතු කළහ. මෙසේ දිවි ගෙවූ උන්වහන්සේ උදෑසන 4.13ට තම ශරීරය අතහැරියහ.

ඉතාම අපූරු දෙය නම් අතුලෝ හිමියන්ගේ ශිෂ්‍යයෝ, ගිහි හෝ පැවිදි, ග්‍රාමවාසී හෝ ආරණ්‍ය වාසී - උන්වහන්සේගේ ජීවිතයේ අට වැනි වර්ෂ 12හේ චක්‍රය[1] සම්පූර්ණ වන 96 වැනි වර්ෂයේ[2] ආරම්භය නිමිත්තෙන් කිරීමට නියමිත පින්කම් මාලාව වෙනුවෙන් ඒ වෙනවිටත් රැස් වී සිටියේ මෙම සිදුවීමට පෙර සූදානමින් මෙන් වීමයි.

---

[1] චීන වර්ෂ ක්‍රමයට අනුව තායිලන්තයේද වසර 12හේ චක්‍රයක් ක්‍රියාත්මක වේ.

[2] උපන් දිනය ගැන ඇත්තේ චන්ද්‍ර මාස ක්‍රමයටයි.

112. කය සම්බන්ධ අකුසල් නැහැ

'කය සම්බන්ධ අකුසල් කරලා නැහැ' යැයි අතුලෝ හිමියන් කී කතාවේ අරුත මට වැටහුනේ ඒ අවස්ථාවේදීය. උන්වහන්සේ 96 වැනි වියට එළඹියත් උන්වහන්සේගේ කය ශක්තිමත්ය, කඩිසරය, පිරිසිදුය, සන්සුන්ය. හැමවිටම සිහි බුද්ධියෙන් (සතිසම්පජඤ්ඤ-යෙන්) යුක්ත වූහ. මහලු වියේදී ඇතිවන මතකය දුර්වල වීම් හෝ අමතක වීම් ඇති වූයේම නැත.

මරණයට වේලාව පැමිණි විට කිසිදු වේදනාවක හෝ අපහසුතාවයක සළකුණක් නොපෙන්වා ශාන්තව අපවත් වූහ. තමන්ගේ උපස්ථායකයන්ට කිසිදු කායික හෝ මානසික කරදරයක් කළේ නැත. දොස්තරලා හෝ බෙහෙත් හෝ කාගේවත් කාලය හෝ අපතේ ගියේ නැත.

උදෑසන හිමිදිරියේ නිසල භාවයත් සමඟ, මිනිසුන්ගේ හෝ වාහන වල ශබ්ද වලින් බාධාවක් නැතිව, ගස් වල කොළ පවා නිසලව තිබිය දී, සිසිල් වාතයත් හිම පොද සේ වැටුණු සිහින් වර්ශාවත් අතර පිවිතුරු ආර්ය සංඝ සාමාජිකයෙක් වූ පූජ්‍ය ඩන් අතුලෝ ස්වාමීන් වහන්සේ, උන්වහන්සේගේ සිල් සුවඳ අප සිත් තුල රඳවමින් අසීමිත පාඩුවක්, රික්තයක් සිත් තුල ඇති කොට, උන්වහන්සේගේ දේහය අතහැරියහ.

<u>නිමි.</u>